කාර්යසාධන වාර්තාව - 2014

செயல்திறன் அறிக்கை- 2014

# Performance Report - 2014












## රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය

## பாதுகாப்பு மற்றும் நகர அபிவிருத்தி அமைச்சு

## Ministry of Defence & Urban Development

## ගරු අමාත්‍යතුමාගේ පණිවිඩය



ආරක්ෂක අමාත්‍යවරයා ලෙස ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ 2014 කාර්යසාධන වාර්තාවට සුබපැතුම් එක්කිරීමට හැකිවීම පිළිබඳ සතුටට පත් වෙමි. වර්ෂ 30 කට අධික කාලයක් සාමාජය දුර්වල කළ අවිගත් ත්‍රස්තවාදී කණ්ඩායමකට එරෙහිව පැවති යුද්ධය අවසන් කර නිදහස්ව නැඟී එන රටක් වශයෙන් ත්‍රස්තවාදයට යළි හිස එසවීමට ඇති අවස්ථාවන් නැති කිරීම, ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් වන ප්‍රමුඛතම කාර්යය වේ. 2009 වසරේ දී දමිළ ඊළාම් විමුක්ති කොටි සංවිධානය යුධමය වශයෙන් පරාජයට පත් කළද, පුහුණුව ලත් සටන්කරුවන්ගෙන් සමන්විතව තවදුරටත් ක්‍රියාත්මක වන එහි එතෙර සංවිධාන ජාලය, ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාවට මධ්‍ය හා දීර්ඝ කාලීනව තර්ජනයක් වන හෙයින්, මෙකී තර්ජනයන්ට මුහුණ දීම සඳහා අවශ්‍ය ආරක්ෂක ක්‍රියාදාමයන් සකස් කිරීම වැදගත් වේ.

පශ්චාත් අරගල සංදර්භයෙහි ලා, සංහිඳියාව සාක්ෂාත් කර ගැනීම ද ශ්‍රී ලංකාවට අතිශයින් වැදගත් වේ. ජනවාර්ගික වශයෙන් බෙදීම් මත පදනම් නොවූ ශ්‍රී ලාංකේය අනන්‍යතාවයක් ප්‍රවර්ධනය කිරීමේ ප්‍රවේශයක් ද මෙහි ලා අත්‍යාවශ්‍ය වේ. එම නිසා, ජනවාර්ගික හා ආගමික කණ්ඩායම්වල රැඩිකල්වාදී ක්‍රියාකාරීත්වය වළක්වාලීම සඳහා ද පියවර ගත යුතු වන අතර නැවත පදිංචි කරවීම, ප්‍රතිසන්ධානය, ප්‍රතිසංස්කරණය හා පුනරුත්ථාපනයට අදාළ ක්‍රියාදාමයන් කෙරෙහි පුළුල් ලෙස අවධානය යොමු කර, මෙකී කාර්යයන් මත පදනම් වූ අභ්‍යන්තරික තර්ජනයන් යලි ඉස්මතු වීම වළක්වාලීම සඳහා පියවර ගත යුතු වේ.

මුහුදු කොල්ලකෑම්, ත්‍රස්තවාදය, පුද්ගල හා මත්ද්‍රව්‍ය ජාවාරම්, නියාමනය නොවූ හා වාර්තාගත නොවූ මසුන් ඇල්ලීම සහ නීති විරෝධී අපද්‍රව්‍ය බැහැර කිරීම් වැනි අවභාවිතයන් හේතු කොට ගෙන, ඉන්දියානු උප මහද්වීපයේ ආරක්ෂාව තර්ජනයට ලක් වෙමින් පවතින අතර එහි ප්‍රතිඵලයක් ලෙස ස්ථිර සාමය සහ සමෘද්ධිය ලඟාකර ගැනීම අභියෝගයට ලක් වී ඇත. ඒ අනුව කලාපීය වශයෙන් ඇතිවන ජාත්‍යන්තර ආරක්ෂක තර්ජන වල බලපෑම අවම කරගැනීම සඳහා සමස්ථ ලෝක ප්‍රජාව සමඟ එක්ව කටයුතු කිරීමේ අවශ්‍යතාවය පැන නැඟී ඇත.

අප රජය විසින් සියලු ජන කොටස් අතර සාමය හා සංහිඳියාව ඇතිකිරීමේ සහ ධනාත්මක සහ හිතකර ජාත්‍යන්තර සබඳතාවන් ගොඩනැගීමේ වටිනාකම හඳුනාගෙන ඇත. මේ නිසා දේශීය, කලාපීය හා ගෝලීයව රටේ ජාතික ආරක්ෂාවට එල්ල වී ඇති බලපෑම් තක්සේරු කොට, එවැනි අභියෝග ජය ගැනීම සඳහා අවශ්‍ය ආරක්ෂක ක්‍රමවේදයන් ශ්‍රී ලංකාව විසින් සම්පාදනය කර ගත යුතු වෙයි. එසේම, ගැටළුවලින් තොර සාමකාමී පරිසරයක් ගොඩනඟා ගැනීම සඳහා වෙනත් ජාතීන් සමඟ සක්‍රීය සම්බන්ධතාවයක් පවත්වා ගෙන යාම අත්‍යාවශ්‍ය වේ.

සිය මාතෘභූමිය වෙනුවෙන් පරාර්ථකාමීත්වයෙන් නොපසුබට සේවය කල වීරෝධාර නිර්භීත රණවිරුවන්ට ස්තුති කිරීමට මෙය මා අවස්ථාවක් කර ගනිමි. ඔබ, අප ජාතිය රුදුරු තස්ත්‍රවාදයෙන් මුදවා ජයග්‍රහණය ළඟා කර දුනි. ඔබගේ කෞශල්‍යය ,පරාක්‍රමය ,සහ නොසැලෙන ජීව ගුණය අප ජාතිය විසින් කිසිදා අමතක නොකරනු ඇත. ශ්‍රී ලංකාවට ඔබගේ නොසැලෙන තරගකාරීත්වය , කැපවීම හා අනාගත අභියෝගවලට මුහුණ දීමේ ශක්තිය අවශ්‍ය බව මාගේ විශ්වාසයයි.

මෛත්‍රීපාල සිරිසේන
ආරක්ෂක අමාත්‍ය
ඔක්තෝබර් 2015

## ආරක්ෂක ලේකම්තුමාගේ පණිවිඩය



දශක තුනක් මුළුල්ලේ පැවැති ගැටුම්කාරී තත්වය අවසන් කොට සංවර්ධනයේ අරුණලු පතිත වීම ආරම්භ වී ඇත. ආර්ථික, සමාජයීය හා සංස්කෘතික සංවර්ධනයක් කරා පියනගන මෙවන් කාලපරිච්ඡේදයක් තුළ එකී කාර්යය රජයේ ඉලක්කයන්ට අනුකූල වන පරිදි ඉටු කිරීමේ වැදගත් භූමිකාවක නියැලී සිටින ආරක්ෂක අමාත්‍යාංශයේ කාර්යසාධනය අගයමින් ඉදිරි දැක්ම පුරෝකථනය කිරීම ඉතා වැදගත් හා කාලෝචිත වනු ඇත.

ජාතීන් අතර සාමය හා එකමුතුකම ඇති කරවමින් තිරසාරවූත්, වර්තමාන අවශ්‍යතාවයන්ට ගැලපෙන්නාවූත් අයුරින් සංවර්ධන කටයුතු කර ගැනීම සඳහා රටේ ආරක්ෂාව මෙන්ම ඒකීය රටක භෞමික අඛණ්ඩතාවය තහවුරු කිරීම අත්‍යාවශ්‍ය වන්නේ ය. මෙම අභියෝගයන්ට මුහුණදීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය කැපවීමෙන් කටයුතු කරනු ලබන බව පවසන්නේ අභිමානයෙනි.

සියලුම අංශයන්හී දායකත්වය ඒකරාශී කොට ගනිමින් යහපත් පාලන තන්ත්‍රයක් පිළිබඳ වූ ජනතාවගේ අභිලාශයන් මුදුන්පත් කරවමින් හා රටේ පොදු මහජනතාවගේ අභිවෘද්ධිය වෙනුවෙන් සහ සුරක්ෂිත රටක් වෙනුවෙන් කරනු ලබන මෙහෙය වෙනුවෙන් අමාත්‍යාංශ කාර්යමණ්ඩලයටත් ත්‍රිවිධ හමුදාව ඇතුලු අමාත්‍යාංශයට අනුබද්ධ සියලුම ආයතනයන්හී ප්‍රධානීන් හා කාර්යමණ්ඩලයට මාගේ ප්‍රණාමය දක්වමි.

හෙට ඉදිවන නව ශ්‍රී ලංකාවට මෙරට මතු පරපුරේ අනාගතය ඉසුරුමත් කරන්නට හැකිවේවායි ද පතන්නෙමි.

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි  
ආරක්ෂක ලේකම්  
ඔක්තෝබර් 2015


# දැක්ම

"සැම සුරැකි සුවබර රටක් "

# මෙහෙවර

" භෞමික අඛණ්ඩතාවයෙන් යුත් සුරක්ෂිත ස්වෛරී රටක්,
තිරසර නාගරික පරිසරයක්, තරඟකාරී ආර්ථිකයක් සහ
උසස් ජීවන තත්වයක් තහවුරු කිරීම උදෙසා
උපායමාර්ගික සැලසුම් හා ප්‍රතිපත්ති සකස් කිරීම සහ
ක්‍රියාවට නැංවීම "

# අමාත්‍යාංශයීය සංවිධාන ව්‍යුහය



# පටුන

අමාත්‍යාංශයේ විවිධ අංශයන්හි කාර්යය සාධනය ....................................................................1

01 ආරක්ෂක අංශය ....................................................................................2

1.1 සමාලෝචනය....................................................................................2

1.2 2014 වසරේ මුදුන් පමුණුවා ගැනීම....................................................2

1.2.1 ප්‍රධාන ක්‍රියාකාරකම් හා ප්‍රගතිය.....................................................3

1.2.2 2014 වසරේ ධාරිතා වර්ධන ක්‍රියාකාරකම්........................................3

1.3 2014 වසරේ ක්‍රියාකාරකම්වල විග්‍රහය/ අගැයීම.......................................3

1.4 ගැටළු හා අභියෝග..............................................................................3

1.5 අනාගත අපේක්ෂා...............................................................................3

02 තාක්ෂණික අංශය.....................................................................................4

2.1 සමාලෝචනය....................................................................................4

2.2 2014 වසරේ ක්‍රියාකාරකම්වල විග්‍රහය/ අගැයීම.......................................4

03 පාර්ලිමේන්තු හා සිවිල් කටයුතු අංශය.........................................................7

3.1 සමාලෝචනය....................................................................................7

3.2 2014 වසරේ මුදුන් පමුණුවා ගැනීම්....................................................7

3.2.1 ත්‍රිවිධ හමුදාවෙහි විශේෂිත හට පිරිස් ස්ථානගත කිරීම් හා කඳවුරු ස්ථාපනය සඳහා අදාල ඉඩම් කටයුතු..............................................................7

3.2.2 පාර්ලිමේන්තු කටයුතු..........................................................................7

3.2.2.1 පාර්ලිමේන්තු ප්‍රශ්ණ..........................................................................7

3.2.2.2 පාර්ලිමේන්තු උපදේශක කාරක සභා......................................................7

3.2.2.3 මහජන පෙත්සම් කාරක සභා................................................................8

3.2.2.4 ස්ථාවර නියෝග හා පාර්ලිමේන්තුව කල් තබන අවස්ථාවේදී ඉදිරිපත්වූ ප්‍රශ්න .............................................................................8

3.2.2.5 ත්‍රිවිධ හමුදා සඳහා නිල ඇඳුම් හා ඇගලුම් රෙදිපිළි සැපයීමට අදාල කරුණු.........................................................................................8

3.2.2.6 මහජනතාවයේ අභියාචනා හා දුක්ගැනවිලි............................................8

3.2.2.7 පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව.......................................8

3.2.2.8 අංශයේ අභ්‍යන්තර පරිපාලන කටයුතු...................................................8

04 පරිපාලන අංශය……………………………………………………………………9

4.1 සමාලෝචනය……………………………………………………………………9

4.1.1 සාමාන්‍ය පරිපාලනය…………………………………………………………9

4.1.2 නීති කටයුතු…………………………………………………………………9

4.1.3 ඉංජිනේරු කටයුතු……………………………………………………………9

4.1.4 රණවිරු සුභසාධනය…………………………………………………………9

4.1.4.1 අපි වෙනුවෙන් අපි ව්‍යාපෘතිය……………………………………………9

4.1.4.2 රණවිරුවන්ගේ ජීවන තත්වය නගාලීම සඳහා වූ ව්‍යාපෘතිය…………10

4.1.4.3 අඩක් නිම කරන ලද රණවිරු නිවාස යෝජනා ක්‍රමය……………10

4.2. ගැටළු හා අභියෝග……………………………………………………………13

4.3. අනාගත අපේක්ෂා ……………………………………………………………13

05 සිවිල් ආරක්ෂක හා සංවර්ධන අංශය…………………………………………14

5.1 සමාලෝචනය……………………………………………………………………14

5.2 2014 වසරේ මුදුන් පමුණුවා ගැනීම්……………………………………………14

5.2.1 ජනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය………………14

5.2.2 ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය………………………………14

5.2.3 ඒකාබද්ධ සේවා භාෂා හා පුහුණු ආයතනය……………………………………14

5.2.4 ජාතික මිනිස් ජාවාරම් විරෝධී කාර්ය සාධන බලකා රැස්වීම…………………14

5.2.5 ප්‍රධාන ක්‍රියාකාරකම් - 2014 වසරේ ත්‍රිවිධ හමුදා සහ පොලිසියේ පාසල්වලට ඇතුළත් කර ගැනීම්……………………………………………………………15

5.2.6 2014 වසරේදී සපුරාගත නොහැකිවූ ඉලක්ක සහ 2015 ඉදිරි වසරට කල්දැමූ වැඩ……………………………………………………………15

5.3 ගැටළු හා අභියෝග……………………………………………………………15

06 මුදල් අංශය……………………………………………………………………16

6.1 සමාලෝචනය……………………………………………………………………16

6.2 2014 වසරේ මුදුන් පමුණුවා ගැනීම්……………………………………………16

**07** අභ්‍යන්තර විගණන අංශය……………………………………………………………20

**7.1** සමාලෝචනය ……………………………………………………………………20

**7.2** **2014** වසරේ මුදුන් පමුණුවා ගැනීම් ………………………………………………20

**7.3** **2014** වසරේ ක්‍රියාකාරකම්වල විග්‍රහය/අගැයීම්………………………………………21

**7.4** ගැටළු හා අභියෝග…………………………………………………………………21

**7.5** අනාගත අපේක්ෂා……………………………………………………………………21

**08** සන්නද්ධ සේවා සුහසාධන අංශය……………………………………………………22

**8.1** සමාලෝචනය………………………………………………………………………22

**8.2** **2014** වසරේ මුදුන් පමුණුවා ගැනීම්……………………………………………………22

**8.3** අනාගත අපේක්ෂා……………………………………………………………………22

**09** නාගරික සංවර්ධන අංශය…………………………………………………………23

**9.1** සමාලෝචනය………………………………………………………………………23

**9.2** නාගරික සංවර්ධන අංශයේ ප්‍රගතිය…………………………………………………23

**9.3** නාගරික සංවර්ධන අංශය…………………………………………………………23

**9.4** ඉඩම් අංශය ………………………………………………………………………24

**9.5** ඇගයුම් හා මෙහෙයුම් අංශය………………………………………………………24

**9.6** තාක්ෂණ හා ප්‍රසම්පාදන අංශය……………………………………………………24

**9.7** නාගරික සංවර්ධන අංශය මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන් හි ප්‍රගතිය……………**25**

**9.7.1** පිටත වටරවුම් ආශ්‍රිත නගර සංවර්ධන ව්‍යාපෘතිය………………………………25

**9.7.2** උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය……………………………………25

**9.7.3** බත්තරමුල්ල පුද්ගල අනන්‍යතා මහ ලේකම් කාර්යාලය……………………25

**9.7.4** නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය……………………………………………25

**10** මාධ්‍ය මධ්‍යස්ථානය…………………………………………………………………27

**10.1** සමාලෝචනය………………………………………………………………………27

**10.2** **2014** වසරේ මුදුන් පමුණුවා ගැනීම්……………………………………………………27

**10.3** **2014** වසරේ ක්‍රියාකාරකම්වල විග්‍රහය/අගැයීම්………………………………………27

**10.4** අනාගත අපේක්ෂා …………………………………………………………………28

11 හමුදා සම්බන්ධතා කාර්යාලය.....................................................................29

11.1 සමාලෝචනය.....................................................................29

11.2 2014 වසරේ මුදුන් පමුණුවා ගැනීම්.....................................................................30

11.3 2014 වසරේ ක්‍රියාකාරකම්වල විග්‍රහය/ අගැයීම්.....................................................................30

11.4 අනාගත අපේක්ෂා .....................................................................32

ආයතනවල කාර්ය සාධනය.....................................................................33

12 වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව.....................................................................34

12.1 සමාලෝචනය.....................................................................34

12.2 2014 වසරේ මුදුන් පමුණුවා ගැනීම්.....................................................................34

12.2.1 මෙහෙයුම්.....................................................................34

12.2.1.1 ජීවිතාරක්ෂක මෙහෙයුම්.....................................................................34

12.2.1.2 නීති විරෝධී ක්‍රියාකලාප නිෂ්ප්‍රභා කිරීම සඳහා වෙරළ ආවේක්ෂණය35

12.2.1.3 නීති විරෝධී, නියාමනය නොකෙරෙන හා වාර්තාකරණය නොවූ මාළු ඇල්ලීම.....................................................................35

12.2.1.4 ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩ සටහන්.....................................................................35

12.2.1.5 සෝදිසි කොට, විපතින් බේරා ගැනීමේ මෙහෙයුම්.....................................................................35

12.2.1.6 නීතිය බලාත්මක කිරීමේ මෙහෙයුම්.....................................................................35

12.2.1.7 පර්යේෂණ සහ සංවර්ධනය.....................................................................36

12.2.1.8 විදේශීය දූත පිරිස් හා සමග අන්‍යෝන්‍ය ක්‍රියාදාමයන් ගොඩ නගා ගැනීම

12.2.2 පුහුණු කිරීමේ ක්‍රියාදාම.....................................................................36

12.2.3 ධාරිතා වර්ධන ක්‍රියාකාරකම්.....................................................................36

12.2.4 ඉදිකිරීම්/තාක්ෂණික ප්‍රධානතම ක්‍රියාකාරකම්.....................................................................37

12.3 විග්‍රහය/අගැයීම්.....................................................................38

12.3.1 ප්‍රධාන ව්‍යාපෘති.....................................................................39

12.3.2 අගැයීම් හා උගත් පාඩම්.....................................................................39

12.4 ගැටළු හා අභියෝග.....................................................................39

12.5 අනාගත අපේක්ෂා .....................................................................40

13 ආගමන හා විගමන දෙපාර්තමේන්තුව……………………………………………………41

13.1 සමාලෝචනය……………………………………………………………………41

13.2 2014 වසරේ මුදුන් පමුණුවා ගැනීම්…………………………………………41

13.3 ප්‍රසම්පාදන ක්‍රියාකාරකම්…………………………………………………42

14 පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව………………………………47

14.1 සමාලෝචනය……………………………………………………………………47

14.2 මුදුන් පමුණුවා ගැනීම් සහ ක්‍රියාත්මක කරණ ලද ක්‍රියාකාරකම්වල විග්‍රහය…………47

14.3 ගැටළු හා අභියෝග…………………………………………………………50

14.4 අනාගත අපේක්ෂා ……………………………………………………………50

15 සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව…………………………………………………51

15.1 සමාලෝචනය……………………………………………………………………51

15.2 2014 වසරේ මුදුන් පමුණුවා ගැනීම්…………………………………………51

15.3 2014 වසරේ ක්‍රියාකාරකම්වල විග්‍රහය/ අගැයීම්………………………………52

15.4 ගැටළු හා අභියෝග…………………………………………………………52

15.5 අනාගත අපේක්ෂා ……………………………………………………………53

16 පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය…………………………………………54

16.1 සමාලෝචනය……………………………………………………………………54

16.2 2014 වසරේ මුදුන් පමුණුවා ගැනීම්…………………………………………54

16.3 2014 වසරේ ක්‍රියාකාරකම්වල විග්‍රහය/අගැයීම්…………………………………56

16.4 ගැටළු හා අභියෝග…………………………………………………………58

16.5 අනාගත අපේක්ෂා ……………………………………………………………58

17 රාජ්‍ය බුද්ධි අංශය…………………………………………………………………59

17.1 සමාලෝචනය……………………………………………………………………59

17.2 2014 වසරේ මුදුන් පමුණුවා ගැනීම්…………………………………………59

17.3 2014 වසරේ ක්‍රියාකාරකම්වල විග්‍රහය/අගැයීම්…………………………………59

17.4 ගැටළු හා අභියෝග…………………………………………………………59

17.5 අනාගත අපේක්ෂා ……………………………………………………………60

**18** ජාතික ශිෂ්‍ය බලකාය......62

**18.1** සමාලෝචනය......62

**18.2** 2014 වසරේ මුදුන් පමුණුවා ගැනීම්......62

**18.2.1** ශිෂ්‍යභට පුහුණුව......65

**18.2.2** විදේශීය චාරිකා......66

**18.2.3** නිලධාරි පුහුණුව......66

**18.3** ගැටළු හා අභියෝග......66

**18.4** අනාගත අපේක්ෂා......66

**19** ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය......67

**19.1** සමාලෝචනය......67

**19.2** 2014 වසරේ මුදුන් පමුණුවා ගැනීම්......67

**19.2.1** විශ්ව විද්‍යාලයීය ආරෝග්‍ය ශාලාව ස්ථාපිත කිරීම......67

**19.2.2** ආශ්‍රිත සෞඛ්‍ය සේවා විද්‍යා පීඨය වේරහැරට ගෙනයාම......67

**19.2.3** කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ දක්ෂිණ මණ්ඩපය ස්ථාපිත කිරීම......68

**19.2.4** උපාධි අධ්‍යයන පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීම......68

**19.2.5** විශ්වවිද්‍යාලීය මුද්‍රණාලය ස්ථාපිත කිරීම......68

**19.2.6** කැඩෙට් නිලධාරි නිවස්න පහසුකම් වැඩි දියුණු කිරීම......68

**19.2.7** විද්‍යාත්මක ප්‍රජාව සඳහා විවෘත ප්‍රවේශ ප්‍රතිපත්තිය මත 24X7 පර්යේෂණාගාරය ඉදිකිරීම......68

**19.2.8** ඉංජිනේරු පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීම......68

**19.2.9** කදවල වැව් ප්‍රතිසංස්කරණය......68

**19.3** 2014 වසරේ ක්‍රියාකාරකම්වල විග්‍රහය/ අගැයීම......68

**19.4** ගැටළු හා අභියෝග......69

**19.5** අනාගත අපේක්ෂා......69

**20** ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය......71

**20.1** සමාලෝචනය......71

**20.2** 2014 වසරේ මුදුන් පමුණුවා ගැනීම්......71

**20.2.1** ප්‍රධාන ක්‍රියාකාරකම්......71

20.2.1.1 ව්‍යායාම……………………………………………………………………71

20.2.1.2 සංචාර……………………………………………………………………..72

20.2.2 විශේෂ අවස්ථා………………………………………………………………..72

20.2.2.1 විදේශ දූත කණ්ඩායම් වල සංචාර………………………………….72

20.2.3 අධ්‍යාපනික වැඩසටහන්……………………………………………………73

20.2.4 උපාධි ප්‍රදානෝත්සවය……………………………………………………..74

20.2.5 සපුරාගත නොහැකි වූ ඉලක්ක…………………………………………………74

20.2.6 ධාරිතා වර්ධනය……………………………………………………………74

20.3 2014 වසරේ ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම්වල විග්‍රහය / ඇගයීම…………………74

20.4 ගැටළු හා අභියෝග…………………………………………………………75

20.5 අනාගත අපේක්ෂා……………………………………………………………..75

21 ආරක්ෂක සේවා විද්‍යාලය…………………………………………………………76

21.1 සමාලෝචනය………………………………………………………………..76

21.2 2014 වසරේ මුදුන් පමුණුවා ගැනීම්……………………………………………76

21.3 2014 වසරේ ක්‍රියාකම්වල විග්‍රහය/අගැයීම……………………………………77

21.4 ගැටළු හා අභියෝග…………………………………………………………77

21.5 අනාගත අපේක්ෂා……………………………………………………………77

22 ඒකාබද්ධ සේවා භාෂා පුහුණු ආයතනය………………………………………………78

22.1 සමාලෝචනය…………………………………………………………………78

22.2 2014 වසරේ මුදුන් පමුණුවා ගැනීම්…………………………………………78

22.2.1 ප්‍රධාන ක්‍රියාකාරකම්…………………………………………………………78

22.2.2 2015 වසර දක්වා කල්දැමූ වැඩ……………………………………………78

22.2.3 උගත් පාඩම්………………………………………………………………78

22.3 ගැටළු හා අභියෝග…………………………………………………………78

22.4 අනාගත අපේක්ෂා……………………………………………………………78

23 සීමාසහිත ලංකා ලොජිස්ටික්ස් ඇන්ඩ් ටෙක්නොලොජීස්......79

23.1 සමාලෝචනය......79

23.2 2014 වසරේ මුදුන් පමුණුවා ගැනීම්......79

23.2.1 ප්‍රධාන ක්‍රියාකාරකම්......79

23.2.2 ධාරිතා සංවර්ධනය......79

23.3 2014 වසරේ ක්‍රියාකම්වල විග්‍රහය/අගැයීම......80

23.4 ගැටළු හා අභියෝග......81

23.5 අනාගත අපේක්ෂා......81

23.5.1 මධ්‍ය කාලීනව (2016-2018) සංවිධානය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාත්මක කළයුතු ක්‍රියාකාරකම්......81

23.5.2 දීර්ඝ කාලීන පදනමින් සමාගම වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාත්මක කළ යුතු ක්‍රියාකාරකම්......81

24 සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා......82

24.1 සමාලෝචනය......82

24.2 2014 වසරේ ප්‍රගතිය......83

25 ජාතික අන්තරායකාරී ඖෂධ පාලක මණ්ඩලය......84

25.1 සමාලෝචනය......84

25.2 2014 වර්ෂය මුදුන් පමුණුවා ගැනීම්......84

25.3 ගැටළු හා අභියෝග......85

25.4 අනාගත අපේක්ෂා......85

26 නාගරික සංවර්ධන අධිකාරිය......86

26.1 සමාලෝචනය......86

26.2 2014 වසරේ මුදුන් පමුණුවා ගැනීම්......86

26.3 අනාගත අපේක්ෂා......89

# අමාත්‍යාංශයේ විවිධ අංශ අංශයන්හි කාර්යය සාධනය

# 01. ආරක්ෂක අංශය

## 1.1 සමාලෝචනය

ත්‍රිවිධ හමුදාවන්ගේ ආයතන හා පරිපාලන අධීක්ෂණ කටයුතු භාරව ක්‍රියා කරනු ලබන්නේ, ආරක්ෂක අමාත්‍යාංශයේ ආරක්ෂක අංශයයි.මෙයට අමතරව එක්සත් ජාතීන්ගේ සාම හමුදාවන්හි සේවයේ නියුතු ශ්‍රී ලාංකීය හමුදා බළඛණ්ඩයන්හි අධීක්ෂණයද මෙම අංශයේ වගකීමකි.

## 1.2 2014 වසරේදී මුදුන්පමුණුවා ගැනීම

### 1.2.1 ප්‍රධානතම ක්‍රියාකාරකම් හා එහි ප්‍රගතිය

**ආරක්ෂක අංශයෙහි ප්‍රධානතම ක්‍රියාකාරකම් හා ඒවායේ නිපැයුම් සාරාංශය පහත දැක්වෙන වගුවල දක්වා ඇත.**

1.1 වගුව: 2014 වසරේ කාර්ය මණ්ඩලීය කටයුතු හා උසස්වීම්

| සේවාව | බඳවාගැනීම් සංඛ්‍යාව | උසස්වීම් සංඛ්‍යාව |
|---|---|---|
| ශ්‍රී ලංකා යුද හමුදාව | 35 | 680 |
| ශ්‍රී ලංකා නාවික හමුදාව | 109 | 712 |
| ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 11 | 80 |

1.2 වගුව : වන්දි ප්‍රදානය

| වර්ගය | ශ්‍රීලං යුහ | ශ්‍රීලං නාහ | ශ්‍රීලං ගුහ |
|---|---|---|---|
| ක්‍රියාන්විත රාජකාරියේදී මිය ගිය හමුදා නිලධාරීන්ගේ යැපෙන්නන් සඳහා | 33 | - | - |
| වෙනත් හේතූන් නිසා මියගිය හමුදා නිලධාරීන්ගේ යැපෙන්නන් සඳහා | 51 | 12 | 07 |
| ආබාධයන්ට ගොදුරුවූ හමුදා පුද්ගලයින් | 230 | - | 03 |
| නැවත විවාහප්‍රාප්ත වූ වැන්දඹුවන් සඳහා | 151 | 08 | 02 |
| වයස අවුරුදු 26ට අඩු දරුවන් සඳහා | 27 | 03 | 02 |

1.3 වගුව : විදේශීය රටවලින් ප්‍රදානය කරන ලද පුහුණු පාඨමාලා

| | |
|---|---|
| ඉන්දියාව | 439 |
| පාකිස්තානය | 230 |
| බංගලාදේශය | 43 |
| චීනය | 74 |
| මැලේසියාව | 31 |
| ඇමරිකා එක්සත් ජනපදය | 27 |
| ඕස්ට්‍රේලියාව | 01 |
| ජපානය | 10 |
| වෙනත් රටවලින් සෘජුව ප්‍රදානය කරන ලද පාඨමාලා | 86 |
| වෙනත් රටවලින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා ප්‍රදානය කරණ ලද පාඨමාලා | 86 |

1.4 වගුව : නිර්භීතකම ඇගයීම මත සියළුම නිලයන් සඳහා කරන ලද ප්‍රදාන හා පදක්කම් පිරිනැමීම

| ප්‍රදාන / පදක්කම් | ශ්‍රීලංයුහ | ශ්‍රීලංනාහ | ශ්‍රීලංගුහ |
|---|---|---|---|
| වීකේපී | 01 | - | 265 |
| විඑස්පී | - | 52 | - |
| දිගු සේවා පදක්කම | - | 1860 | 1586 |
| කේඑස්පී | 16 | - | - |
| යුඑස්පී | 2281 | 529 | 194 |
| විඑස්පී | - | 205 | - |
| ඩීපීඑස් | - | 07 | 15 |
| පීඑස්සී | - | 3023 | 377 |

2014 වසරේ පළමු කාර්තුව තුළ එක්සත් ජාතීන්ගේ හමුදා බළඛණ්ඩයන්හි සේවයේ නියැලුණ ශ්‍රී ලාංකීය සාම හමුදා නිලදරුවන් විසින් උපයා ගන්නා ලද විදේශ විනිමය ප්‍රමාණය ඇමරිකානු ඩොලර් මිලියන 16.73

1.5 වගුව : සාම හමුදාවන්හි සේවා නියුක්තිය

| | ශ්‍රීලංයුහ | ශ්‍රීලංනාහ | ශ්‍රීලංගුහ |
|---|---|---|---|
| හයිටි | 892 | 84 | 85 |
| ලෙබනනය | 151 | - | - |
| කොන්ගෝ | 04 | - | - |
| අබයි | 06 | - | - |
| දකුණු සුඩානය | 02 | - | - |
| බටහිර සහරා | 03 | - | - |
| නිව්යෝක් මෙහෙයුම් බණ්ඩය | 01 | - | - |
| එකතුව | 1081 | 84 | 85 |

### 1.2.2 2014 වසරේ මෙහෙයවන ලද ධාරිතා වර්ධන ක්‍රියාකාරකම්

දේශීය හා විදේශීය පෘථුල පුහුණු අවස්ථා ප්‍රදානය කෙරෙමින් ත්‍රිවිධ හමුදාවන්ගේ ධාරිතා වර්ධනය උදෙසා කටයුතු සම්පාදනය කෙරිණ. කෙටි හා දිගුකාලීන වූ මෙම පාඨමාලාවන්, චීනයේ හා ඇමරිකා එක්සත් ජනපදයේ මෙන්ම ඉන්දියාව හා පකිස්ථානය වැනි කලාපීය රටවල පුළුල් පරාසයක බහුවිධ විෂයයමාලාවන්ගෙන් සමන්විත විය.

## 1.3 2014 වසරේ ක්‍රියාකාරම්වල විග්‍රහය/ ඇගයීම

ත්‍රිවිධ හමුදාවන්ට හා පොදු මහජනතාවට සන්නද්ධ හමුදාවන්ට අදාල ආපදා අවස්ථාවන්හිදී සේවා සැපයීම ආරක්ෂක අංශය විසින් ඉටු කරනු ලබයි. මෙම සේවාවන් ඔස්සේ ප්‍රදානය කෙරුණු සේවය මූල්‍යමය වශයෙන් ඇගයීමකට ලක් කළ නොහැකි වුවද සන්නද්ධ හමුදාවන්ගේ ඉහළතම ප්‍රසාදය දිනා ගැනීමට සමත්විය. 2014 වසරේදී ප්‍රදානය කෙරුණ මෙම සේවාවන් තක්සේරු කිරීමේදී කාලෝචිතව ප්‍රතිචාර දැක්වීමේ හා ප්‍රතික්‍රියාශීලීවීමේ අවශ්‍යතාවය හුවා දැක්වෙන අතර මෙම ප්‍රතිඵලයන් සාක්ෂාත් කරගන්නා ලද්දේ රජයේ ලේඛණ සැකසීමේ දින තුනේ නීතියට අනුගතවී කටයුතු කිරීමෙනි.

## 1.4 මුහුණ පෑ ගැටළු හා අභියෝග

සහායක සේවා කාර්ය මණ්ඩල ගණයන්හි මානව සම්පත් හිඟය අංශය මුහුණ පෑ විශාලතම දුෂ්කරතාවයයි. සන්නද්ධ හමුදාවන් විසින් ඉදිරිපත් කරන ඉල්ලීම් සඳහා කාලෝචිත ප්‍රතිචාර දැක්වීමේදී අභියෝගයන් බවට පත් වූ මෙම දුෂ්කරතාවයට කඩිනම් පිළියම් වශයෙන් තවදුරටත් ප්‍රමාදයකින් තොරව අදාල සේවා බණ්ඩයන්හි මානව සම්පත් වර්ධනය කර ගැනීම සඳහා රජයේ අදාල අමාත්‍යාංශ සමඟ කටයුතු කිරීමට ආරක්ෂක අමාත්‍යාංශයේ ආරක්ෂක අංශය පියවර ගෙන ඇත.

## 1.5 අනාගත අපේක්ෂා

අංශයේ මානව සම්පත් බණ්ඩයන්ට අවශ්‍ය ක්ෂේත්‍රයන්හි පුහුණුවීම් ලබාදීමට පියවර ගෙන ඇත. මෙයට මාණ්ඩලික නිලධාරී ගණයන් මෙන්ම සහාය සේවා නිලදැරූ ගණයන්ද ඇතුළත්ය. මෙකී අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා අවශ්‍ය සියළුම අංශයන් ආවරණය වන පරිදි පුහුණුවීම් අවස්ථා සහ හුරුකරවීමේ වැඩමුළු සැලසුම් කර ඇත. ධාරිතා වර්ධනය සඳහා සියළුම සේවකයින්ට සමාන අවස්ථා හිමිවීම තහවුරු කර ගැනීම සඳහා මිත්‍ර විදේශීය රටවලින් ප්‍රදානය කෙරුණ සීමිත වූ පුහුණු සහ හුරුකරවීමේ අවස්ථා සමානව ලබාදීමට අවශ්‍ය කටයුතු කරනු ලැබීය.මෙම ක්‍රියාදාමය අර්ධවාර්ෂික පදනමින් ක්‍රියාත්මක වෙයි.

## 02

## තාක්ෂණික අංශය


### 2.1 සමාලෝචනය

සම්පාදනය කෙරෙන උපාය මාර්ගික ක්‍රමවේද භාවිතා ක්‍රම උපයෝගී කර ගැනීමෙහි හා වර්ධනය කර ගැනීමෙහි ලා රටෙහි පොදු මහජනතාව විසින් භාවිතා කළයුතු ක්‍රියා පිළිවෙත් සඳහා උපාය මාර්ග සම්පාදනය කරන අතරතුර ජාතික ආරක්ෂාවට අදාල සන්නිවේදන හා ඉංජිනේරු කාර්යයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ තාක්ෂණික අංශයට පැවරී ඇත. සංනිවේදන කාර්ය භාරයට ඇතුලත් වන්නේ ගුවන් විදුලි සංනිවේදනය, විදුලි සංදේශ සේවා, රූපවාහිනී සේවා, දත්ත සංනිවේදනය සහ ජාතික ආරක්ෂාවට බලපෑමක් ඇති කළ හැකි සංනිවේදන, යාන්ත්‍රණ හා ආවේක්ෂණ මෙවලම් ආනයනය, ස්ථාපනය හා ක්‍රියාත්මක කිරීමට අදාලව විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ඉල්ලා සිටිනු ලබන නිරීක්ෂන සැපයීම හා අනුමැතිය ලබාදීම යන විෂයයන්ය.ජාතික සුරක්ෂිතතාවය තහවුරු කරන අතරතුර දීප ව්‍යාප්තව රජය විසින් උපදෙස් දෙනු ලැබ ඇති යටිතල පහසුකම් වර්ධනය සඳහා අවශ්‍ය සියළුම සිවිල් හා ක්ෂේත්‍ර ඉංජිනේරු සහාය දාමයන් ඉංජිනේරු කාර්ය භාරයෙන් ආවරණය වෙයි.

### 2.2 2014 වසරේ ක්‍රියාකාරම්වල විග්‍රහය/ ඇගයීම

2014 වසරේදී කුළුණු 191 ක් ඉදිකිරීම සඳහා සුරක්ෂිතතා නිෂ්කාෂණය, සංනිවේදන හා යාන්ත්‍රණ මෙවලම් 595ක් ආනයනය කිරීම සඳහා අනුමැතිය සහ විද්‍යුත් / සන්නිවේදන ආශ්‍රිත මෙවලම් වලට අදාල වාණිජ බලපත්‍ර 222ක් සඳහා සුරක්ෂිතතා නිෂ්කාෂණය, තාක්ෂණික අංශය විසින් ලබාදෙන ලදි.

**2.1 ප්‍රස්ථාරය ( 2014 වසරේදී සුරක්ෂිතතා නිෂ්කාෂණය ලබාදෙන ලද කුළුණු සංඛ්‍යාව**




එසේම ගොංගල, පිදුරුතලාගල, කරගස්තැන්න, මඩුකන්ද, හන්තාන, කිකිළියාමාන හා කොකාවිල්හි අධි ආරක්ෂිත කලාපවල සංනිවේදන මංසල වෙත ප්‍රවේශවීම ,ට්‍රෝලර් යාත්‍රා සඳහා සංනිවේදන හා යාන්ත්‍රණ මෙවලම් හා පිටත මෝටර් ඒකක ආනයනය කිරීම,ගුවන් විදුලි තරංග සංඛ්‍යාත වෙන් කරදීම හා ග්‍රාහක කුළුණු ස්ථාපනය කිරීම, වාහන පිහිටීම නිශ්චය කර ගැනීමේ ක්‍රම පද්ධති සහ ආධුනික ගුවන් විදුලි බලපත්‍ර හිමියන් (දේශීය/විදේශීය) සඳහා සංනිවේදන මෙවලම් ආනයනය කිරීම පිණිස අනුමැතිය ලබා දී ඇත.

**උපායමාර්ගික ආරක්ෂක සංනිවේදන පද්ධති ව්‍යාපෘතිය**

උපායමාර්ගික ආරක්ෂක සන්නිවේදන පද්ධති ව්‍යාපෘතිය මඟින් සුරක්ෂිත පොදු සංනිවේදන රූකුලක් සැලසෙන අතර ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ හා විශේෂ කාර්ය සාධන බලකායේ පෙර තෝරාගත් පර්යන්ත ඒකක සම්බන්ධ කෙරෙන ක්ෂුද්‍ර තරංග පුඩු 37කින් සමන්විත වෙයි.

2014 වසරේදී ව්‍යාපෘති කළමණාකරණ ඒකකය ස්ථාපිත කරන ලදුව ව්‍යාපෘතියේ පැකේජයන් 04ක් සඳහා කෙටුම්පත් ටෙන්ඩර් ලේඛණ සම්පාදනය කරනු ලැබීය.

**ගැටළු සහ අභියෝග**

නව ග්‍රාහක කුළුණු 11ක් සඳහා ව්‍යාපෘති භූමි භාගයන් තෝරා ගැනීම හා ප්‍රමාණවත් ඉඩම් කොටස් ඉඩම් හිමිකරුවන්ගෙන් ලබා ගැනීමේ දුෂ්කරතා

**පොලිස් තොරතුරු හා සංනිවේදන පද්ධති ව්‍යාපෘතිය**

පොලිස් තොරතුරු හා සංනිවේදන පද්ධති ව්‍යාපෘතියේ අරමුණ වන්නේ සමාජයේ පොදු ආරක්ෂක අවශ්‍යතාවයන් වඩාත් කාර්යක්ෂමව හා සක්‍රියව සපුරාලීමට ශ්‍රී ලංකා පොලීසියට හැකිවන පරිදි පොදු ආරක්ෂා සංවිධාන පද්ධතිය භාවිතයට ගැනීමයි.

ටෙන්ඩර් ලේඛණ සකස් කර දිවයිනේ උතුරුකරයේ අළුතින් මුදාගත් ප්‍රදේශවල සංනිවේදන පහසුකම් ස්ථාපිත කිරීමට පියවර ගන්නා ලදි.

**ගැටළු සහ අභියෝග**

හඳුනාගත් ගුවන් විදුලි සංඛ්‍යාත සීමාවේ (418 – 432 එම්.එච්) භෞතිකමය පදිංචිකරුවන් ඉවත් කිරීම, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් අනුමැතිය ලබා ගන්නා ලදි.

**ආරක්ෂක මූලස්ථානය යළි ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය**

රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය සහ ත්‍රිවිධ හමුදා මූලස්ථාන යළි ස්ථාපිත කිරීම සඳහා අකුරේගොඩ අක්කර 56ක වපසරියකින් යුත් භූමි භාගයක ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය තැනීමේ කටයුතු 2011 වසරේදී ආරම්භ කෙරිණ. ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් බිලියන 53.2 ක් වන අතර, 2019 වසරේ අවසන් භාගයේදී නිමකිරීමට නියමිතය

BLOCK 06 - SLA






BLOCK 6 - SLA



BLOCK 07 – SLA




**කොළඹ අග නගරය ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය**

කොළඹ අග නගරය ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ වැඩ කටයුතු 2014 වසර වන විට අඩක් පමණ නිමවූ අතර 63ක් වැඩ සංයුතිවලින් 14ක් නිමකර 17ක් නිම වෙමින් පවතී. ඉතිරි සංයුති 32 සැළසුම් සම්පාදන පියවරෙහි හෝ අදාල මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමේ ආයතනවල සියුම් පරීක්ෂාව යටතේ පවතී. මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමේ ආයතන හා පළාත් අධිකාරී ආයතන වල ධාරිතා ගොඩනැඟීම අරමුණු කොටගත් වැඩ සංයුති 22න් 05ක් නිමකර ඇති අතර 3ක වැඩ ක්‍රියාත්මක වෙමින් පවතින අතර ඉතිරි සංයුති 14 සම්බන්ධයෙන් තවමත් අවසාන තීරණ ගෙන නැත. සැලසුම් කරන ලද උපදේශණ සේවා සංයුති 32කින් 08ක් නිම කර ඇති අතර 12ක මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී. ඉතිරි 17 සැලසුම් පියවරෙහි රැඳී ඇත.

කොළඹ මහ නගර සභාව, ශ්‍රී ජයවර්ධනපුර නගර සභාව සහ දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව යටතේ වූ යටිතල පහසුකම් සංවර්ධන උප ව්‍යාපෘති බොහෝමයක වැඩ කටයුතු 2014 වසරේදී නිම කරන ලදී. මාර්ගවල ඇවිදීමේ හැකියාව වැඩි දියුණු කිරීම, මාර්ග සංඥා හා පොදු වැසිකිළි කටයුතු මේ යටතේ ගැනෙන සමහරක් ක්‍රියාකාරකම් වෙයි. බොහෝ උප ව්‍යාපෘති සඳහා අත්තිවාරම් යොදන ලද්දේ 2014 වසර තුළදීය.

**මූල්‍ය ප්‍රගතිය**

සමස්ත ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 223 කි. එයින් ඇ.ඩො. මිලියන 213 ක් ලෝක බැංකුවෙන් ලබා දෙන ලද අතර ඉතිරි මුදල ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් යොදවනු ලැබේ. 2014 වසර අවසානය වන විට සමස්ත ව්‍යාපෘති වියදම ඇ.ඩො.මිලියන 55ක් පමණ වූ අතර එය අපේක්ෂිත වියදමට වඩා අඩු වටිනාකමකි.එයට හේතුව වන්නේ අධි වටිනාකමකින් යුත් උප ව්‍යාපෘති බොහෝමයක්ම පාලනය කරගත නොහැකි බාහිර හේතු කරණ කොට ගෙන අපේක්ෂිත වැඩ සටහන් ඉලක්ක කරා ගෙන යා නොහැකි වූ ව්‍යාපෘතිවල සංරචක -1 යටතේ ගැණෙන හෙයිනි.

- **පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය**

2014 වසරේදී ව්‍යාපෘති කිහිපයක් ආරම්භ කළ පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය පසුගිය වසරේදී ආරම්භ කළ ව්‍යාපෘති සමහරක්ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. තොරතුරු තාක්ෂණ අංශය විද්‍යුත් අංශය විසින් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතින් වන්නේ ලයන් ව්‍යාපෘතිය,දුම්රිය පිහිටීම නිශ්චය කිරීමේ ක්‍රමවේදය , කාලතුවක්කු ප්‍රහාර සමාකෘතිය හා විශේෂ කාර්ය සාධන බලකාය සඳහා සිද්ධි වාර්තාකරණ ක්‍රමවේදය සහ හයිටෙක් සෝල්ජර් ක්‍රමවේදයයි.




Location base immediate Blood Donor Searching



Development of GIS application to improve Gunnery Skill and increase efficiency at Gun




Small Arm Firing



Underwater Acoustic Sensor Array



Medium Range Unmanned Aerial Vehicle (MRUAV).



Prison Jammer

## ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ නීතිගත සංස්ථාව

කොළඹ අග නගරය ආශ්‍රිත ප්‍රදේශයේ ගංවතුර තර්ජනය අවම කිරීම සඳහා විශේෂ ව්‍යාපෘති ගණනාවක්ම ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ නීතිගත සංස්ථාව විසින් ක්‍රියාත්මක කරන ලදි. එසේම, දිවයිනේ ඉදි කිරීම් කර්මාන්තය සඳහා මුහුදු වැලි සැපයීම සඳහා මුහුදු වැලි ව්‍යාපෘතියක්ද සංස්ථාව විසින් ආරම්භ කෙරිණ.

**වසර තුළ නිම කරණ ලද ව්‍යාපෘති**

- බ්ලූමැන්ඩල්, මට්ටක්කුලිය, කාක දූපත් ප්‍රදේශය හා අවට ප්‍රදේශය තුළ ජලාපවාහන කටයුතු වැඩි දියුණු කිරීම සහ භූ දර්ශනාත්මක කටයුතු වැඩි දියුණු කිරීම.
- මුදුන් ඇළ, පෑලියගොඩ, ඔලියමුල්ල, කැළණිය සහ කිරිබත්ගොඩ ප්‍රදේශයේ සහ අවට ජලාපවාහන කටයුතු වැඩිදියුණු කිරීම, ගංවතුර පාලන කටයුතු හා නාගරික භූ දර්ශනාත්මක කටයුතු වැඩි දියුණු කිරීම.
- ඉත්තම්පහුව ඇළ, කොළොන්නාව, මීතොටමුල්ල , මුල්ලේරියාව සහ අංගොඩ ප්‍රදේශයේ හා අවට ගංවතුර පාලන කටයුතු, භූ දර්ශනාත්මක කටයුතු වැඩි දියුණු කිරීම.
- බොල්ගොඩ ඇළ හා ඒ අවට ගංවතුර පාලන කටයුතු , භූ දර්ශනාත්මක කටයුතු වැඩි දියුණු කිරීම.
- පාර්ලිමේන්තු ඉහළ ජලාධාර ප්‍රදේශයේ හා ඒ අවට ගංවතුර පාලනය, පරිසර වර්ධන කටයුතු හා භූ දර්ශනාත්මක කටයුතු
- හීන් ඇළ වගුරු බිම් ප්‍රදේශය, පාගොඩ ප්‍රදේශය සහ කිරුලපන - හීන් ඇල බෙදුම ඇතුළු අවට ප්‍රදේශවල ජලාපවහනය වැඩිදියුණු කිරීම සහ නගර සංවර්ධනය
- සමස්ත බේර වැව ප්‍රදේශයේ ඇළ මාර්ග හැරීමේ හා පුනරුත්ථාපනය කිරීමේ කටයුතු
- මාලිගාවත්ත, ඇපල්වත්ත ප්‍රදේශය හා ඒ අවට ජලාපවහන කටයුතු වැඩි දියුණු කිරීම
- ලූනාව ඇළ පද්ධතියේ, වැවේ හා ඒ අවට හැරීම් හා පුනරුත්ථාපන කටයුතු
- වැව්, පොකුණු ඇති කිරීමෙන් හා පර්යන්ත ඇල මාර්ග හැරීමෙන් ජලය රඳා ගැනීමේ ධාරිතාවය වැඩි දියුණු කිරීම සඳහා ජලය රැඳවෙන ප්‍රදේශ සංරක්ෂණය හා වැඩි දියුණු කිරීම
- කොළඹ දිස්ත්‍රික්කය තුළ හා අවට ගංවතුර පාලන හා පිටාර ජලාපවහන ව්‍යාපෘති
- කොළඹ හා අවට විශාල හා කුඩා ප්‍රමාණයේ ඇල මාර්ග නඩත්තුව හා හැමිල්ටන් ඇල නඩත්තුව
- කොළඹ දිස්ත්‍රික්කය හා අවට විශේෂ ගංවතුර පාලන කටයුතු


කාක දූපත පොකුණ (පෙර)


කාක දූපත පොකුණ (පසු)


දියත උයනප්‍රදේශයේ සංවර්ධන කටයුතු


කිඹුලු වැව ප්‍රදේශයේ සංවර්ධන කටයුතු

## වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමණාකරණ දෙපාර්තමේන්තුව

2014 වසරේදී දෙපාර්තමේන්තුව විසින් වෙරළ ඛාදනයේ ක්ෂණික බලපෑම් අවම කිරීම, දීර්ඝ කාලීන වෙරළ සංරක්ෂණ විසඳුම් සැලසීම, වෙරළ තීරයේ කළමණාකරණ ක්‍රමවේද සම්පාදනය, වෙරළාශ්‍රිත විමර්ශණයන් කිරීම, වෙරළ රළ මිණුම් අධ්‍යානයන් කිරීම

මෙම දෙපාර්තමේන්තුව සඳහා වෙන් කරණ ලද සමස්ත ප්‍රතිපාදනය රුපියල් මිලියන 1402.9 ක් වන අතර, සමස්ත වියදම රුපියල් මිලියන 1094.2 කි. පෙන්නුම් කෙරෙණ සමස්ත ප්‍රගතිය සියයට 78 කි.


කටුනේරිය සමුද්‍රබාදන බැම්ම


මාරාවිල, වැලි පෝෂණ ක්‍රම


මාතර බ්‍රවුන් හිල් සංරක්ෂණය


වැල්ල මංකර සමුද්‍රබාදන බැම්ම

# 03
# පාර්ලිමේන්තු හා සිවිල් කටයුතු අංශය

## 3.1 සමාලෝචනය

පාර්ලිමේන්තු හා සිවිල් කටයුතු අංශය පහත දැක්වෙන ක්‍රියාකාරකම් සම්බන්ධ කටයුතුවල නියැලී සිටී.

- ත්‍රිවිධ හමුදාවෙහි විශේෂිත භට පිරිස් ස්ථානගත කිරීම් හා කඳවුරු ස්ථාපනය සඳහා අදාල ඉඩම් කටයුතු
- අමාත්‍යාංශයට අදාල පාර්ලිමේන්තු කටයුතු
- ත්‍රිවිධ හමුදා සාමාජිකයින් සඳහා නිල ඇඳුම් හා ඇඟලුම් රෙදි පිළි සැපයීම
- පොදු මහජනතාවගේ අභියාචනා සහ දුක් ගැනවිලි
- පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, රණවිරු සේවා අධිකාරිය සහ ජාතික අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය යන ආයතනවල සියළුම පාලක ආයතනික හා පරිපාලන කටයුතු අධීක්ෂණය
- අංශයේ අභ්‍යන්තරික පරිපාලන කටයුතු

## 3.2 2014 වසරේ මුදුන් පමුණුවා ගැනීම්

### 3.2.1 ත්‍රිවිධ හමුදාවෙහි විශේෂිත භට පිරිස් ස්ථානගත කිරීම් හා කඳවුරු ස්ථාපනය සඳහා අදාල ඉඩම් කටයුතු

- ත්‍රිවිධ හමුදාව ඔස්සේ ඉඩම් අනුයුක්ත කිරීම් / අත්පත් කර ගැනීම් යෝජනා ලබා ගැනීම
- අදාල ආයතන හා ප්‍රාදේශීය ලේකම්වරුන් හරහා නිර්දේශ හා නිරීක්ෂන ලබා ගැනීම
- අදාල ලේඛණ ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් හා ඉඩම් කොමසාරිස් ජෙනරාල් වෙත ඉදිරිපත් කිරීම
- මැනුම් කටයුතු සම්බන්ධීකරණය හා තක්සේරු වාර්තා ලබා ගැනීම
- වැදගත් තීරණ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම
- හිමිකම් සම්බන්ධයෙන් අවිනිශ්චිතභාවයක් මතුවන අවස්ථාවලදී සහ ඒ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුවිය යුතු අවස්ථාවලදී ක්ෂෙත්‍ර පරීක්ෂණ පැවැත්වීම
- ඉඩම් අනුයුක්ත කිරීම්/අත්පත් කර ගැනීම් වලදී මතුවන ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල රැස්වීම් සහ සාකච්ඡා
- මෙයට අමතරව, ත්‍රිවිධ හමුදා භාවිතයේ තිබූ ඉඩම් මුදා හැරීමේ ප්‍රතිඵලය ලෙස එකී ඉඩම් නීත්‍යානුකූල අයිතිකරුවන් වෙත නැවත භාරදීමට අදාල කටයුතු සිදුකරන ලදී.

### 3.2.2 පාර්ලිමේන්තු කටයුතු

#### 3.2.2.1 පාර්ලිමේන්තු ප්‍රශ්ණ

ආරක්ෂක අමාත්‍යවරයාගෙන් වාචික පිළිතුරු ලබා ගැනීමේ අපේක්ෂාවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රශ්ණ වලට, නියමිත කාල පරාසය තුළ අදාල අංශ වෙතින් අවශ්‍ය තොරතුරු ලබා ගැනීමෙන් පසු, භාෂාත්‍රයෙන් පිළිතුරු සැපයේ.

**3.1 වගුව : ප්‍රශ්ණවලට පිළිතුරු සැපයීම**

| වර්ෂය | ප්‍රශ්ණ සංඛ්‍යාව | පිළිතුරු සපයා ඇති ප්‍රශ්ණ සංඛ්‍යාව |
|---|---|---|
| 2014 | 47 | 47 |

#### 3.2.2.2 පාර්ලිමේන්තු උපදේශක කාරක සභා

2014.03.19 වන දින හා 2014.08.19 වන දින පාර්ලිමේන්තු උපදේශක කාරක සභා රැස්වීම් දෙකක් පවත්වා ඇත. මෙම අමාත්‍යාංශයට අදාලව, මහජනතාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් හරහා විමසන ලද ප්රශ්ණවලට පිළිතුරු සපයා ඇත. මෙම අමාත්‍යාංශයට අදාල පණත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රථම එකී පණත් සම්පාදනය හා සංශෝධයන් සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා මූලික පසුබිම් සකස් කෙරිණ.

**3.2 වගුව : ප්‍රශ්ණවලට පිළිතුරු සැපයීම**

| පවත්වන ලද කාරක සභා රැස්වීම් සංඛ්‍යාව | නගන ලද ප්‍රශ්ණ සංඛ්‍යාව | පිළිතුරු සපයන ලද ප්‍රශ්ණ සංඛ්‍යාව |
|---|---|---|
| 02 | 53 | 53 |

### 3.2.2.3 මහජන පෙත්සම් කාරක සභාව

ත්‍රිවිධ හමුදා සහ අමාත්‍යාංශය යටතට ගැනෙන දෙපාර්තමේන්තු හා ආයතන සම්බන්ධයෙන් පොදු ජනතාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් හරහා එවන ලද පෙත්සම්වලට පිළිතුරු ලබා දී ඇත. 2014 වසරේදී මහජන පෙත්සම් කාරක සභාව වෙත ඉදිරිපත් වූ පෙත්සම් 02 කට පිළිතුරු සපයා ඇත.

### 3.2.2.4 ස්ථාවර නියෝග හා පාර්ලිමේන්තුව කල් තබන අවස්ථාවේදී ඉදිරිපත් වූ ප්‍රශ්න

ආරක්ෂක අමාත්‍යවරයාගෙන් වාචික පිළිතුරු ලබා ගැනීමේ අපේක්ෂාවෙන්, පාර්ලිමේන්තුව කල් තබන අවස්ථාවේදී හා ස්ථාවර නියෝග සම්බන්ධයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රශ්න වලට, නියමිත කාල පරාසය තුළ අදාල අංශ වෙතින් අවශ්‍ය තොරතුරු ලබා ගැනීමෙන් පසු, භාෂාත්‍රයෙන් පිළිතුරු සැපයේ.

2014 වසරේදී, පාර්ලිමේන්තුව කල් තබන අවස්ථාවේදී ඉදිරිපත් වූ ප්‍රශ්න 08 කට සහ ස්ථාවර නියෝග 07 කට පිළිතුරු සපයා ඇත.

### 3.2.2.5 ත්‍රිවිධ හමුදා සඳහා නිල ඇඳුම් හා ඇඟලුම් රෙදිපිළි සැපයීමට අදාල කරුණු.

කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය හා සමග සම්බන්ධීකරණයෙන්, ටෙන්ඩර් පරිපාටියට අනුකූලව දේශීය නිෂ්පාදකයින්ගෙන් මිළ ගණන් කැඳවීමෙන් පසු, ත්‍රිවිධ හමුදාව, පොලිස් දෙපාර්තමේන්තුව, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව හා ජාතික ශිෂ්‍යභට බලකාය සඳහා ඇඟලුම් රෙදිපිළි මිළදී ගැනීමට අදාල කරුණු සම්බන්ධයෙන් කටයුතු කරන ලදී. මෙම ප්‍රතිපත්තිය රජය විසින් අනුගමනය කරනු ලබන්නේ දේශීය නිෂ්පාදකයින් දිරිමත් කිරීම සඳහාය. 2014 වසරේදී, රුපියල් මිලියන 1,397,834 ක් වටිනා ඇඟලුම් රෙදිපිළි දේශීය නිෂ්පාදකයින්ගෙන් මිළදී ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදී.

### 3.2.2.6 මහජනතාවගේ අභියාචනා සහ දුක් ගැනවිලි

මහජනතාව විසින් සෘජුවම මෙම අමාත්‍යාංශයට හා අග්‍රාමාත්‍ය කාර්යාලය හා වෙනත් රජයේ ආයතන හරහා ඉදිරිපත් කරණ ලද අභියාචනා හා දුක් ගැනවිලි සම්බන්ධයෙන් සහනය සලසාදීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලදී.

### 3.2.2.7 පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, රණවිරු සේවා අධිකාරිය සහ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය යන ආයතනවල සියළුම ආයතනික හා පරිපාලන කටයුතු අධීක්ෂණය

යථෝක්ත ආයතන සම්බන්ධයෙන් පහත දැක්වෙන කාර්යයන් ඉටු කරන ලදී.

- පරිපාලන කටයුතු අධීක්ෂණය
- වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අදාල කටයුතු සම්බන්ධීකරණය
- විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමට අදාල කටයුතු සම්බන්ධීරණය
- පොදු ව්‍යාපාර කාරක සභාවට අදාල කටයුතු
- සේවක සංඛ්‍යා කරුණු සඳහා අනුමැතිය ලබා ගැනීම
- මුල්‍ය ප්‍රතිපාදන පහසුකරවීම
- නව බඳවාගැනීම්, අනුයුක්ත කිරීම්, ස්ථාන මාරුවීම් හා විශ්‍රාම ගැනීම්
- ටෙන්ඩර් අනුමැති
- විදේශීය නිවාඩු අනුමත කිරීම
- උසස් කිරීම් සඳහා නිර්දේශ / අනුමැතිය

### 3.2.2.8 අංශයේ අභ්‍යන්තර පරිපාලන කටයුතු

අංශයේ නිලධාරින්ගේ සියලුම පරිපාලන, පුහුණු හා සුභ සාධන කටයුතු සක්‍රියව හා කාර්යක්ෂමව ඉටු කරන ලද අතර, නිලධාරින් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් වෙනුවෙන් දින දෙකක විනෝද චාරිකාවක් සංවිධානය කරන ලදී.

# 04
## පාලන අංශය

### 4.1 සමාලෝචනය

පාලන අංශය පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් වගකීම උසුලයි.

- අමාත්‍යාංශයේ සහ ඒ යටතේ **ගැනෙන** පහත දැක්වෙන ආයතනවල ආයතන, පරිපාලන හා නඩත්තු කටයුතු
- ඒකාබද්ධ සේවා, භාෂා අභ්‍යාස ආයතනය, මාධ්‍ය මධ්‍යස්ථානය හා රාජ්‍ය බුද්ධි සේවාව
- ආරක්ෂක මණ්ඩල ප්‍රධානී කාර්යාලය, සන්නද්ධ සේවා සහ පොලිස් සුභසාධන අංශය
- පහත දැක්වෙන ආයතනයන්හි සිවිල් නිලධාරින්ට අදාල ආයතන හා පරිපාලන කටයුතු.

  - ශ්‍රී ලංකා යුද හමුදාව
  - ශ්‍රී ලංකා නාවික හමුදාව
  - ශ්‍රී ලංකා ගුවන් හමුදාව
  - සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
  - පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය
  - ජාතික ශිෂ්‍යභට බලකාය
  - වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමණාකරණ දෙපාර්තමේන්තුව
  - ඒකාබද්ධ සේවා භාෂා පුහුණු ආයතනය
  - මාධ්‍ය මධ්‍යස්ථානය
  - රාජ්‍ය බුද්ධි අංශය
  - ආරක්ෂක ලේකම්ගේ නිල නිවස්නය

පහත දැක්වෙන ආයතනවල පරිපාලන, ප්‍රතිපත්ති තීරණ හා මූල්‍යමය කටයුතුවලට අදාල කරුණු පිළිබඳ වගකීම දරනු ලබන්නේ මෙම අංශයයි.

- 'අපි වෙනුවෙන් අපි' නිවාස ව්‍යාපෘතිය
- 'මිහිඳු සෙත් මැදුර' ව්‍යාපෘතිය

ප්‍රවාහන හා තැපැල් අංශය ඇතුළු අමාත්‍යාංශයේ අභ්‍යන්තර ශාඛාවන්ගේ සියළුම පරිපාලන කටයුතු සෘජුවම පරිපාලන අංශය යටතේ ලා ගැනේ.

### 4.1.1 පොදු පරිපාලනය

ප්‍රශස්ත කාර්යක්ෂමතාවයක් හා ඵලදායිත්වයක් සාක්ෂාත් කරගැනීම වස් හා අමාත්‍යාංශයේ නිලධාරින්ගේ ඒකල ඵලදායිත්වය හා උත්ප්‍රේරණය ප්‍රවර්ධනය කර ගැනීම වස්, රජයේ පුහුණු ආයතන විසින් පවත්වා ගෙන යනු ලබන විවිධ පාඨමාලා සඳහා මාණ්ඩලික නිලධාරින් හා සෙසු නිලධාරින් යොමු කිරීමට පියවර ගෙන ඇත.

### 4.1.2 නීති කටයුතු

පරිපාලන අංශය යටතේ ක්‍රියාත්මක වන නීති අංශය, ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත යටතේ නෛතිකමය කටයුතු, ආරක්ෂක අමාත්‍යාංශයට අදාලව ශ්‍රී ලංකා රජය හා වෙනත් රාජ්‍යයන් අතර ගිවිස ගැනීමට නියමිත ගිවිසුම් කෙටුම්පත් කිරීම සඳහා අවශ්‍ය නීති තොරතුරු ලබාදීම, ඉපලෝගම නිවාස ව්‍යාපෘතිය, රණවිරු රියල් ස්ටාර් වැනි විශේෂ ව්‍යාපෘති සඳහා වන ඔප්පු, ගිවිසුම් සම්පාදනය, අමාත්‍යාංශයට හා අනුබද්ධ ආයතනවලට අවශ්‍ය නීති උපදෙස් ලබා දීම, ආරක්ෂක අමාත්‍යාංශයට අදාල පණත් හා ආඥාපණත් සංශෝධනයේදී නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව හා සමග සම්බන්ධීකරණයෙන් අවශ්‍ය සහාය ලබාදීම යන කරුණු කාරණා සම්බන්ධයෙන් වගකීම දරයි.

### 4.1.3 ඉංජිනේරු කටයුතු

පරිපාලන අංශය යටතේ ලා **ගැනෙන** ඉංජිනේරු අංශය අමාත්‍යාංශයේ නඩත්තු කටයුතු හා 2014 වසරේදී අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවල අනුග්‍රහයෙන් කුලියාපිටියේදී පවත්වන ලද දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනයේ තැනීම කටයුතු අධීක්ෂණයේ වගකීම දරණ ලදී. අමාත්‍යාංශයීය සම්බන්ධීකරණ කටයුතු පරිපාලන අංශය විසින් ඉටු කෙරිණ. මෙම අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතන විසින් දළ වශයෙන් ප්‍රදර්ශණ කුටි 22 ක් පමණ ඉදිරිපත් කරණ ලද අතර, ඒවායේ වටිනාකම රුපියල් මිලියන 210 ක් පමණ විය.

අමාත්‍යාංශ පරිශ්‍රයේ පරිසර හිතකාමී වාතාවරණයක් ඇති කර ගැනීම සඳහා, ඉංජිනේරු ශාඛාව හා සම්බන්ධීකරණයෙන්, සුළු හා විශාල පරිමාණයේ අළුත්වැඩියාවන් ගණනාවක් ඉටු කර ගන්නා ලදී.

### 4.1.4 රණ විරු සුභසාධනය

#### 4.1.4.1 අපි වෙනුවෙන් අපි ව්‍යාපෘතිය

ව්‍යාපෘතියේ අභිප්‍රාය වන්නේ මියගිය, සේවයේ යෙදී සිටියදී අතුරුදහන් වූ සහ ආබාධිත තත්ත්වයට පත් රණ විරුවන් සහ දැනටත් සේවයේ නියැලි, මූල්‍යමය සහාය අවශ්‍ය රණවිරුවන් සඳහා නිවාස සපයා දීමයි. මෙම ව්‍යාපෘතිය 'අපි වෙනුවෙන් අපි' අරමුදල යටතේ ක්‍රියාත්මක අතර, මෙකී නිවාස ඉදි කිරීමේ කටයුතු ත්‍රිවිධ හමුදා සාමාජිකයින් විසින් ඉටු කරනු ලැබේ.

ව්‍යාපෘතියේ අරමුණු පහත දැක්වෙයි :

- සන්නද්ධ සේවාවල පුද්ගලයින් සඳහා නිවාස තැනීමේදී මුල්‍යමය සහාය ලබාදීම සඳහා යෝජනා ක්‍රම ඉදිරිපත් කිරීම.
- නිවාස පහසුකම් ලබාගැනීම සඳහා සන්නද්ධ සේවා වල සමාජිකයින්ට අධාර ප්‍රදානය කිරීම.
- මුල්‍ය ආයතන වලින් ණය ලබාගැනීමේදී සහ එකී ණය ආපසු ගෙවීමේදි රණවිරුවන්ට සහය වීම සඳහා අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම
- හදිසි මරණයකදී හෝ තුවාල වූ අවස්ථාවකදී රණවිරුවන් විසින් ලබාගෙන ඇති ණය සමතයකට පත් කිරීමට අවශ්‍ය යෝජනා ක්‍රම සම්පාදනය කිරීම.

### 4.1.4.2 රණවිරුවන්ගේ ජීවන තත්ත්වය නගාලීම සඳහා වූ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, ත්‍රිවිධ හමුදාවල සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මියගිය හා ආබාධිත තත්ත්වයට පත් රණවිරුවන්ගේ සමීපතම ඥාතීන්ට නිවාස ණය ලබාදීම, ශිෂ්‍යත්ව ලබාදීම සහ සුභසාධන කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා බෙහෙවින් ඉවහල් විය.

### 4.1.4.3 අඩක් නිම කරන ලද රණවිරු නිවාස යෝජනා ක්‍රමය

තෝරාගත් රණවිරුවන්ගේ අඩක් නිම කරන ලද නිවාස සම්පූර්ණ කිරීම, ඔවුන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සහ රටෙහි සංවර්ධන ඉලක්ක සපුරාලීම සඳහා රුපියල් මිලියන0.75 ක උපරිම සීමාවකට යටත්ව, අවශ්‍ය ඉංජිනේරු මෙවලම් ලබා දෙන ලදී. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරණ ලද්දේ, ත්‍රිවිධ හමුදාවන්හි සම්බන්ධීකරණය හා අධීක්ෂණය සහිතව, ආරක්ෂක අමාත්‍යාංශයේ සේවා වනිතා ඒකකයේ අධීක්ෂණය යටතේය. ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මුල්‍ය ප්‍රතිපාදන ශ්‍රී ලංකා රජය විසින් සලසා දෙනු ලැබිණ.

**4.1 වගුව : රණවිරුවන්ගේ ජීවන තත්ත්වය නගාලීම සඳහා වූ ව්‍යාපෘතියේ ප්‍රතිලාභින්ගේ සංඛ්‍යාව**

| අදාල සන්නද්ධ හමුදාව | පියවර - 1 | පියවර -2 |
|---|---|---|
| යුද හමුදාව | 296 | 198 |
| නාවික හමුදාව | 47 | 74 |
| | | |
| ගුවන් හමුදාව | 27 | 50 |
| එකතුව | 370 | 322 |

**4.2 වගුව : රණවිරුවන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීමේ ව්‍යාපෘතිය**

| | |
|---|---|
| නිවාස ණය ලබා දීම | 165 |
| ශිෂ්‍යත්ව ලබා දීම | 325 |
| සුභසාධන කටයුතු සම්පාදනය | 37 |

**4.3 වගුව : 2014 වසරට අදාල ප්‍රගතිය**

| වගකීම | ක්‍රියාකාරකම | ප්‍රගතිය | | |
|---|---|---|---|---|
| සක්‍රියත්වය වැඩිදියුණු කිරීම | පරිගණක මගින් ලිපි බෙදීම | ලියා.තැපැල | අතින් භාරදීම | තැපෑලෙන් යැවීම |
| | | 15000 | 20000 | 30000 |
| | පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීන කිරීම | ලිපිගොනු 320 ක් සම්පූර්ණ කරණ ලදී. | | |
| | ප්‍රමාදයකින් තොරව ගෙවීම් සමථයට පත් කිරීම - ගෙවීම් සඳහා අනුමැතිය ලබා දීම | පරිපාලන අංශය | ප්‍රවාහන අංශය | |
| | | 282 | 257 | |
| නිවැරදි තීරණ වලට එළැඹීම සඳහා කළමණාකාරීත්ව ක්‍රමවේද සකස් කිරීම හා යාවත්කාලීන කිරීම | මානව සම්පත් කළමණාකරණය | | | |
| | නව පත්වීම් | 35 | | |
| | විශ්‍රාම යෑම් | 16 | | |
| | උසස්වීම් | 20 | | |
| | වැටුප් වැඩිවීම් | 330 | | |
| | වත්කම් කළමණාකරණ ක්‍රමවේද - වත්කම් අලුත් කිරීම හා නඩත්තුවට අදාල වාර්තා කරණය | - | | |
| | වාහන නඩත්තු ක්‍රමවේද (වාහන අත්පත් කර ගැනීම, අළුත් කිරීම, විකිණීම හා කුළියට දීම | අළුත්වැඩියා කරන ලද වාහන සංඛ්‍යාව - 28 | | |
| දැනුම් හා කුසලතා ආශ්‍රයෙන් මානව සම්පත් වඩාත් සඵල කරවීම | පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සහ පහසුකම් සැලසීම | වැඩ සටහන් 60 | සහභාගීත්වය 150 | |
| | වැඩ මුළු | 3 | 200 | |
| | සුහසාධන ක්‍රියාකාරකම් සංවිධානය | 5 | 2500 | |
| | | 60 දෙනෙකු පුහුණු කරවන ලදී | | |
| නීති උපදෙස් ලබා දීම | ත්‍රිවිධ හමුදාවන්ට සහ අනුබද්ධිත ආයතන වෙත නීති සහාය ලබාදීම | 06 | | |
| | ගිවිසුම් කෙටුම්පත් කිරීම හා සංශෝධනය | 06 | | |
| | නව රැඳවුම් මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම | - | | |
| | ගැසට් නිවේදන ප්‍රකාශයට පත් කිරීම | 03 | | |
| | හදිසි රෙගුලාසි සංශෝධනය | - | | |

## අපි වෙනුවෙන් අපි ව්‍යාපෘතිය

'අපි වෙනුවෙන් අපි' අරමුදලින් ලත් මුල්‍ය ප්‍රතිපාදන යටතේ දිස්ත්‍රික්ක තුනක රණවිරුවන් සඳහා නිවාස 330 ක් ඉදි කරන ලද අතර, මෙම නිවාස පහත දැක්වෙන පරිදි අතිගරු ජනාධිපතිතුමන් විසින් බෙදා දෙන ලදී.

| 4.4 වගුව : රණවිරුවන් අතර නිවාස බෙදා දීම | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දිස්ත්‍රික්කය | සපයන ලද දිනය | අදාල සන්නද්ධ හමුදාව | | | | | | | | | | | | මුළු එකතුව |
| | | යුද හමුදාව | | | | නාවික හමුදාව | | | | ගුවන් හමුදාව | | | | |
| | | මියගිය | ආබාධිත | සේවයේ නියුතු | එකතුව | මියගිය | ආබාධිත | සේවයේ නියුතු | එකතුව | මියගිය | ආබාධිත | සේවයේ නියුතු | එකතුව | |
| කුරුණෑගල - 11 | 25.04.2014 | 10 | 28 | 45 | 83 | - | 2 | 25 | 27 | 2 | 1 | 12 | 15 | 125 |
| අනුරාධපුරය | 05.07.2014 | 7 | 8 | 53 | 68 | 1 | 2 | 20 | 23 | - | 1 | 12 | 13 | 104 |
| පුත්තලම | 01.11.2014 | 6 | 16 | 41 | 63 | - | - | 22 | 22 | - | - | 16 | 16 | 101 |
| **එකතුව** | | **23** | **52** | **139** | **214** | **1** | **4** | **67** | **72** | **2** | **2** | **40** | **44** | **330** |

ඉහත සඳහන් සංඛ්‍යාවන්ට අමතරව, ත්‍රිවිධ හමුදාවල සහාය ඇතිව වෙනත් දිස්ත්‍රික්කවල පහත දැක්වෙන ඉදි කිරීම් ක්‍රියාත්මක කර ඇත.

මහනුවර - පියවර 11 - 100
හම්බන්තොට - පියවර 11 - 100

මාතර - පියවර 11 - 100
ගාල්ල - පියවර 11 - 100








## 4.2 ගැටළු සහ අභියෝග

- අමාත්‍යාංශයේ සේවකයින්ගේ දත්ත ගබඩා යාවත්කාලීන කිරීම සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලයට පුහුණුව ලබාදීම සඳහා අදාල ඒජන්තවරුන්ගේ තාක්ෂණික සහාය ලබා ගැනීම. 2013 වර්ෂයේදී සේවකයින්ගේ දත්ත ගබඩාව සැකසීම සඳහා ප්‍රමාණවත් මුල්‍ය ප්‍රතිපාදන නොමැතිවීම නිසා ප්‍රමාදයට පත් 2014 දෙවන කාර්තුවේ දත්ත සම්පාදනය සඳහා පරිගණක සර්වරයක් ලබා ගැනීම.

- ඉලක්ක හා අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස කාර්යක්ෂම සේවයක පල නෙලා ගැනීම සඳහා අමාත්‍යාංශයේ අදාල ආයතනවලට කාර්ය මණ්ඩල ලබාදීමට පැවැති නොහැකියාව.

## 4.3 අනාගත අපේක්ෂා

- අමාත්‍යාංශයීය කාර්ය මණ්ඩලයට අවශ්‍ය පුහුණු වැඩසටහන් හඳුනා ගෙන අදාල පාඨමාලාවන් සංවිධානය කිරීම

- ශ්‍රී ලංකා සංවර්ධන හා පරිපාලන ආයතනය විසින් සංවිධානය කරනු ලබන පුහුණු වැඩ සටහන්වලට සහභාගීවීම සඳහා කාර්ය මණ්ඩලය දිරිමත් කිරීම

- රණවිරුවන් සඳහා සුභසාධන පහසුකම් සැපයීමට අවශ්‍ය පියවර ගැනීම

- අයවැය යෝජනා මගින් වෙන් කර ඇති රුපියල් මිලියන 1000 ක ප්‍රතිපාදන ප්‍රයෝජනයට ගනිමින් ඉදිරි වර්ෂයේදී රණවිරුවන් 2000 කට වැඩි සංඛ්‍යාවකට නිවාස ලබාදීමට අපේක්ෂිතය.

# 5
# සිවිල් ආරක්ෂක හා සංවර්ධන අංශය

## 5.1 සමාලෝචනය

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය, ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය, ආරක්ෂක සේවා විද්‍යාලය, රණවිරු සේවා අධිකාරිය සහ ඒකාබද්ධ සේවා භාෂා පුහුණු මධ්‍යස්ථානය යන ආයතනවල ආයතනික හා පරිපාලන කටයුතු මෙම අංශය විසින් ක්‍රියාත්මක කෙරේ. රණවිරුවන්ගේ දරුවන් ජාතික හා ජනප්‍රිය පාසල්වලට ඇතුලත් කිරීම, මානව සම්පත් ආරක්ෂා කිරීමේ ජාතික සැලසුම් සංවර්ධන ක්‍රියාදාමය සහ බිම් බෝම්බ ඉවත් කිරීමේ ජාතික සැලැස්මට අදාල කටයුතු මෙම අංශය විසින් ඉටු කරනු ලබන අනෙකුත් රාජකාරි යටතේ ගැනේ.

## 5.2 2014 වසරේ මුදුන්පමුණුවා ගැනීම්

### 5.2.1 ජනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනික/පුහුණු සහ සංවර්ධන ක්‍රියාකාරකම් කර ගෙන යාම සඳහා අදාල උපදෙස් ලබාදීම සහ පරිපාලන කටයුතු සඳහා පහසුකම් සැලසීම

එකී ආයතනයේ අදාල අණපණත් සංශෝධන හා සම්පාදනය

එකී ආයතනය විසින් පවත්වනු ලබන ශාස්ත්‍රපති උපාධි, සාමාන්‍ය උපාධි සහ භාෂා පුහුණු වැඩ සටහන් වලට අදාල පරිපාලන හා කාර්ය දාම අධීක්ෂණය.

- කැඩෙට් නිලධාරින් බඳවා ගැනීම සඳහා පරිපාලන හා මුල්‍යමය පහසුකම් සැලසීම
- හමුදා නිලධාරින් ජාත්‍යන්තර වශයෙන් බඳවා ගැනීම සම්බන්ධයෙන් විදේශීය රටවල් හා සමඟ සහසම්බන්ධතාවයෙන් කටයුතු කිරීම
- ප්‍රධානතම ඉසව් ( උපාධි පිරිනැමීම, අධ්‍යයන චාරිකා, අනාවරණ සංචාර වලට අදාල පරිපාලනමය උපදෙස් හා පහසුකම් සැලසීම, කැඩෙට් නිලධාරින් / සිවිල් ශිෂ්‍යයින් බඳවා ගැනීම
- කාර්ය මණ්ඩල බඳවා ගැනීම
- ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ ආරෝග්‍යශාලාව ස්ථාපිත කිරීම
- විශ්ව විද්‍යාලයීය මුද්‍රණාලය ස්ථාපිත කිරීම
- 
- කැඩෙට් නිලධාරින් සඳහා නේවාසික පහසුකම් වැඩි දියුණු කිරීම
- විශ්ව විද්‍යාලයේ දකුණු සරසවි මණ්ඩපය ස්ථාපිත කිරීම
- උපාධි අධ්‍යයන පීඨය සඳහා ගොඩනැගිල්ලක් ඉදි කිරීම
- ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂා විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු උපාධිය සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ පිළිගැනීම ලබා ගැනීම

විවිධ ක්‍රියාකාරකම් ( විදේශ නිවාඩු, ඉඩම් අත්පත් කර ගැනීම, නිලධාරින්ගේ දුක් ගැනවිලි, කථිකාචාර්යවරුන්/ උපදේශකයින් බඳවා ගැනීම, අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීම, අධ්‍යයන පරිපාටි කටයුතු, විදේශීය භාෂා පුහුණුව) සම්බන්ධයෙන් පරිපාලනමය උපදෙස් හා අනුමැති.

### 5.2.2 ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය

ආරක්ෂක සේවා කාර්ය මණ්ඩල විද්‍යාලය විසින් පවත්වනු ලබන වැඩ සටහන්වලට අදාල පරිපාලනමය හා ක්‍රියාකාරිත්ව අධීක්ෂණය.

### 5.2.3 ඒකාබද්ධ සේවා භාෂා හා පුහුණු ආයතනය

ඒකාබද්ධ සේවා භාෂා හා පුහුණු ආයතනය විසින් පවත්වනු ලබන වැඩ සටහන්වලට අදාල පරිපාලනමය හා ක්‍රියාකාරිත්ව අධීක්ෂණය.

අධ්‍යාපනික සහ සංවර්ධන ක්‍රියාකාරකම් කර ගෙන යාම සඳහා අදාල උපදෙස් ලබාදීම සහ පරිපාලන කටයුතු සඳහා පහසුකම් සැලසීම.

### 5.2.4 ජාතික මිනිස් ජාවාරම් විරෝධී කාර්යසාධන බලකාය රැස්වීම

ජාතික මිනිස් අයිතිවාසිකම් සැලසුමට අදාල ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම.

### 5.2.5 2014 වසරේදී, ත්‍රිවිධ හමුදා හා පොලිස් සේවයට අදාල පාසල්වලට ඇතුළත් කර ගැනීම

පළමුවන ශ්‍රෙණියේ සිසුන් පාසල්වලට ඇතුළත් කර ගැනීම. පළමුවන ශ්‍රෙණියේ සිසුන් පාසල්වලට ඇතුළත් කර ගැනීමට අදාල දුක්ගැනවිලි සම්බන්ධයෙන් ක්‍රියා කිරීම.

### 5.2.6 2014 වසරේදී සපුරා ගත නොහැකි වූ ඉලක්ක සහ 2015 ඉදිරි වසරට කල් දැමූ වැඩ

- **ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය**

විශ්ව විද්‍යාලයීය අණ පනත් සම්පාදනය හා සංශෝධනය

උපාධිධාරි අධ්‍යයන මණ්ඩප ගොඩනැගිලි ඉදි කිරීම

2014 වසරේදී ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව - 17 යි.

නිකුත් කරන ලද වීසා සංඛ්‍යාව

චීන - 310

කැඩෙට් නිලධාරින් - 118

කොතලාවල ආරක්ෂක
විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය- 10

- **ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය**

අරමුදල් හිඟය හේතුවෙන් ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු 2015 ඉදිරි වසර දක්වා කල් දමන ලදී. ව්‍යාපෘතියේ සමස්ත ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 20.4 කි.

2014 වසරේදී ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව 02 කි.

ආරක්ෂක සේවා විද්‍යාලය - කොළඹ / කුරුණෑගල

2014 වසරේදී ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව 01 කි.

2014 වසරේදී පාසල්වලට සිසුන් ඇතුළත් කර ගැනිම - ත්‍රිවිධ හමුදා සහ පොලිසිය.

**5.1. වගුව : 2014 වසරේදී සිසුන් බඳවා ගැනීම්**

| සංවිධානය | සිසුන් සංඛ්‍යාව |
|---|---|
| යුද හමුදාව | 5,477 |
| නාවික හමුදාව | 1,774 |
| ගුවන් හමුදාව | 1,316 |
| පොලිසිය | 2,689 |
| **එකතුව** | **11,256** |

**ජාතික මිනිස් ජාවාරම් විරෝධී කාර්ය සාධන බලකාය රැස්වීම**

- 2014 වසරේදී පවත්වන ලද ජාතික මිනිස් ජාවාරම් විරෝධී කාර්ය සාධන බලකාය රැස්වීම් සංඛ්‍යාව 12 කි.

### 5.3 ගැටළු සහ අභියෝග

- කළමණාකාර සහකාර හිඟය
- කාර්ය මණ්ඩල සාමාජිකයින් (දේශීය / විදේශීය) සඳහා පුහුණුවීමේ අවස්ථා
- තොරතුරු තාක්ෂණ පහසුකම්

# 06


# මුදල් අංශය


## 6.1 සමාලෝචනය

මුදල් අංශයේ ප්‍රධානතම කාර්ය භාරයන් වන්නේ :

- වාර්ෂික අයවැය ඇස්තමේන්තු සහ අතිරේක ඇස්තමේන්තු සකස් කිරීම
- වාර්ෂික අග්‍රිම අවශ්‍යතා මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම, භාණ්ඩාගාරයෙන් මාසිකව අග්‍රිම ලබා ගැනීම සහ ගිණුම් අංශවලට අග්‍රිම මුදා හැරීම
- මාසික සාරාංශ වාර්තා සකස් කිරීම හා මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම අමාතයාංශයීය ගිණුම් මහා භාණ්ඩාගාර ගිණුම් හා සැසදීම
- විසර්ජන ගිණුම සැකසීම
- පුපුරණ ද්‍රව්‍ය හා ගිනි අවි බලපත්‍ර වල ආදායම් ගිණුම් සැකසීම ( 1003/07/05 ශීර්ෂය)
- අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවල නිල බැංකු ගිණුම් විවෘත කිරීම, වැසීම හා සංශෝධන සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය හා බැංකු සමග අදහස් හුවමාරුව
- ප්‍රාග්ධන මිළදීගැනීම් සඳහා ගෙවීම්
- ප්‍රතිපාදන මුදා හැරීම, අතිරේක ප්‍රතිපාදන ඉල්ලා සිටීම හා මුදල් ප්‍රතිපාදන අමාත්‍යාංශයට හා ඒ යටතේ ඇති ආයතනවලට මාරු කිරීම
- ජාතික ආරක්ෂක අරමුදලට අදාල කාර්යයන් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම
- 2014 වසරේදී, පහත දැක්වෙන සංවර්ධන ක්‍රියාකාරකම්වල මූල්‍යමය කළමණාකරණයට අදාල කටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කිරීම
  - කොළඹ අගනගරය ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය
  - මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය
  - මහ කොළඹ ගංවතුර වැළැක්වීමේ හා පාරිසරික සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය
  - ආරක්ෂක මූලස්ථාන ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු

## 6.2 2014 වසරේ මුදුන් පමුණුවා ගැනීම්





**6.1 වගුව : 2014 වසරේ ආරක්ෂක අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රගතිය**

| | | | රුපියල් මිලියන |
|---|---|---|---|
| වියදම | ඇස්තමේන්තුව | සත්‍ය | ප්‍රතිශතය |
| ප්‍රාග්ධන | 20,273.33 | 14,201.54 | 70 |
| පුනරාවර්තන | 5,372.86 | 5,313.56 | 99 |
| එකතුව | 25,646.19 | 19,515.10 | 76 |

6.3 ප්‍රස්තාරය : පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම්




**6.2** වගුව : **2014** වසරේ ආරක්ෂක අමාත්‍යාංශයේ ව්‍යාපෘතිවල වියදම් වාර්තාව

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | රුපියල් මිලියන | |
| ව්‍යාපෘතිය/වැඩ සටහන | **2014** ඇස්තමේන්තුගත | | සත්‍ය වියදම | | | |
| මෙහෙයුම් වැඩ සටහන් | ප්‍රාග්ධන | පුනරාවර්තන | ප්‍රාග්ධන | % | පුනරාවර්තන | % |
| **1.** අමාත්‍ය කාර්යාලය | 1.00 | 6.68 | 0.08 | 8 | 3.43 | 51 |
| **2.** පරිපාලන හා ආයතන සේවය | 3.270.40 | 3,092.76 | 3,232.66 | 99 | 3,060.43 | 99 |
| **3.** රාජ්‍ය බුද්ධි සේවය | 113.95 | 948.14 | 56.03 | 49 | 938.21 | 99 |
| **4.**ජාතික ශිෂ්‍යභට බලකාය | 53.92 | 259.14 | 29.63 | 55 | 252.94 | 98 |
| **5.** පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය | 28.70 | 10.83 | 27 | 94 | 9.57 | 88 |
| **6.** මාධ්‍ය මධ්‍යස්ථානය | 5.58 | 13.20 | 3.18 | 57 | 11.04 | 84 |
| **7.** ඒකාබද්ධ මෙහෙයුම් මූලස්ථානය | 7.64 | 97.92 | 6.86 | 90 | 94.66 | 97 |
| **8.** යටිතල පහසුකම් සංවර්ධනය | 16,792.14 | 944.19 | 10,846.02 | 64 | 943.27 | 99 |
| එකතුව | **20,273.33** | **5,372.86** | **14,201.46** | **70** | **5,313.55** | **99** |

## 6.3. වගුව : විසර්ජන ගිණුමෙහි ලා පෞද්ගලික පඩිනඩි,වෙනත් පුනරාවර්තන හා ප්‍රාග්ධන බාණ්ඩයන් යටතේ සලසා ඇති ප්‍රතිපාදන එල්ලෙහි වියදම

| | | පුනරාවර්තන වියදම් | | | | | | ප්‍රාග්ධන වියදම් | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති අංකය | ව්‍යාපෘතිය/ වැඩසටහන | පෞද්ගලික පඩිනඩි | | වෙනත් | | එකතුව | | ප්‍රාග්ධන වත්කම් පුනරුත්තාපනය වැඩි දියුණු කිරීම | | ස්ථිර වත්කම් අත්පත් කරගැනීම | | මානව සම්පත් සංවර්ධනය | | වෙනත් | | එකතුව | |
| | මෙහෙයුම් වැඩසටහන | ප්‍රතිපාදන | වියදම | ප්‍රතිපාදන | වියදම | ප්‍රතිපාදන | වියදම | ප්‍රතිපාදන | වියදම | ප්‍රතිපාදන | වියදම | ප්‍රතිපාදන | වියදම | ප්‍රතිපාදන | වියදම | ප්‍රතිපාදන | වියදම |
| 1 | අමාත්‍ය කාර්යාලය | 2.4 | 1.92 | 4.28 | 1.51 | 6.68 | 3.43 | 0.70 | - | 0.30 | 0.08 | - | - | - | - | 1 | 0.08 |
| 2 | පරිපාලන හා ආයතන සේවා | 176.2 | 172.04 | 2,916.56 | 2,888.40 | 3,092.76 | 3,060.43 | 15.35 | 9.09 | 13.05 | 9.74 | 2 | 1.56 | 3,240 | 3,212.27 | 3,270 | 3,232.66 |
| 3 | රාජ්‍ය බුද්ධි සේවා | 616.53 | 616.22 | 331.61 | 321.99 | 948.14 | 938.21 | 10.85 | 10.15 | 102.10 | 45.47 | 1 | 0.42 | - | - | 114 | 56.03 |
| 4 | ජා.ශිෂ්‍ය භට බලකාය | 101.76 | 101.60 | 157.38 | 151.33 | 259.14 | 252.94 | 21.13 | 18.24 | 32.79 | 11.39 | - | - | - | - | 54 | 29.63 |
| 5 | පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථා: | - | - | 10.83 | 9.57 | 10.83 | 9.57 | 1.60 | 1.39 | 16.10 | 15.39 | 1 | 0.78 | 10 | 9.51 | 29 | 27 |
| 6 | මාධ්‍ය මධ්‍යස්ථානය | 1.7 | 0.70 | 11.50 | 10.34 | 13.20 | 11.04 | 4.75 | 2.46 | 0.80 | 0.69 | 0.03 | 0.03 | - | - | 6 | 3.18 |
| 7 | ඒකාබද්ධ මෙහෙයුම් | - | - | 97.92 | 94.66 | 97.92 | 94.66 | 0.86 | 0.38 | 3.38 | 3.21 | 3.40 | 3.28 | - | - | 8 | 6.86 |
| 8 | යටිතල ව්‍යූහ සංවර්ධනය | - | - | 944.19 | 943.27 | 944.19 | 943.27 | 16,792.14 | 10,846.02 | - | - | - | - | - | - | 16,792.14 | 10,846.02 |
| | | | | | එකතුව | 5,372.86 | 5,313.56 | | | | | | | | එකතුව | 20,273.33 | 14,201.54 |
| | | | | | | | | | | | | | | | | | |
| | 2014 වසරේ අතිරේක ප්‍රතිපාදන හා මුගරෙග 68/69 මාරු කිරීම් ඇතුළත්ය. | | | | | | | | | | | | | | | | |
| | වියදම | | | | | | | | | | | | | | | | |
| | ගැති - සැපයීම | | | | | | | | | | | | | | | | |

# 07

# අභ්‍යන්තර විගණන අංශය

## 7.1 සමාලෝචනය

ශ්‍රී ලංකාවේ ස්වාධිපත්‍යය හා භෞමික සීමාවන් යටතේ අඛණ්ඩව පවත්නා නීතිය, සාමය හා ආරක්ෂාවට අදාලව අත්‍යාවශ්‍ය ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම හා සැපයීම

## 7.2 2014 වසරේ මුදුන්පමුණුවා ගැනීම්

**7.1 වගුව : 2014 වසරේදී අභ්‍යන්තර විගණන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම**

| ආයතනය/ව්‍යාපෘතිය | ක්ෂේත්‍රය | අභ්‍යන්තර විගණනන විමසුම් සංඛ්‍යාව |
|---|---|---|
| ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය | සැපයුම් අංශය<br>වැය ලෙජර<br>ප්‍රවාහන අංශය<br>පාලන අංශය<br>වැටුප් අංශය<br>ගෙවීම් අංශය<br>ගෙවීම් වවුචර | 02<br>01<br>01<br>02<br>01<br>01<br>01 |
| කොළඹ අගනගරය ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය | ප්‍රසම්පාදනය<br>ඉදි කිරීම් | 01<br>01 |
| ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව | ආරක්ෂක අමාත්‍යාංශයීය ප්‍රතිපාදන භාවිතය | 01 |
| ආරක්ෂක අමාත්‍යාංශයීය හා ත්‍රිවිධ හමුදා මූලස්ථාන ඉදිකිරීම් ව්‍යාපෘතිය | ප්‍රසම්පාදනය<br>හානි | 02<br>01 |
| ජාතික ශිෂ්‍යභට බලකාය | දූෂණ හා විෂමතා<br>ප්‍රසම්පාදනය | 01<br>01 |
| ආරක්ෂක සේවා විද්‍යාලය (කොම්පඤ්ඤවීදිය) | වාර්ෂික ගිණුම් | 01 |
| ආරක්ෂක සේවා විද්‍යාලය(කුරුණෑගල) | ඉදිකිරීම් | 01 |
| සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව | වැටුප් අංශය<br>ව්‍යාපෘති | 01<br>01 |
| ජාතික අන්තරායකර ඖෂධ පාලන මණ්ඩලය | ප්‍රසම්පාදන, ගිණුම්,ප්‍රවාහන හා පාලන | 01 |
| පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | ඉ-ජාතික හැඳුණුම්පත් ව්‍යාපෘතිය | 01 |
| ශ්‍රී ලංකා යුද හමුදාව | බැංකු සැසඳුම් | 01 |
| ශ්‍රී ලංකා ගුවන් හමුදාව | ගබඩා සමීක්ෂණ | 01 |
| ශ්‍රී ලංකා නාවික හමුදාව | සිවිල් සුභසාධන සමිතියේ මුදල් අවභාවිතය (ත්‍රිකුණාමල කඳවුර) | 01 |
| ත්‍රිවිධ හමුදා භාෂා පුහුණු මධ්‍යස්ථානය කොත්මලේ | ඉදිකිරීම් හා ප්‍රසම්පාදනය | 01 |
| ජාතික ශිෂ්‍යභට බලකාය (රන්ටැඹේ අභ්‍යාස පාසල) | ඉදිකිරීම් හා ප්‍රසම්පාදනය | 01 |
| රක්නා ආරක්ෂක ලංකා ලිමිටඩ් | මුදල් ශේෂ සමීක්ෂණය | 03 |
| 'සඳහිරු සෑය' ඉදිකිරීම් ව්‍යාපෘතිය | - අවසරපත් නිකුත් කිරීමේ ක්‍රියාදාමය<br>- ප්‍රසම්පාදනය හා වියදම් | 01<br>01 |

2014 වසරේදී පහත දැක්වෙන පරිදි විගණන හා කළමණාකරණ කමිටු 04 ක් සංවිධානය කෙරිණ.

- 2014.02. - විගණන හා කළමණාකරණ කමිටුව ( අමාත්‍යාංශයීය ව්‍යාපෘති)
- 2014.05.20 - විගණන හා කළමණාකරණ කමිටුව (දෙපාර්තමේන්තු හා වෙනත් ආයතන)
- 2014.03.20 - විගණන හා කළමණාකරණ කමිටුව (අමාත්‍යාංශයීය ව්‍යාපෘති)
- 2014.09.20 - විගණන හා කළමණාකරණ කමිටුව (අමාත්‍යාංශයීය ව්‍යාපෘති)

**7.2 වගුව : ත්‍රිවිධ හමුදාවල බැහැර කිරීම් මණ්ඩලවල සහභාගිත්වය**

| ආයතනය | මණ්ඩල සංඛ්‍යාව |
|---|---|
| යුද හමුදාව | 14 |
| ගුවන් හමුදාව | 06 |
| නාවික හමුදාව | 10 |

## 7.3 2014 වසරේ ක්‍රියාකාරකම් වල විග්‍රහය/ඇගයීම

සියළුම වැදගත් විගණන නිරීක්ෂණ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කර ඇත. අමාත්‍යාංශය යටතේ ඇති අදාල දෙපාර්තමේන්තු, ආයතන හා අංශ ප්‍රධානීන්ට අවශ්‍ය උපදෙස් නිකුත් කරන ලදී.

## 7.4 ගැටළු හා අභියෝග

තොරතුරු ලබා ගැනීමේ දුෂ්කරතාවය

## 7.5 අනාගත අපේක්ෂා

සංවිධානය වැඩිදියුණු කිරීම සඳහා මධ්‍ය කාලීනව (2016-2018) ක්‍රියාත්මක කළයුතු ක්‍රියාකාරකම්

- කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම පිණිස විගණන නිලධාරීන් සඳහා පුහුණුවීම් අවස්ථා සංවිධානය කිරීම
- නව විගණන ප්‍රමිතීන්, ගිණුම්ගත කිරීමේ ප්‍රමිතීන් හා විගණන කලාවන් හඳුන්වා දීම
- සෑම විගණනයකින්ම පසු, විගණන නිරීක්ෂණ සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලය හා සමඟ සාකච්ඡා පැවැත්වීම
- නාස්තිය, ප්‍රමාද දෝෂ හා වංචා අවම කිරීම සඳහා උපදෙස් නිකුත් කිරීම
- අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් සවිමත් කිරීම සඳහා නිර්දේශ.

# 08
# සන්නද්ධ හමුදා සුභසාධන අංශය

## 8.1 සමාලෝචනය

ශ්‍රී ලංකාවේ ස්වාධිපත්‍යය හා භෞමික අඛණ්ඩතාවය රැක ගැනීමෙහි ලා ආරක්ෂක සේවාවන්හි විශාල පිරිසක් ජීවිත පරිත්‍යාග කර ඇති අතර, තවත් බොහෝ දෙනෙකු ක්‍රියාන්විත සේවයේදී ලත් තුවාල හේතුවෙන් ආබාධිත තත්ත්වයට පත්ව ඇත. දැනට සේවයේ නියැලී සිටින්නාවූ පිරිසේ මානසික ධෛර්යය නගා සිටුවීම සඳහා, ආබාධිත රණවිරුවන්ගේ මෙන්ම ජීවිත පරිත්‍යාග කළ රණවිරුවන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ සුභසාධනය තහවුරු කිරීම අරමුණු කොටගත් වැඩ සටහන් ක්‍රියාත්මක කළයුතු වෙයි.

**අංශයෙහි අරමුණු වන්නේ:**

- දැනට සේවයේ නියැලී සිටින හා යුද සමයේදී ජීවිත පරිත්‍යාග කළ රණවිරුවන් සඳහා නිවාස තනා ගැනීමට ඉඩම් බෙදාදීමට පියවර ගැනීම.
- රණවිරුවන්ගේ දරුවන්ගේ උසස් අධ්‍යාපනය සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීමට වැඩ සටහන් ආරම්භ කිරීම.
- රණවිරුවන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ දුක් ගැනවිලි සම්බන්ධයෙන් කඩිනම් පියවර ගැනීම.
- රණවිරුවන්ගේ කාලත්‍රයින් සඳහා ස්ථාන මාරුවීම් ලබාගැනීමට පහසුකම් සැලසීම.
- රණවිරුවන්ගේ ඉඩම්/නිවාස සඳහා මාර්ග, විදුලිබලය සහ ජලය වැනි යටිතල පහසුකම් සැපයීම.

## 8.2 2014 වසරේදී මුදුන්පමුණුවා ගැනීම්

| ක්‍රියාකාරකම | සමස්ත පිරිවැය- රුපි.මිලියන | මූල්‍යමය ප්‍රගතිය % | භෞතිකමය ප්‍රගතිය % |
|---|---|---|---|
| රණවිරුවන් සඳහා කොට්ඨාශ මට්ටමින් ඉඩම් ලබාදීම | 0·49 | 100 | 59 |
| **රණවිරු සම්පත් මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම - හැඳල** හේකිත්ත | 40 | 55 | 30 |
| **රණවිරුවන්ගේ දරුවන් සඳහා පාසල් උපකරණ ලබාදීම කුරුණෑගල, පුත්තලම හා** කෑගල්ල | - | - | 100 |
| අ.පො.ස./උසස් පෙළ සමත් සිසුන් සඳහා ශිෂ්‍යත්ව | - | - | 100 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව හරහා පෞද්ගලික ණය පහසුකම් ලබාදීම | - | - | 55 |

## 8.3 අනාගත අපේක්ෂා

- ඉදිරි වර්ෂවලදී, 500 කට අධික රණවිරුවන් සඳහා ඉඩම් බෙදා දීමට අපේක්ෂිතය.
- රණවිරුවන්ට සුභසාධන පහසුකම් ලබාදීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- රණවිරුවන්ට ජාතික ඉතිරිකිරීමේ බැංකුව හරහා අඩු පොලී ණය ලබා ගැනීම සඳහා වහාම අවශ්‍ය කටයුතු කිරීමට අපේක්ෂිතය.
- රණවිරුවන්ගේ දරුවන්ගේ උසස් අධ්‍යාපනය සඳහා ශිෂ්‍යත්ව ලබා දීම.

# 09
# නාගරික සංවර්ධන අංශය

## 9.1 සමාලෝචනය

ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් බහුතරයක් තවමත් ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වුවද එම තත්ත්වය වේගයෙන් වෙනස්වෙමින් සීඝ්‍ර නාගරීකරණයට ලක්වෙමින් පවතී. එම තත්ත්ව තුල නුදුරු අනාගතයේදී අප සමාජය නාගරික සමාජයක් ලෙ ඉස්මතු වනු ඇත. එය බොහෝ රටවල දකින ලෙසම වේගවත් නාගරීකරණය සැබවින්ම නොවැලැක්විය හැකි ප්‍රවනතාවයකි. වර්තමාන ආර්ථිකයේ වර්ධන යාන්ත්‍රණය නගර සහ පුරවර සංවර්ධනයයි. නාගරීකරණයේදී ඵලදායි කලමණාකරණය සහ සැලසුම්කරණය නගර සහ පුරවරයන්හි තිරසාර සංවර්ධනය සහතික කිරීමේදී තීරණාත්මත සාධකය වේ. වසර 2020 වන විට රටපුරා මනාලෙස සැලසුම්ගත, ආර්ථික වශයෙන් ඵලදායි, තිරසර පරිසර හිතකාමි, විචිත්‍රවත් සංස්කෘතියකින් යුත් සුරක්ෂිත සහ ලොකු කුඩා නගර සම්බන්ධ ජාලයක් ඉලක්ක කර ගැනීමට සැලසුම් අධීක්ෂණය කරමින් දේශීය විදේශීය මූලධන ආයෝජන ලබාගනිමින් නිසි මගපෙන්වීමට නායකත්වයක් ලබාදීමේ මහඟු කාර්යයට නාගරික සංවර්ධන අංශය උරදී සිටී. ඒ සඳහා සැලසුම්ගත නගර සහතික කිරීම උදෙසාත්, ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීමත්, නාගරික සංවර්ධනය සඳහා අවශ්‍ය තිරසාර ඉඩම් භාවිතය සහතික කිරීම සඳහාත් ඓතිහාසික වටිනාකමක් ඇති ගොඩනැගිලි සංරක්ෂණය කර සංවර්ධන කාර්යයන් සඳහා යොදා ගැනීම සඳහාත් නාගරික සංවර්ධන අධිකාරියේ කලමණාකාරීත්වයට අවශ්‍ය මගපෙන්වීම හා අධීක්ෂණ කටයුතු මෙම අංශය මගින් සිදු කරනු ලබයි.

## 9.2 නාගරික සංවර්ධන අංශයේ ප්‍රගතිය

නාගරික සංවර්ධනයේ පෙර ගමන්කරුවූ නාගරික සංවර්ධන අධිකාරියේ නාගරික සංවර්ධනයට අමතරව සෘජුවම අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක වන ප්‍රධාන ව්‍යාපෘති අධීක්ෂණය නාගරික සංවර්ධන අංශය තුලින් ලබා දේ. මේ වන විටත් සැලකිය යුතු ප්‍රගතියක් අත්පත් කරගෙන ඇති අතර පහත දැක්වෙන ව්‍යාපෘති තුලින් අදාල ප්‍රගතිය මනාව පිළිබිමු වේ.

## 9.3 නාගරික සංවර්ධන අංශය

අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයනක් වන නාගරික සංවර්ධන අධිකාරිය හා සම්බන්ධ ඉඩම් සංවර්ධන හා කළමණාකරන, නගර සංවර්ධන සැලසුම්, විවිධ සංවර්ධන ව්‍යාපෘති සඳහා ඉඩම් අත්පත්කරගැනීම, නාගරික බලප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම, අනවසර ඉදිකිරීම් යන විෂයයන්ට අදාළව පවත්නා පනත්වල ඇති නීති රීති වලට අනුව සම්බන්ධිකරණ කටයුතු හා අදාළ අනුමැතීන් ලබාගැනීමට කටයුතු කිරීම නාගරික සංවර්ධන අංශය මගින් කරනු ලබයි.

නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩම් වාණිජමය ව්‍යාපෘති, කර්මාන්ත ව්‍යාපෘති, ආයෝජන මණ්ඩල ව්‍යාපෘති, නගර සංවර්ධන සැලසුම් ව්‍යාපෘති, රාජ්‍ය ආයතන, ව්‍යවස්ථාපිත මණ්ඩල හා ආගමික, පුණ්‍යායතන හා සමාජසේවා ආයතන වෙත බදු දීම, සින්නක්කරව පවරා දීම සඳහා අවශ්‍ය නීත්‍යානුකූල අනුමැතීන් අධිකාරිය වෙත ලබාදීම කරනු ලබයි.

ඒ අනුව 2014 වර්ෂය සඳහා ඉඩම් වෙන් කිරීම් බදුදීම් වලට අදාළව අමාත්‍ය මණ්ඩල සංදේශ 40 ක් පමණ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇත. එසේම ඉඩම් බැහැර කිරීමවලට අදාළව 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 18·1 වගන්තිය යටතේ වන සහතික 62 ක් සඳහා විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම පිණිස අවශ්‍ය කටයුතු කර ඇත.

විවිධ නාගරික සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරිමේදී අනවසර ඉදිකිරීම් හා පදිංචිවීම් හේතුවෙන් ඉඩම්වල භුක්තිය නැවත අධිකාරිය වෙත ලබාගැනීම සඳහා 1979 අංක 07 දරන රජයේ ඉඩම් ආඥා පනතේ ඉඩම් සන්තකය ආපසු ලබාගැනීම 14(2) බී වගන්තිය යටතේ වන සහතිකය සඳහා විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කර ඇත.

නගර සංවර්ධනයට අදාළව 2014 වර්ෂයේ මහ දඹුල්ල සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මඩාටුගම, ගලේවෙල, නාවුල, සීගිරිය(හබරණ) දඹුල්ල ද කල්මුණේ, මඩකලපුව, රත්නපුර හා බලංගොඩ යන නගර සම්බන්ධව නාගරික සංවර්ධන සැලසුම් සකස් කර ගැසට් මගින් ප්‍රකාශයට පත්කර ඇත.

එසේම 1978 අංක 41 දරන නාගරික සංවර්ධන පනතේ 3 වගන්තිය අනුව බණ්ඩාරවෙල හා පුස්සැල්ලාව යන ප්‍රදේශ නාගරික සංවර්ධන බල ප්‍රදේශ වශයෙන් 2014 වර්ෂයේ ප්‍රකාශයට පත්කර ඇත.

## 9.4 ඉඩම් අංශය

නාගරික සංවර්ධන අධිකාරියේ නාගරික සංවර්ධන කටයුතු වෙනුවෙන් ඉඩම් අත්කර ගැනීම, පවරා ගැනීම, ප්‍රත්‍යාදිෂ්ය කිරීම්, අවසතු කිරීම් සහ අදාල අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීම් මෙම අංශය මගින් ඉටු කරනු ලැබේ. එයට අදාලව 2014 වර්ෂය තුලදී පහත සදහන් කාර්යයන් ඉටුකරන ලදි.

ඉඩම් අත්පත් කරගැනීමේ පනත යටතේ ඉඩම් කොටස් අත්කර ගැනීමට අදාල මූලික අනුමැතියට ඉදිරිපත් කරන ලද අයදුම්පත් සංඛ්‍යාව 40 කි. ඉඩම් අත්කර ගැනීමට අදාල 2 වගන්තිය යටතේ නියාමනය කිරීම් (අතිගරු ජනාධිපතිතුමාගේ නියාමය) 21 ද 38(අ) අතුරු විධානය යටතේ ආඥාව 32 ක්ද 15 (1) වගන්තිය යටතේ පවරා ගැනීම 35 ක්ද ප්‍රත්‍යාදිෂ්ය කිරීම් සහ අවසතු කිරීම් 09 ක්ද 50 වගන්තිය යටතේ අත්හැර දැමීම 03 ක් හා ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව 16කි.

## 9.5 ඇගයුම් හා මෙහෙයුම් අංශය

නාගරික සංවර්ධන අධිකාරිය සහ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධන කිරීමේ සංස්ථව මගින් ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘතිවල සම්බන්ධීකරණ කටයුතු කරමින් ඒ හා සම්බන්ධ ඇගයුම් හා මෙහෙයුම් කටයුතු සිදු කිරීම මගින් නාගරික සංවර්ධන ක්‍රියාවලිය කඩිනම් කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වෙයි.

ඒ සඳහා ඉහත ආයතන දෙක මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතිවල ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකිරීමත් ඒ හා සම්බන්ධ ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වමින් යාවත්කාලීන තොරතුරු ලබා ගෙන අදාළ ව්‍යාපෘති පිළිබඳ ඇගයීම් කටයුතු සිදු කරනු ලබයි.

එමෙන්ම නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය සහ 3K ව්‍යාපෘතිය සම්බන්ධ අධීක්ෂණය කටයුතු සිදු කිරීමත්, නාගරික සංවර්ධන ක්‍රියාවලියේදී පැන නගින මහජන පැමිණිලි සම්බන්ධව කටයුතු කිරිමත්, නාගරික සංවර්ධන අංශය තුල තොරතුරු තාක්ෂණ විෂයට අදාළ කටයුතු මෙහෙයවීම සහ සම්බන්ධීකරණය කිරීම තුලින් කාර්යක්ෂම සහ ඵලදායි සේවාවක් සැපයීමද ඇගයුම් හා මෙහෙයුම් අංශය වෙතින් සිදු කරනු ලබයි.

## 9.6 තාක්ෂණ හා ප්‍රසම්පාදන අංශය

අමාත්‍යාංශයේ නාගරික සංවර්ධන අංශය යටතේ පවතින ආයතනවල එනම් *UDA, SLLR&DC, SCDP,* 3K ආදියෙහි ප්‍රසම්පාදන කටයුතු කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය හා වගකීම වේ.

ඒ අනුව ප්‍රසම්පාදන කමිටු පත්කිරීම ඇතුළු ඒ හා සම්බන්ධ සියළු ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමත්, ගන්නා ලද ප්‍රසම්පාදන තීරණ අදාළ ආයතන වලට දැනුම් දෙමින් ඒවා ක්‍රියාත්මක කිරීමට කටයුතු සම්පාදනය කිරීමත්, ප්‍රසම්පාදන කටයුතු වලට අදාළ ප්‍රගති සමාලෝචනයත් සිදු කරනු ලබයි.

තවද ඒකක මිළ ගණන් සඳහා ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ ස්ථාවර තාක්ෂණ ඇගයීම් කමිටුවේ අනුමැතිය ලබා ගැනීමත්, නාගරික සංවර්ධන අධිකාරියේ දේපල බැහැර කිරීම සඳහා අමාත්‍යාංශය පත්කල ටෙන්ඩර් මණ්ඩලයේ කටයුතු සඳහා සහාය වීමත් මෙම අංශයෙන් සිදු කරයි.

නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිරිපත් කරන ප්‍රසම්පාදන හා තාක්ෂණ කටයුතු සම්බන්ධ අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම හා ඉදිරිපත් කිරීමත්, නාගරික සංවර්ධන අංශය මඟින් තාක්ෂණ අංශය වෙත යොමු කරන අනෙකුත් සියළුම කටයුතු සිදු කිරීමත් මෙම අංශයේ වගකීම වේ.

## 9.7 නාගරික සංවර්ධන අංශය මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන් හි ප්‍රගතිය


### 9.7.1 පිටත වටරවුම් ආශ්‍රිත නගර සංවර්ධන ව්‍යාපෘතිය



මෙම ව්‍යාපෘතිය යටතේ කඩුවෙල මහ නගර බල ප්‍රදේශයට අයත් වැලිවිට මාර්ගය (3300m)හා සුහද මාවත(610m) ජල නල එලීම හා පොදු ඉදිකිරීමේ කටයුතු 54% සම්පූර්ණ කර ඇත. මේ සඳහා ඇස්තමේන්තු ගත වියදම රුපියල් මිලියන 382 ක් වන අතර ව්‍යාපෘතිය 2014 දෙසම්බර් අවසන් කිරීම කිරීමට නියමිත වු අතර කාලගුණික බලපෑම් සහ නැවත පදිංචිකිරීමේ කාර්යයන් ප්‍රමාද වු බැවින් 2015 මැයි මස දක්වා කාලය දීර්ඝ කරන ලදි. කොට්ටාව පන්නිපිටිය මාර්ග සංවර්ධනය සඳහා ඇස්තමේන්තු ගත වියදම රුපියල් මිලියන 263 ක් වන අතර බලපෑමට පත්වු ප්‍රමාණය 225ක් වේ. මෙම බලපෑමට පත්වු ජනතාවගේ ඉඩම් අත්පත් කරගැනීමේ කාර්යය නාගරික සංවර්ධන අධිකාරිය මගින් සිදු කරනු ලබන අතර වන්දි ගෙවීම සඳහා තක්සේරු වාර්තා ලැබිය යුතුව ඇත. දකුණු අධිවේගි මාර්ගයේ කොට්ටාව පිවිසුම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා අරමුණු කරගත් මාකුඹුර නගර සංවර්ධන සැලැස්මේ බහුකාර්ය ප්‍රවාහන පර්යන්ත ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත වියදම රුපියල් මිලියන 845 ක් වන අතර මෙහි ඉඩම් සංවර්ධන කටයුතු ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් කරගෙන යනු ලබන අතර 15% කටයුතු අවසන් කර ඇත.

### 9.7.2 උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවේ ප්‍රධාන නගර ආශ්‍රිතව ආර්ථික, සමාජීය හා පාරිසරික වශයෙන් ජන ජීවිතයේ තිරසර බව නගාසිටුවීමට සඳහා උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය නාගරික සංවර්ධන ජලසම්පාදන හා ජලපවහන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකවේ. මෙම ව්‍යාපෘතිය සඳහා ලෝක බැංකුව ඇමරිකානු ඩොලර් මිලියන 147 ක් මුල්‍ය අනුග්‍රහයක් ලබාදෙනු ඇත. මෙම ව්‍යාපෘතිය 2014 වර්ෂයේ ආරම්භ කෙරුන අතර 2019 වසරේ අවසන් කිරීමට නියමිතය. මහනුවර හා ගාල්ල දිස්ත්‍රික්කයන්හි නගර සංවර්ධනය වැඩිදියුණු කිරීම මූලික කරගනිමින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අතර, මහනුවර නගර සංවර්ධනය සඳහා මාර්ග තදබදය අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පානීය ජලසම්පාදන වැඩිදියුණුකිරීමේ ව්‍යාපෘතිය, නගරයේ වැසිජලය හා අපවිත්‍ර ජලය බැහැරකිරීමේ ව්‍යාපෘතිය සහ ව්‍යාපාති පාර්ශවකරුවන්ගේ ආයතනික ධාරිතාවය වැඩිකිරීම සඳහා කටයුතු කිරීම සිදු කරනු ලබයි. ගාල්ල දිස්ත්‍රික්කයේ ගංවතුර පාලනය කිරීම සඳහා තෝරාගත් ඇල මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සහ ගාල්ල නගරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතීන් මේ යටතේ ක්‍රියාත්මක වේ.






### 9.7.3 බත්තරමුල්ල පුද්ගල අනන්‍යතා මහ ලේකම් කාර්යාලය

මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2012 ජුලි මස ආරම්භ වු අතර කොන්ත්‍රාත් කාලය මාස 36 කි. 2014 දෙසැම්බර් මස 31 වන දිනට ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතුවල භෞතික ප්‍රගතිය 82% වන අතර මූල්‍ය ප්‍රගතිය 96%ක් වේ. මෙම ව්‍යාපෘතිය 2015 ජුලි මස අවසන් කිරීමට නියමිතය.

### 9.7.4 නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය



කොළඹ නගරය සංවර්ධන කිරීමේදී පැවති ප්‍රධාන බාධකයක් ලෙස පැවති අඩු ආදායම්ලාභී පැල්පත්වාසීන් හා ඔවුන්ගේ නිවාස ගැටළුවට පිලියම් ලෙස හා කොළඹ නගරය තුල ඉහල වටිනාකමක් සහිත ඌන උපයෝජනය පවතින ඉඩම් නිරවුල් කිරීම සඳහා නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය මගින් ඉතා එලදායි නිවාස යෝජනා ක්‍රම ක්‍රියාත්මකවීමත් එමගින් අඩුආදායම්ලාභීන්ට පහසුකම් සහිත නිවාස හිමිවීම හා නගර අලංකරන ක්‍රියාවලි සිදුකිරීම මෙම ව්‍යාපෘතිය මගින් සිදු කරනු ලබයි. මෙම ව්‍යාපෘතිය මගින් ජනතා වෙත ලබාදී ඇති නිවාස පහත වගුවෙන් දැක්වේ.

| අංක | නිවාස ව්‍යාපෘතිය | ස්ථානය | නිවාස සංඛ්‍යාව | ජනතා අයිතියට පත්වූ දිනය |
|---|---|---|---|---|
| **01** | ලක්මුතු සෙවණ | වැල්ලවත්ත,මයුර පෙදෙස | 118 | 2014.10.07 |
| **02** | සිරිසඳ සෙවණ | බ්ලුමැන්ඩල් | 366 | 2014.10.17 |
| **03** | සිරිසර උයන සහ මෙත්සර උයන | වනාතමුල්ල, බොරැල්ල | 1148 | 2014.10.27 |
| **04** | රන්දිය උයන | හේනමුල්ල, කොළඹ 14. | 1137 | 2014.11.18 |
| **05** | සිරිමුතු උයන | එදිරිසිංහ වත්ත, කොළඹ 14. | 546 | 2014.11.21 |
| **06** | ලක්සඳ සෙවන | සාලමුල්ල, කොලොන්නාව. | 216 | 2014.12.01 |
| **07** | මුවදොර උයන | ෆර්ගිෂන් පාර, කොළඹ 14. | 872 | 2014.12.08 |
| **08** | මිහිඳුසෙන්පුර | දෙමටගොඩ | 500 | 2014.11.18 |

# 10
# මාධ්‍ය මධ්‍යස්ථානය

## 10.1 සමාලෝචනය

දේශීයව හා ජාත්‍යන්තර මට්ටමින් කෙරෙන අතිශයෝක්ති හෝ සාවද්‍ය මාධ්‍ය ප්‍රචාරණයන්ට ප්‍රතිවිරුද්ධව නිරවද්‍ය දෘෂ්ටිකෝණයකින් තොරතුරු ලබාදීමට සැදී පැහැදී සිටින ආරක්ෂක අමාත්‍යාංශයීය මාධ්‍ය මධ්‍යස්ථානය වූ කලී ආරක්ෂාවට අදාල නිරවද්‍ය හා විශ්වාසදායක තොරතුරු ඒකරාශී කොට හැකි ඉක්මණින් දේශීය හා විදේශීය මාධ්‍ය ජාලය වෙත ප්‍රචාරණය කිරීමෙහි නියැලෙන ප්‍රමුඛතම මාධ්‍ය ඒකකයයි.

## 10.2 2014 වසරේ මුදුන්පමුණුවා ගැනීම්

දැඩි කැපවීම හා සුමට ක්‍රියාකාරිත්වය ඔස්සේ, ඒකකය විසින් 2014 වසරේදී පහත දැක්වෙන අරමුණු සාක්ෂාත් කර ගෙන ඇත.

- ජාතික ආරක්ෂාවට අදාල ප්‍රවෘත්ති හා තොරතුරුවලට කඩිනමින් ප්‍රවේශවීම හා එකී ප්‍රවෘත්ති කාර්යක්ෂමව මාධ්‍ය වෙත මුදා හැරීම සඳහා පහසුකම් සලසාලීම.
- ජාතික ආරක්ෂාවට ඇති තර්ජන හඳුනා ගෙන, යෝග්‍ය පරිදි නිෂ්ප්‍රභා කිරීම.
- ආරක්ෂක අමාත්‍යාංශයේ අනෙකුත් අංශ හා සමග සහයෝගයෙන් ක්‍රියා කරමින් ආරක්ෂාවට අදාල කරුණු කාරණා සම්බන්ධයෙන් මාධ්‍ය ජාල සමග සක්‍රීය සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යාම.
- ආරක්ෂක අමාත්‍යාංශය, ත්‍රිවිධ හමුදා සහ වෙනත් ආයතන සමග සක්‍රීය සමාජයීය සහසම්බන්ධතාවයන් ගොඩ නගා ගැනීම.
- කිසියම් අනාගතය ආශ්‍රිත වාර්තාකරණයකට යොමු වීම සඳහා ප්‍රවෘත්ති පත්‍ර ලේඛණාගාර දත්ත පදනමින් පවත්වා ගෙන යාම.
- ආරක්ෂක අමාත්‍යාංශයේ නිශ්චිත අරමුණු සාක්ෂාත් කර ගැනීමට ඉවහල් වන අයුරින් මාධ්‍ය සම්බන්ධීකරණය.
- අවශ්‍ය වූ අවස්ථාවලදී ලිඛිත හා වාචික නිරාකරණ ක්‍රියාදාමයක නියැලීම.


## 10.3 2014 වසරේ ක්‍රියාකාරකම් විග්‍රහය/අගැයීම

2008 සිට 2014 දක්වා කාල පරාසය තුළ මාධ්‍ය මධ්‍යස්ථානයේ මූල්‍ය හා ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගන්නා ලද්දේ ආරක්ෂක අමාත්‍යාංශයට සෘජුවම වෙන් කරන ලද 103-01-06 අයවැය ශීර්ෂය යටතේ ය. මාධ්‍ය මධ්‍යස්ථානයේ 2015 වසර සඳහා වන මූල්‍යමය වැය ආරක්ෂක අමාත්‍යාංශයීය අයවැය ශීර්ෂයෙහි සෘජුව ඇතුළත් කර ඇත.

සුලු පරිමාණයේ මූල්‍ය අවශ්‍යතා පිරිමසා ගැනීම සඳහා රුපියල් 5,000.00 ක සුලු මුදල් අග්‍රිමයක් ලබා දී ඇති අතර, විධිමත්ව අනුමත කරන ලද බිල්පත් ප්‍රතිපූරණය සඳහා ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කෙරේ.

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා රෙජිමේන්තු භට කණ්ඩායම්වල හා ත්‍රිවිධ හමුදාවල සහාය සහ රුපියල් මිලියන 3.849 ක පිරිවැයක් සහිතව මාධ්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ අලුත්වැඩියාවන් ආරම්භ කෙරිණ.

*10.1* වගුව : මූල්‍යමය ප්‍රගතිය




## 10.4 අනාගත අපේක්ෂා

- ශ්‍රී ලංකා විරෝධී අංශ විසින් කෙරෙන සාවද්‍ය ප්‍රවෘත්ති ප්‍රචාරණය සම්බන්ධයෙන් මහ ජනතාව දැනුවත් කිරීම සඳහා ජාතික මට්ටමේ වැඩ සටහන අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.
- ජාතික හා ජාත්‍යන්තර මාධ්‍ය පද්ධතිය සමඟ සම්බන්ධීකරණය හා සහසම්බන්ධතාවය වැඩිදියුණු කිරීම හා වර්ධනය කිරීම.
- උතුරු හා නැගෙනහිර සිවිල් ජනතාව අතර පවත්නා පොදු සාවද්‍ය මති මතාන්තර පිටු දැකීම සඳහා විශේෂයෙන් දමිළ මාධ්‍යයෙන් ප්‍රවෘත්ති ප්‍රකාශයට පත් කිරීම සහ පුවත්පත් නිවේදන නිකුත් කිරීම.
- ආරක්ෂක අමාත්‍යාංශය විසින් දියත් කර ඇති ජාතික මට්ටමේ සංවර්ධන පරිශ්‍රම වෙත මාධ්‍ය සහයෝගය විස්තාරණය කිරීම.
- මාධ්‍ය ප්‍රයත්නයන් සක්‍රියව පවත්වා ගෙන යාම සඳහා සියලුම මුද්‍රිත, විද්‍යුත් හා අන්තර්ජාල පදනම් කොට ගත් මාධ්‍ය ආයතන හා සමග සහසම්බන්ධතාවය වැඩිදියුණු කිරීම හා වර්ධනය කිරීම.
- අවශ්‍ය වන අවස්ථාවලදී, ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව ප්‍රවෘත්ති සාකච්ඡා පැවැත්වීම.
- ආරක්ෂක අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති උපදෙස් ප්‍රකාර, විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය සංවිධාන හා සමග සම්බන්ධතා සහිතව, සියලුම මාධ්‍ය ආවරණ කටයුතු සම්බන්ධීකරණය.

# 11

# හමුදා සම්බන්ධීකරණ කාර්යාලය

## 11.1 සමාලෝචනය

මෙම අංශයෙහි ප්‍රමුඛතම භූමිකාව වන්නේ අන්‍යෝන්‍ය අවබෝධය සහ සක්‍රීය ක්‍රියාකාරීත්වය තහවුරු කර ගැනීම් වස්, ආරක්ෂක අමාත්‍යවරයා වශයෙන් අතිගරු ජනාධිපතිතුමන් / ආරක්ෂක ලේකම් විසින් නිකුත් කෙරෙන තීරණ, හමුදා බලකාය මූලිකාංග සහ හෝ වෙනත් ආයතන අතර සම්බන්ධීකරණයෙන් සංනිවේදනය කරලීමයි.

රජය සහ ආරක්ෂක අමාත්‍යාංශය විසින් නිකුත් කෙරෙන ප්‍රතිපත්ති තීරණ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය සහ අනුමත කාර්ය භාරයන් හා වැඩ සටහන් වෙන්කර දී ඇති සම්පත් නොඉක්මවා ක්‍රියාත්මක කිරීම·

**වගකීම්**

- රාජ්‍ය උත්සව අවශ්‍යතාවයන්ට සහාය වීම හා සම්බන්ධීකරණය
- විදේශීය නියෝජිත පිරිස්වල සංචාරවලදී සහාය වීම හා සම්බන්ධීකරණය
- ත්‍රිවිධ හමුදාවන්ගේ අවශ්‍යතාවයන් සඳහා රජයේ අමාත්‍යාංශ හා සමග සහ ප්‍රතිලෝම වශයෙන් කටයුතු කිරීම
- ත්‍රිවිධ හමුදාවන්හි විශෙෂඥ දැනුම හා සම්පත් භාවිතා කරමින්, පෞද්ගලික/වාණිජ ආයතනවල අවශ්‍යතාවයන්ට සහාය වීම හා සම්බන්ධීකරණය
- රාජ්‍යතාන්ත්‍රික අංශයන්හි වැඩ සටහන් සඳහා හමුදාමය සහාය ලබාදීම පහසුකරවමින් එකී අංශයන් සමඟ මෙන්ම ප්‍රතිලෝම වශයෙන්ද සම්බන්ධිකරණය
- සංචාරය සීමා කර ඇති ප්‍රදේශ හා හමුදා ආයතන වෙත පැමිණෙන දේශීය හා විදේශීය ජාතිකයින් මෙහෙයවීම හා සම්බන්ධීකරණය
- ජාතික ආරක්ෂාවට තර්ජනයක් විය හැකි විෂයයන් ආනයනය කිරීම·

**ප්‍රධානතම විෂයයන්**

- විදේශීය පිරිස් අධි ආරක්ෂිත කලාප හා හමුදාමය ආයතන වෙත පැමිණීම සම්බන්ධීකරණය
- නැව් සහ ගුවන් යානා සඳහා ( හමුදාමය සහ චර්යානුගත නොවූ සංචලනයන් සඳහා) රාජ්‍යතාන්ත්‍රික නිෂ්කාෂණය සැලසීම
- හමුදාමය ගුවන් ගමන් සඳහා පියාසර අනුමැතිය ලබාදීම
- ගුවන්යානා/ ගුවන් යානා අමතර කොටස්, බෝට්ටු,**OBMS/ IBMS** සහ විශේෂ හමුදාමය
- මෙවලම් ආනයනය/අපනයනය/භාවිතය/ ප්‍රවාහනය සඳහා නිෂ්කාෂණය සැලසීම
- සිතියම් සම්පාදනයට හා ගුවන් ඡායාරූපීකරණයට පහසුකම් සැලසීම
- නිගෝපන අයිතමයන්/ නිල ඇඳුම් ආනයනය/අපනයනය/ප්‍රවාහනය සඳහා නිෂ්කාෂණය සැලසීම
- ත්‍රිවිධ හමුදාවට සහ පොලිසියට අදාළ චාරිත්‍රානුකූල උත්සව සම්බන්ධීකරණය
- විදේශීය පිරිස්/ රාජ්‍ය තාන්ත්‍රික දූත පිරිස්/රාජ්‍ය නොවන සංවිධානවල සහ විදේශීය මාධ්‍යවල නියෝජිතයින් පැමිණීමේදී සහාය හා සම්බන්ධීකරණය.
- ත්‍රිවිධ හමුදාවල අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් රජයේ අමාත්‍යාංශ හා සමඟ ගනුදෙනු කිරීම
- ත්‍රිවිධ හමුදාවන්හි විශේෂඥ දැනුම හා සම්පත් භාවිතා කරමින්, පෞද්ගලික/වාණිජ ආයතනවල අවශ්‍යතාවයන්ට සහාය වීම හා සම්බන්ධීකරණය
- රාජ්‍යතාන්ත්‍රික අංශයන්හි වැඩ සටහන් සඳහා හමුදාමය සහාය ලබාදීම පහසුකරවමින් එකී අංශයන් හා සමග සම්බන්ධිකරණය සහ ආරක්ෂක නිලධාරින්ගේ මාසික රැස්වීම්
- අන්තරායකාරී නෞකා භාණ්ඩ නිෂ්කාෂණය
- විශ්‍රාම යන හමුදා නිලධාරින් සඳහා වෘත්තීමය පුහුණුවීම් සංවිධානය කිරීම
- ආරක්ෂක අමාත්‍යාංශයේ අනෙකුත් අංශ විසින් ඉල්ලා සිටින විට, සහාය දැක්වීම
- අනුරාධපුර, මහමෙව්නා උයනේ, සඳහිරු සෑය ඉදිකිරීම් කටයුතු සම්බන්ධීකරණය
- උසස් රාජ්‍ය නිලධාරින්ගේ හා රජයේ අමාත්‍යවරුන්ගේ ගුවන් / සමුද්‍ර ගමන් සංවිධානය කිරීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව / ශ්‍රී ලංකා නාවික හමුදාව හා සමග සම්බන්ධීකරණය
- සීමා කර ඇති හමුදාමය මෙවලම් ඉවත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා රේගුව හා සමග සම්බන්ධීකරණය
- ආරක්ෂක අමාත්‍යාංශයට හෝ ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ගැනෙන වෙනත් ආයතනවලට හමුදා නිලධාරින් අනුයුක්ත කිරීම සම්බන්ධීකරණය හා පරිපාලනය
- විදේශීය රාජ්‍ය නායකයින්ගේ සංචාර සඳහා කටයුතු සම්පාදනයේදී ( ජනාධිපති ලේකම් කාර්යාලයේදී සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේදී පැවැත්වෙන මූලික රැස්වීම්වලින් අනතුරුව නිකුත් කෙරෙන උපදෙස් වලට අනුකූලව

* පහත දැක්වෙන අයුරු සහාය දැක්වීම

- උත්සවාකාරයෙන් පිළිගැනීම සනිටුහන් කරමින් ආචාර වෙඩිමුර 19/21 ක් පැවැත්වීම.
- උත්සවාකාර යතුරු පැදි හා පදින්නන් සැපයීම සම්බන්ධීකරණය
- යුද හමුදාව, නාවික හමුදාව, ගුවන් හමුදාව, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව හා පොලීසිය විසින් පැවැත්වෙන සංස්කෘතික රඟ දැක්වීම් සම්බන්ධීකරණය
- ගෞරවාචාර පෙළපාලිය සම්බන්ධීකරණය
- බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළට පැමිණීමේදී හා පිටත්ව යාමේදී මග දෙපස ගෞරවාචාර විධිවිධාන සැලසීම
- පාර්ලිමේන්තු පරිශ්‍රයේ රණවිරු ස්මරණ ස්තම්භය ඉදිරිපිට මල්වඩම් ස්ථානගත කිරීමේ උත්සවය සම්බන්ධීකරණය.
- ප්‍රභූන් දිවයිනෙහි රැඳී සිටින කාල පරාසය තුළ වෛද්‍ය කණ්ඩායමක් අනුයුක්ත කිරීම.
- ප්‍රභූන් සඳහා, අවශ්‍ය වන පරිදි, යෝග්‍ය අභ්‍යන්තරික ගුවන් ගමන් සම්බන්ධීකරණය.
- විශේෂ ගුවන් යානා ගොඩ බැසීමට අවසරය ලබා දීම සහ කටුනායක ශ්‍රී ලංකා ගුවන් හමුදා පරිශ්‍රයේ අදාල ආරක්ෂාව සැලසීම.
- ප්‍රභූන්ගේ ගුවන් යානා පිටත්ව යාමට පෙර, පූර්ව ආරක්ෂක සංවිධාන පරීක්ෂාව සඳහා අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය.
- ප්‍රභූන්ගේ ගමන්මලු ප්‍රවාහන හා කළමණාකරණ කටයුතු සම්බන්ධීකරණය. රාජ්‍ය උත්සව සඳහා ගාලුමුවදොර පරිශ්‍රය ලබා ගැනීම සඳහා වරාය අධිකාරිය හා සමඟ සම්බන්ධීකරණය.

- අගනුවර විශේෂිත ස්ථානවල ටෙලි නාට්‍ය රූපගත කිරීම, ප්‍රචාරණ කටයුතු හා වෙනත් ඡායාරූප ගත කිරීම් සඳහා අනුමැතිය ලබා දීම.
- ගාලු මුවදොර පරිශ්‍රයේ හා ප්‍රදීපස්තම්භයේ දර්ශන රූපගත කිරීම් සඳහා අනුමැතිය ලබා දීම
- උත්සව හා ඉඳි කිරීම් කටයුතු සඳහා (වාර්ෂික බුද්ධ රශ්මි වැඩ සටහන, පොසොන් පෝය වැඩ සටහන) හමුදාමය විශේෂඥ දැනුම හා කම්කරු ශ්‍රමය ලබා දීම
- රක්නා ආරක්ෂක ලංකා ආයතනයට සහාය ලබාදීම
- ගුවන් ගමන්/රැස්වීම් හා වෙනත් අවශ්‍යතාවයන් සම්බන්ධීකරණය කරමින්, විදේශීය හමුදා ප්‍රහුණු දූත පිරිස්වල පැමිණීම පහසු කරවීම හා සම්බන්ධීකරණය
- ආරක්ෂක නිෂ්කාෂණ සහතික නිකුත් කිරීම
- සැමරුම් උත්සව සඳහා සහාය වීම
- ආරක්ෂක අමාත්‍යාංශයේ ආරක්ෂක විධිවිධාන පරිපාලනය
- කොළඹ හා තදාසන්න ප්‍රදේශවල ඇවිදින මංතීරු නඩත්තු කටයුතු සම්බන්ධීකරණය
- සාමාජීය / සිවිල් උත්සවවලට, ආරාධනය මත, සහභාගී වීම සඳහා සේවා ආඥාපතිවරුන්ට අනුමැතිය ලබා දීම
- ත්‍රිවිධ හමුදා තූර්ය වාදක කණ්ඩායම් ලබා දෙමින් උත්සව පැවැත්වීමට සහාය වීම
- රාජ්‍ය උත්සවවලට සහාය දීම හා සම්බන්ධීකරණය.
  - අවශ්‍ය පරිදි භට කණ්ඩායම් ලබා දීම.
  - ආරාධනා පත්‍ර සැකසීම, ආසන පැනවීම සහ සම්බන්ධීකරණය ආදිය.
- අතිගරු ජනාධිපතිතුමන්/ ආරක්ෂක ලේකම් විසින් පවරන වෙනත් කාර්ය භාරයන්.

## 11.2 2014 වසරේ මුදුන්පමුණුවා ගැනීම්

මෙහි පහත විස්තරාත්මකව දක්වා ඇති සියලුම කාර්ය භාරයන් මෙම කාර්යාලය විසින් අතිශයින් සාර්ථක ලෙස ඉටු කරන ලදී.

මූලාරම්භයේ සිට හමුදා සම්බන්ධතා කාර්යාලය ඔස්සේ සම්බන්ධීකරණය වූ සඳහිරු සෑය ඉදිකිරීම් කටයුතු වල සීඝ්‍ර ප්‍රගතියක් අත්පත් කර ගෙන ඇති බව එකී ව්‍යාපෘති භූමියට පැමිණෙන්නෙකුට පෙනී යනු ඇත.

2014 වසර තුළදී, මෙට්‍රෝ කොළඹ නාගරික සංවර්ධනය, ඇල මාර්ග පවිත්‍රකරණය සහ නගර සංවර්ධන ව්‍යාපෘති හමුදා සම්බන්ධතා කාර්යාලය හරහා ත්‍රිවිධ හමුදා සම්බන්ධීකරණයෙන්, සක්‍රීයව ක්‍රියාත්මක කර ඇත.

## 11.3 2014 වසරේ ක්‍රියාකාරකම්වල විග්‍රහය/ අගැයීම්

මෙම දෙපාර්තමේන්තුව හුදෙක් ත්‍රිවිධ හමුදා, අමාත්‍යාංශය හා වෙනත් ආයතන හා සම්බන්ධීකරණයෙහි යෙදෙන ආයතනයක් හෙයින්, මූල්‍ය ප්‍රගති වාර්තාකරණය අදාල නොවේ. එහෙයින්, ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් ද අදාළ නැත.

## 2014 වසරේ කාර්ය සාධනය

- විදේශීය ප්‍රභූන් හා දූත පිරිස් දිවයිනට පැමිණෙන අවස්ථාවලදී වගකීම් තීරයෙහි දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා ගුවන් හමුදාව හා එක්ව, ගුවන් ගමන් සංවිධානය කිරීම හා සම්බන්ධීකරණය හමුදා සම්බන්ධතා කාර්යාලය විසින් මනාව ඉටු කර ඇත.
- එසේම, එවන් ප්‍රභූ පිරිස් සඳහා මුහුදු ගමන් සංවිධානය කිරීමද, ශ්‍රී ලංකා නාවික හමුදාව හා සමග සම්බන්ධීකරණයෙන් ඉටු කරන ලදී. දිවයිනට පැමිණෙන විදේශීය දූත පිරිස්වලට යුද වාතාවරණයක් පැවැති ප්‍රදේශවල සංචාරය සඳහා ද ශ්‍රී ලංකා යුද හමුදාව හා සමඟ සම්බන්ධීකරණයෙන් පහසුකම් සලස්වා දෙන ලදී. එසේම, දිවයිනට පැමිණෙන විදේශීය මාධ්‍ය ආයතන හා එකී පුද්ගලයින්ට, රාජ්‍ය අවශ්‍යතාවය පරිදි ඒ හා සමානම පහසුකම් සලස්වා දෙන ලදී.
- රාජ්‍ය තාන්ත්‍රික දූත පිරිස්වල වැඩ සටහන් සඳහා හමුදා සහාය ලබාදීම හමුදා සම්බන්ධතා කාර්යාලය විසින් සාර්ථකව ඉටු කර ඇත. මසකට දෙවරක් පැවැත්වෙන ආරක්ෂක නිලධාරි රැස්වීම සංවිධානය කිරීමද වර්ෂය පුරා සාර්ථකව ඉටු කරන ලදී.
- ත්‍රිවිධ හමුදාවන්ට අවශ්‍ය වන සීමා කරන ලද භාණ්ඩ, ශ්‍රී ලංකා වරායට ලඟා වූ වහාම, රේගු නිෂ්කාෂණය සඳහා ශ්‍රී ලංකා රේගුව හා සමඟ සම්බන්ධීකරණයෙන් කටයුතු සම්පාදනය කෙරින. මේ අනුව, අන්තරායකාරී භාණ්ඩ හා නියෝජනය කළ නිලඇඳුම් රේගුවෙන් ඉවත් කර ගැනීම, ගුවන් යානා, ගුවන් යානා අමතර කොටස්,බෝට්ටු, **OBMS/ IBMS** සහ විශේෂ හමුදාමය මෙවලම් ආනයනයද සම්බන්ධීකරණය කෙරිණ.
- ආයෝජන මණ්ඩලයෙන් අනුමත වෙළඳ සමාගම් සහ කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශයෙන් ලැබෙන ඉල්ලීම් මත, වෙස් වෙනස් කළ රෙදිපිළි ආනයනය, නිෂ්පාදනය හා ප්‍රවාහනය සඳහා අනුමැතිය ලබා දෙන ලදී.
- 2014 පෙබරවාරි මස 04 වන දින පැවැති ජාතික නිදහස් දින සමරු උත්සවයට අවශ්‍ය භට කණ්ඩායම් ලබා දීමෙන් උත්සවය සාර්ථකව නිම කිරීම සඳහා අවශ්‍ය සහාය ලබා දෙන ලදී.
- රජයේ අවශ්‍යතාවය පරිදි සඳහිරුසෑය ඉදි කිරීම් කටයුතු සඳහා සිවිල් ආරක්ෂක බලකාය සහ ත්‍රිවිධ හමුදා බලකායයන්ගේ සහාය ලබා දෙන ලද අතර, එකී ආගමික උත්සව කටයුතු සර්වප්‍රකාරයෙන් සාර්ථක විය.
- 2014 මැයි මස 19 වන දින පැවැති ජාතික විජයග්‍රාහී දින සැමරුම් උත්සවයට අවශ්‍ය පරිදි භට කණ්ඩායම් ලබා දී උත්සවය සාර්ථක කර ගැනීම සඳහා සහාය වන ලදී. රාජ්‍ය උත්සව වලට අමතරව, ත්‍රිවිධ හමුදාවට අදාල උත්සව ද සාර්ථකව පැවැත්වීම සඳහා අවශ්‍ය සහාය මෙම කාර්යාලයේ මැදිහත්වීමෙන් ලබා දෙන ලදී.
- ආරක්ෂාවට අදාල කටයුතු සම්බන්ධයෙන්, අවශ්‍ය වූ අවස්ථාවලදී, ඒ ඒ රටවල තානාපති කාර්යාල හා මහ කොමසාරිස් කාර්යාල හා සමඟ සම්බන්ධීකරණයෙන් අවශ්‍ය සහාය ලබා දෙන ලදී. එකී විදේශ රටවල් සමඟ පවතින ආරක්ෂක බැඳීම් වඩාත් තහවුරු කර ගැනීම සඳහා මෙම සම්බන්ධීකරණය මහත් සේ ඉවහල් විය.
- යුද වාතාවරණය පැවැති සමහර ප්‍රදේශ 2014 වසරේදී ද දේශීය හා විදේශීය අමුත්තන් සඳහා තහනම් ප්‍රදේශ ලෙස පැවතිණ. එකී ප්‍රදේශවලට යාම් ඊම් ආරක්ෂක අමාත්‍යාංශය යටතේ සම්බන්ධීකරණය කෙරිණ. මේ අනුව මෙම තහනම් ප්‍රදේශවලට යාම් ඊම් සම්බන්ධීකරණය කිරීම සඳහා මෙම කාර්යාලයට සෘජුවම මැදිහත් වීමට සිදුවිය.

  මෙයට අමතරව, හමුදාමය ආයතන වෙත යාම් ඊම්ද මෙම කාර්යාලයේ අධීක්ෂණයට භාජනය විය.
- 2014 වසරේදී, පහත විස්තර දැක්වෙන පරිදි, විදේශීය නාවික යාත්‍රා වලට කොළඹ සහ ත්‍රිකුණාමලයේ වරාය වලට පිවිසීම සඳහා රාජ්‍යතාන්ත්‍රික නිෂ්කාෂණය සලසා දෙන ලදී·

11·1 වගුව: පැමිණි විදේශීය නාවික යාත්‍රා සංඛ්‍යාව

| ජාතිකත්වය | නැව් සංඛ්‍යාව |
|---|---|
| ඕස්ට්‍රේලියානු | 01 |
| බංගලාදේශීය | 04 |
| චීන | 09 |
| ඉන්දියානු | 01 |
| ඉන්දුනීසියානු | 02 |
| ජපන් | 10 |
| කොරියන් | 04 |
| ඕමානි | 01 |
| පකිස්තානු | 03 |
| රුසියන් | 11 |

- 2014 වසර තුළ, විදේශීය ගුවන් හමුදා ගුවන් යානා 245 කට ගොඩ බැසීම සඳහා රාජ්‍යතාන්ත්‍රික නිෂ්කාෂණය ලබා දෙන ලදී.
- ජාතික ආරක්ෂාවට තර්ජනයක් විය හැකි විෂයයන් හා භාණ්ඩ ආනයනය සුපුරුදු පරිදි 2014 වසරේදී ද පාලනය කිරීමට මෙම කාර්යාලය මැදිහත් විය. අවශ්‍ය වන පරිදි, කලින් කලට, මෙකී පාලන හා වැළැක්වීමේ ක්‍රියාදාමය ක්‍රියාවට නංවන ලදී.

- ශ්‍රී ලංකා ආධිපත්‍යයට යටත් ගුවන් හා සමුද්‍ර බලප්‍රදේශයන්හි චර්යානුගත නොවූ යාත්‍රා සැරිසැරීම් කලින් කලට වාර්තා වූ වහාම එකී කටයුතු අධීක්ෂණය කිරීමට පියවර ගන්නා ලදී. එසේම, ඉල්ලීමේ හා අවශ්‍යතාවයේ ස්වාභාවය සැළකිල්ලට ගෙන හමුදාමය ගුවන් යානා වලට ගුවන් ගත වීමේ අනුමැතිය ලබා දෙන ලදී. අවශ්‍ය වූ අවස්ථාවලදී සිතියම්කරණයට හා ගුවන් ඡායාරූපකරණයටද පහසුකම් සලසා දෙන ලදී.
- 2014 වසරේදී ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ගැනෙන ආයතනවල නිලධාරින් සහභාගී වන රැස්වීම් ගණනාවක්ම ආරක්ෂක අමාත්‍යාංශයේදී පවත්වන ලද අතර එකී රැස්වීම් සංවිධානය හා සම්බන්ධීකරණයට මෙම කාර්යාලයේ සහාය ලබා දෙන ලදී.
- 2014 වසරේදී විවිධ රාජකාරි කටයුතු සඳහා බාහිර ආයතන හා වෙනත් රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධතා ඇති කර ගැනීමට ත්‍රිවිධ හමුදාවන්ට අවශ්‍ය වූ අවස්ථාවලදී මෙම කාර්යාලයේ සම්බන්ධීකරණයෙන් එකී අවශ්‍යතා සාර්ථකව ඉටු කර ගන්නා ලදී.
- වර්ෂය මුළුල්ලේ හමුදා කාර්යාල පරිශ්‍රයන්ට පිවිසීම සඳහා රාජ්‍යතාන්ත්‍රික හා විදේශීය දූත පිරිස් විසින් කරන ලද ඉල්ලීම් සම්බන්ධීකරණය කරමින්, අවශ්‍ය සහාය ලබා දෙන ලදී.
- බාහිර රාජ්‍ය ආයතනවලට අනුයුක්තව සිටින ත්‍රිවිධ හමුදා නිලධාරින්ගේ පරිපාලන කටයුතු මෙම කාර්යාලය හරහා සිදුවිය. අදාල රාජකාරිවලට බාධාවක් නොවන පරිදි එකී නිලධාරීන්ගේ ස්ථාන මාරු හා පත්වීම් ආදිය සාර්ථකව සම්බන්ධීකරණය කිරීමට මෙම කාර්යාලය සමත් විය.
- මෙම වසරේ ගාලූමුවදොර පරිශ්‍රයේ පැවැති විවිධ උත්සව සඳහා අනුමැතිය වරාය අධිකාරිය හා සම්බන්ධීකරණයෙන් ලබා දෙන ලදී.
- පසුගිය රජය සමයේ නාගරික සංවර්ධනය ආරක්ෂක අමාත්‍යාංශය යටතට ගැණුන හෙයින් සමහරක් සංවර්ධිත ප්‍රදේශ පාලනය ආරක්ෂක අමාත්‍යාංශය හරහා සිදු කෙරිණ. මේ අනුව, මෙකී ප්‍රදේශ පසුබිම් ඡායාරූපකරණය, චිත්‍රපට ඡායාරූපකරණය, වීඩියෝ කිරීම් ආදි කටයුතු සඳහා භාවිතා කිරීමට ( උදාහරණයක් වශයෙන් ගාලූමුවදොර පරිශ්‍රය හා ප්‍රදීපස්තම්භය අවසරය පතා පොදු මහ ජනතාවගෙන් හා බාහිර සංවිධාන වලින් ලත් ඉල්ලීම් ද මෙම කාර්යාලය විසින් සම්බන්ධීකරණය කෙරිණ. එසේම, ගුවන් ඡායාරූපකරණය සඳහා ලත් ඉල්ලීම් වලටද අනුමැතිය ලබා දෙන ලදී.
- එසේම, අතිගරු ජනාධිපතිතුමන් සහභාගී වන ආගමික සැමරුම් හා වෙනත් විශේෂ උත්සවවලට හමුදා සහාය ලබා දීම සම්බන්ධීකරණය කිරීමටද මෙම කාර්යාලය මැදිහත් විය. උදාහරණ: පොසොන් උත්සවය, රාජ්‍ය අනුග්‍රහය ලත් ආගමික උත්සව.
- විදේශීය රාජ්‍යනායකයින් දිවයිනට සම්ප්‍රාප්ත වූ අවස්ථාවලදී පැවැත්වෙන රාජ්‍ය උත්සව සඳහා පහත දැක්වෙන පහසුකම් හා අවශ්‍යතා සපුරා දීම සම්බන්ධීකරණය කරන ලද්දේ මෙම කාර්යාලයයි.

උදාහරණ: 2014 සැප්තැම්බර් මාසයේදී චීන ජනාධිපතිවරයා දිවයිනට සම්ප්‍රාප්ත වීම.

අ. ප්‍රභූන් පිළිගැනීම සඳහා ගෞරවාචාර වෙඩි මුර පැවැත්වීම

ආ. දූත පිරිස් සාමාජිකයින්ගේ ගමන්මලු කළමණාකරණය

ඇ. චාරිත්‍රානුකූළ රිය පෙරහර

ඈ. ඒ ඒ හමුදා විසින් පවත්වනු ලබන චාරිත්‍රානුකූල භාසංස්කෘතිකමය රඟුම්.

ඉ. ප්‍රධාන උත්සවයේදී මෙන්ම ගුවන තුලට පිවිසීමේදී හා පිටවීමේදී පවත්වනු ලබන ගෞරවාචාර මුර සේවා

ඊ. පාර්ලිමේන්තු පරිශ්‍රයේ රණවිරු ස්මරණස්තස්භය ඉදිරිපිට උත්සවය (වැඩ සටහනෙහි ඇතුළත් කර ඇත්නම්)

උ. වෛද්‍යවරයෙකුගේ, හෙදියකගේ සේවය හා ගිලන් රථයක් සැපයීම

ඌ. ප්‍රභූන් සඳහා ගුවන් ගමන් පහසුකම් සැපයීම සම්බන්ධීකරණය.

එ. ප්‍රභූන් සම්ප්‍රාප්ත වීමට පෙර, පවත්වන පූර්ව-ආරක්ෂා වැඩ පිළිවෙළ සම්බන්ධීකරණය.

## 11.4 අනාගත අපේක්ෂා

ඉදිරි වර්ෂයේදී හමුදාමය සම්බන්ධතා අංශයේ වගකීම යටතේ ගැනෙන ක්ෂෙත්‍රයන්හි ආරක්ෂාව ආශ්‍රිත විචක්ෂණ ක්‍රියාදාමයන් සහ වර්තමාන රජයේ මූලාරම්භයන් කෙරෙහි දක්වන සහයෝගය අංශයේ උපරිම ධාරිතාවය භාවිතා කරමින් පිරිනැමිය යුතුව ඇත. ජාතික අවශ්‍යතාවයන් පදනම් කොට ගෙන හමුදාමය සම්බන්ධතා අංශයට පැවරෙන විශේෂ ව්‍යාපෘති හා කාර්ය භාරයන් භාර ගෙන සම්බන්ධීකරණය කිරීම අත්‍යාවශ්‍යය. ඉහත දක්වන ලද කාර්ය භාරයන්ගේ සාර්ථකත්වය උදෙසා ත්‍රිවිධ හමුදාවන්ගේ සක්‍රීය සම්බන්ධීකරණය අව්‍යාජ වෘත්තීමය පදනමක් මත පවත්වා ගෙන යා යුතු වෙයි. සඳහිරු සෑයේ ඉදි කිරීම් කටයුතු ත්‍රිවිධ හමුදා, සිවිල් ආරක්ෂක බලකාය හා පොදු මහජනතාවගේ සම්බන්ධීකරණයෙන් අඛණ්ඩව කරගෙන යා යුතු වෙයි.

# ආයතනවල කාර්ය සාධනය

# 12
# වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව

## 12.1 සමාලෝචනය

සමුද්‍රාසන්න පරිසරයෙහි ආරක්ෂාව හා ප්‍රසන්නභාවය තහවුරු කර ගැනීමේ පර්මාර්ථයෙන් ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව ස්ථාපිතකර ඇත. සමුද්‍රරෙහි නීතිය බලාත්මක කිරීමේ ආයතනය වන ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව දිවයින සතු ජාතිකමය වැදගත්කමකින් යුත් මෙකී දේපළ ආරක්ෂා කර ගැනීමේ භාරදූර හා අත්‍යවශ්‍ය කාර්යය පැවරී ඇත. අපගේ සමුද්‍ර බල ප්‍රදේශයෙහි නීති විරෝධී කර්තව්‍යයන්හි නියැලී සිටින්නාවූ නැව්, යාත්‍රා සහ පුද්ගලයින් විමර්ෂණයකින් පසු අත්අඩංගුවට ගැනීමේ නෛතිකමය බලයත්, අනතුරුව වරදකරුවන් නීතිය හමුවට ගෙන ඒමේ වගකීමත් මෙම ආයතනය සතු වේ.

දැනට මෙම ආයතනයේ කාර්ය මණ්ඩලය නිලධාරින් 64 දෙනෙකුගෙන් හා නාවිකයින් 964 දෙනෙකුගෙන් සමන්විතය. ඔවුහු පහත දැක්වෙන වෙරළාරක්ෂක ස්ථාන, ජීවිතාරක්ෂක මුරපළ හා සංචරණ යාත්‍රාවල සේවයේ යොදවා සිටිති.




## 12.2 2014 වසරේදී මුදුන්පමුණුවා ගැනීම්

### 12.2.1 මෙහෙයුම්

2014 වසරේදී, ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක ආයතනය විසින්, පැවරී ඇති කාර්ය භාරයට අනුව, මෙහෙයුම් ක්‍රියාදාමයන් විශාල සංඛ්‍යාවක් ඉටු කර ඇති අතර, ප්‍රධානතම මෙහෙයුම් ක්‍රියාදාමයන් සමහරක් පහත විස්තර කෙරේ.


අ. ජීවිතාරක්ෂක මෙහෙයුම්
ආ. නීති විරෝධී ක්‍රියාකලාප නිෂ්ප්‍රභා කිරීම සඳහා වෙරළ ආවේක්ෂණය
ඇ. නීති විරෝධී, නියාමනය නොකෙරෙන හා වාර්තාකරණය නොවූ මාළුඇල්ලීම
ඈ. ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩ සටහන්
ඉ. සෝදිසි කොට විපතින් බේරා ගැනීමේ මෙහෙයුම්
ඊ. නීතිය බලාත්මක කිරීමේ මෙහෙයුම්
උ. පර්යේෂණ හා සංවර්ධනය

ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක ආයතනය, තමන් සතු සීමිත සම්පත් භාවිතයට ගෙන, 2014 වසර මුළුල්ලේ, යථෝක්ත කාර්ය භාරය සක්‍රිය හා කාර්යක්ෂම ලෙස මැනවින් ඉටු කර ඇත.

#### 12.2.1.1 ජීවිතාරක්ෂක මෙහෙයුම්

පහත දක්වා ඇති ජීවිතාරක්ෂක මුරපොළවල සුදුසුකම් ලත් ජීවිතාරක්ෂකයින් වසර මුළුල්ලේ සේවයේ නියැලී සිටිති. 2014 වසරේදී විදේශිකයින් 22 ක් ඇතුලු පුද්ගලයින් 127 දෙනෙකුගේ ජීවිත ආරක්ෂා කර ගැනීමට ඔවුහු සමත් වූහ.

ප්‍රස්ථාරය 11.1 වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් 2014 වසරේදී බේරාගත් ජීවිත



## 12.2.1.2 නීති විරෝධී ක්‍රියාකලාප නිෂ්ප්‍රභා කිරීම සඳහා වෙරළ ආවේක්ෂණය

ආයතනය සතු සියලුම යාත්‍රා ඒකක දිවයින වටා, ශ්‍රී ලංකා ආධිපත්‍යය යටතේ ඇති සමුද්‍ර බල ප්‍රදේශයේ සිදුවන නීතිවිරෝධී ක්‍රියා පිටුදැකීමේ කාර්යයෙහි යොදවා ඇත. අධිවේගී සංචාරණ යාත්‍රා (FPC) සියල්ල සහ වෙරළාසන්න සංචරණ යාත්‍රාවලින් (IPC) වැඩි සංඛ්‍යාවක් උතුරුකර සමුද්‍රයේ සේවයේ යොදවා ඇති අතර, ඉතිරි වෙරළාසන්න සංචරණ යාත්‍රා දකුණු වෙරළ තීරයෙහි තෝරාගත් ධීවර වරායවල සේවයේ යොදවා තිබේ. ඉහත දක්වන ලද කාර්ය භාරයන්ට අමතරව, සමහර වෙරළාසන්න සංචරණ යාත්‍රා ජීවිත බේරා ගැනීමේ කටයුතු වල මෙන්ම, මිරිස්ස වැනි වෙරළ තීරයන්හි තල්මසුන් නිරීක්ෂණය කළමණාකරණය කිරීමේ කාර්යයෙහි නියැලී සිටිති.

## 12.2.1.3 නීති විරෝධී, නියාමනය නොකෙරෙන හා වාර්තාකරණය නොවූ මාළු ඇල්ලීම




දිවයිනේ පහත දක්වා ඇති ධීවර වරායන්හි සේවයේ නියුතු මෙම ආයතනයෙ සේවක පිරිස් නීති විරෝධී, නියාමනය නොකෙරෙන හා වාර්තාකරණය නොවූ මාළු ඇල්ලීම නතර කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලදී. ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව අනාගතයේදී සිය සේවාව තව දුරටත් පුළුල් කිරීමට අපේක්ෂා කරන අතර එමගින් නීති විරෝධී මසුන් ඇල්ලීම නතර කිරීමට ඉදිරියේදී හැකිවනු ඇත.

## 12.2.1.4 ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩ සටහන්

වෙරළ තීරයෙහි පදිංචි සිවිල් වැසියන්ගේ ප්‍රයෝජනය සඳහා, පහත දැක්වෙන විෂයයන් ට අදාල වූ ප්‍රජා දැනුවත් කිරීමේ ක්‍රමික වැඩ සටහන් වසර පුරා ක්‍රියාත්මක කරන ලදී.

- i. සමුද්‍රය තුළ ජීවිත ආරක්ෂාව
- ii. සමුද්‍ර දූෂණය වැළැක්වීම
- iii. වෙරළ ආරක්ෂාව
- iv. ජීවිත ආරක්ෂාව
- v. වෙරළ පවිත්‍ර කිරීමේ වැඩ සටහන්
- vi. නීති විරෝධී මසුන් ඇල්ලීම වැළැක්වීම සඳහා ධීවර ප්‍රජාව
- vii. දැනුවත් කිරීමේ වැඩ සටහන්

## 12.2.1.5 සෝදිසි කොට, විපතින් බේරා ගැනීමේ මෙහෙයුම්

සීමිත සම්පත් භාවිතා කරමින්, සෝදිසි කොට ජීවිත බේරා ගැනීමේ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවට සහ ශ්‍රී ලංකා පොලිසියට සහාය ලබා දී ඇත.






## 12.2.1.6 නීතිය බලාත්මක කිරීමේ මෙහෙයුම්

අපගේ සමුද්‍ර බල ප්‍රදේශයෙහි නීතිය බලාත්මක කිරීමේ මෙහෙයුම් ක්‍රියාත්මක කර ඇති අතර, ස්වකීය ඒ ඒ කාර්ය භාරයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය සහයෝගය දිවයිනේ අනෙකුත් නීතිය බලාත්මක කිරීමේ ආයතන සහ රජයේ ආයතන වෙත ද ලබා දී ඇත. උදාහරණ: පොලිස් දෙපාර්තමේන්තුව, ධීවර දෙපාර්තමේන්තුව සහ වනජීවී දෙපාර්තමේන්තුව.

මෙම ආයතනය ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහ ඉන්දියානු වෙරළ ආරක්ෂක සේවයේ සහයෝගය ද ඇතිව, ආපසු සියරටට යැවීමේ මෙහෙයුම් ගණනාවක්ම සාර්ථකව ඉටු කර ඇත.

12.2 ප්‍රස්තාරය: 2014 වසර තුළ සියරටට යවන ලද ධීවරයින්ගේ විස්තර



-  ඉන්දියානු වෙරළ ආරක්ෂක සේවාව විසින් මෙරටට එවන ලද ශ්‍රී ලාංකික ධීවරයින්ගේ
-  සංඛ්‍යාව - 349
-  ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක සේවාව විසින් එරටට යවන ලද
-  ඉන්දියානු ධීවරයින්ගේ සංඛ්‍යාව - 600

### 12.2.1.7 පර්යේෂණ සහ සංවර්ධනය

කොළඹ විශ්ව විද්‍යාලයේ, පරිගණක පීඨය විසින් සැලසුම් කරණ ලද යාත්‍රා ප්‍රවාහන මෙහෙයුම් ක්‍රමවේදයක් (VTMS) පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති යටතේ, ආයතන මූලස්ථානයේ මෙහෙයුම් කාමරයට පරීක්ෂණ මට්ටමින් හඳුන්වා දෙනු ලැබීය. මෙම ක්‍රමවේදය වෙරළ ආරක්ෂක ආයතනයේ අවශ්‍යතාවයන්ට ගැලපෙන අයුරු සකස් කර ඇති අතර, ආයතනයේ විද්වතුන්ගේ මෙහෙයුම් උපදේශනයන් ප්‍රකාරව යාවත්කාලීන කර ඇත. දැනට, මෙම ක්‍රමවේදය ආයතනයේ අවශ්‍යතාවයන්ට හොඳින් ගැලපෙන, ආයතනයේ නෛසර්ගික ක්‍රමවේදයක් බවට පත් කර ගැනීම සඳහා, තවදුරටත් කළ යුතු වැඩි දියුණු කිරීම් හඳුනා ගැනීම පිණිස ආයතනයේ නිලධාරින් විසින් මෙම ක්‍රමවේදය පරීක්ෂණ මට්ටමින් භාවිතා කෙරේ.

### 12.2.1.8 විදේශීය දූත පිරිස් හා සමග අන්‍යොන්‍ය ක්‍රියාදාමයන් ගොඩ නගා ගැනීම

ඕස්ට්‍රේලියානු මායිම් ආරක්ෂක සේවය, ඉන්දියානු වෙරළ ආරක්ෂක සේවය, ජපාන වෙරළ ආරක්ෂක සේවය සහ එක්සත් ජනපද වෙරළ ආරක්ෂක සේවය වැනි ලෝකයේ ප්‍රමුඛතම වෙරළ ආරක්ෂක ආයතනවල විදේශීය දූත පිරිස් හා සමඟ ධනාත්මක අන්‍යොන්‍ය ක්‍රියාදාමයන් ගොඩ නඟා ගැනීමට ආයතනය කටයුතු කර ඇත. ආයතනයේ මෙහෙයුම් හැකියාවන් සහ ධාරිතාවයන් ධනාත්මකව වර්ධනය කර ගනිමින්, කලාපීය මෙන්ම ගෝලීය නාවික සහයෝගිතාවය විවිධ ආකාරයෙන් ප්‍රවර්ධනය කර ගැනීමට මෙකී ක්‍රියාදාමයන් ගෙන් මග පෑදෙනු ඇත.

මෙම අන්තර්ක්‍රියා ප්‍රගතිශීලී ආකාරයට SLCG මෙහෙයුම් හැකියාවන් සහ කුසලතා වැඩි දියුණු කරන අතර බොහෝ ගර්ම කලාපීය වශයෙන් මෙන්ම ගෝලීය සහයෝගීතාව මුහුදු වැඩි කිරීමට මග පෑදී තිබේ·

විදේශ නාවික සංවිධානල විශේෂයෙන් විදේශ වෙරළ ආරක්ෂක බලකාය සමග සාධනීය අන්තර් සහයෝගීතාව ඵලදායී කලාපීය ගාමක සාධකයක් වේ. එපමණක් නොව මෙම කාර්යභාරය අනිවාර්යෙන්ම කලාපය තුල හැකි වෙරළ ආරක්ෂක ලෙස සනාථ කිරීමට SLCG සඳහා පහසුකම් සලසනු ඇත·

### 12.2.2 පුහුණු කිරීමේ ක්‍රියාදාම

වෙරළ ආරක්ෂක සේවයේ නියුතු පුද්ගලයන්ගේ කුසලතා, තාක්ෂණික දැනුම සහ වෘත්තීමය හැකියාවන් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින්, 2014 වසරේදී වෙරළ ආරක්ෂක සේවයට අදාල විෂයයන් මත පුහුණු වැඩ සටහන් විශාල සංඛ්‍යාවක් ආයතනය විසින් ක්‍රියාත්මක කර ඇත. මෙයට අමතරව, ජීවිත බේරා ගැනීමේ උපායමාර්ග සම්බන්ධයෙන් සිවිල් ප්‍රජාව දැනුවත් කිරීම සඳහා ජීවිත බේරා ගැනීමේ පාඨමාලා ගණනාවක් පවත්වන ලදී.

2014 වසරේදී, ශ්‍රී ලංකා ජීවිතාරක්ෂක සංගමය සහ ඕස්ට්‍රේලියාවේ, වික්ටෝරියා ජීවිතාරක්ෂක සංගමය හා එක්ව, ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක ආයතනය විසින් මිරිස්සේ පුහුණු මධ්‍යස්ථානයේදී, ‘සිල්ව මෙඩලියන්’ ජීවිතාරක්ෂක පාඨමාලාව ආරම්භ කෙරිණ.

ඕස්ට්‍රේලියාව, ජපානය, ඇමෙරිකා එක්සත් ජනපදය සහ ඉන්දියාව ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක ආයතනයේ නිලධාරින් හා වෙරළ ආරක්ෂකයින් සඳහා විදේශිය පුහුණු අවස්ථා පිරිනමා ඇත. මෙකී විදේශීය පාඨමාලා ප්‍රධාන වශයෙන් යොමු කර ඇත්තේ වෘත්තීමය වෙරළ ආරක්ෂක පුහුණුව, අභ්‍යාස හා ඒවායේ භාවිතය යන විෂයයන් කෙරෙහිය. විදේශීය ක්‍රමවේදයන්ට නිරාවරණය වීමට අමතරව, කලාපීය සහයෝගිතාවය වර්ධනය කර ගැනීම, තොරතුරු, දැනුම සහ පළපුරුද්ද බෙදාහදා ගැනීම සහ නව මිත්‍රත්වයන් ඇති කර ගැනීම මෙකී විදේශීය පුහුණු පාඨමාලා අධ්‍යයනය හරහා ආයතනයේ නිලධාරින්ට හිමිවූ ප්‍රතිලාභ සේ සැළකිය හැකිය.

### 12.2.3 ධාරිතා වර්ධන ක්‍රියාකාරකම්

ආයතන නිලධාරින්ගේ ධාරිතා වර්ධනය උදෙසා, දේශීය පාර්ශවකරුවන් මෙන්ම විදේශීය වෙරළ ආරක්ෂක සේවා සහ නාවික හමුදා සමග ඒකාබද්ධ ව්‍යායාමයන් වැනි ධාරිතා වර්ධන ක්‍රියාකාරකම් ආයතනය විසින් වර්ෂය මුළුල්ලේම පවත්වා ගෙන යන ලදී. එසේම, විවිධ විදේශීය රටවල් පුහුණු ආධාර සපයන ලද අතර, ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක ආයතනය තුළ, තෙල් ඉහිරීමකදී ප්‍රතිචාර දැක්වීමේ විශිෂ්ඨ සංයුතියකින් සමන්විත ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම සඳහා ජපානයේ වෙරළ ආරක්ෂක ආයතනය විසින් සහාය ලබා දී ඇත. මෙම ක්‍රමවේදය භාවිතා කිරීමේ අරමුණ වන්නේ තෙල් ඉහිරීමකදී නියමිත ප්‍රතිචාර දැක්වීම සඳහා විශිෂ්ඨ සුදුසුකම් ලත් හා අත්‍යාවශ්‍ය මෙවලම් වලින් සමන්විත ජාතික ප්‍රතිචාර

කණ්ඩායමක් ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක ආයතනය තුළ බිහි කිරීමයි.





### 12.2.4 ඉදිකිරීම්/තාක්ෂණික ප්‍රධානතම ක්‍රියාකාරකම්

පොදු තාක්ෂණික කරුණු ආශ්‍රිතව, නාවික ඉංජිනේරු, විදුලි ඉංජිනේරු, සිවිල් ඉංජිනේරු සහ ඔටෝ මොබයිල් ඉංජිනේරු යන ක්ෂේත්‍රයන්හි සැලසුම් හා ක්‍රමවේද සම්පාදනයෙහි ලා වගකීම දරන්නේ තාක්ෂණික හා ඉදිකිරීම් ශාඛාවයි. 2014 වසරේදී ක්‍රියාත්මක කරන ලද ප්‍රධානතම ඉදිකිරීම් අතර, දීප ව්‍යාප්ත ජීවිතාරක්ෂක ස්ථාන, ස්ථාපනය කිරීම කැපී පෙනේ. එසේම, කිරින්දේ ස්ථාපනය කරන ලද කිමිදුම් මධ්‍යස්ථානය සහ සූර්ය බලයෙන් ක්‍රියා කරන මාපක ක්‍රමවේදය ද මෙම ආයතනයේ තාක්ෂණික අංශය විසින් සාක්ෂාත් කර ගන්නා ලද ප්‍රධානතම ඉදි කිරීම් අතර වෙයි.

එසේම, සුළං මෝල හා සූර්ය බලය උපයෝගී කර,අඩු පිරිවැයකින්, පරිසර හිතකාමී ලෙස විදුලිය ජනනය කිරීම සාක්ෂාත් කර ගැනීම ආයතනයේ අපේක්ෂාවයි.

**12.1 වගුව : 2014 වසරේදී සම්පූර්ණ කරන ලද ප්‍රධානතම ඉදිකිරීම් ව්‍යාපෘති.**

| ව්‍යාපෘතිය | ප්‍රගතිය |
|---|---|
| දෙහිවල සහ හික්කඩුවේ ජීවිතාරක්ෂක මුරපොල තැනීම සහ බෙන්තොට ජීවිතාරක්ෂක මුරපොළ අලුත්වැඩියා කිරීම | සාර්ථකව නිම කර ඇත |
| කිරින්ද කිමිදුම් මධ්‍යස්ථාන සංවර්ධන ව්‍යාපෘතිය | සාර්ථකව නිම කර ඇත |
| දික් ඔවිට නිලධාරි නිවාස, පොදු නිවස්නය සහ කාර්යාල සංකීර්ණය | සාර්ථකව නිම කර ඇත |
| ඔලුවිල් නිලධාරි රැස්වීම් ශාලාව | සාර්ථකව නිම කර ඇත |
| දික් ඔවිට කණිෂ්ඨ නාවික නිවස්න ගොඩනැගිල්ල | සාර්ථකව නිම කර ඇත |
| සූර්ය තාපයෙන් ක්‍රියාකරණ විදුලි බලාගාර | සූර්ය තාපයෙන් ක්‍රියා කරණ කි.වො. 21 ක විදුලි බලාගාරය මිරිස්සේ ස්ථාපිත කර ඇති අතර, විදුලි බිල අඩු වී ඇත. |
| මිරිස්සේ, යාත්‍රා ප්‍රවාහන මෙහෙයුම් ක්‍රමවේදය | මිරිස්සේ, යාත්‍රා ප්‍රවාහන මෙහෙයුම් ක්‍රමවේදය, කොළඹ විශ්ව විද්‍යාලයේ අනුග්‍රහයෙන්, මිරිස්සේ වෙරළ ආරක්ෂක ආයතන මූලස්ථානයේ ස්ථාපිත කර ඇත. |
| කිරින්ද වෙරළ ආරක්ෂක ආයතනයේ රේඩාර් විමරශනාරය | කි.වො. 12 ක රේඩාර් විමරශනාරය කිරින්ද වෙරළ ආරක්ෂක ස්ථානයෙහි ස්ථාපිත කර ඇත. ප්‍රදේශයේ නීති විරෝධී නාවික කටයුතු වැළැක්වීමට බෙහෙවින්ම ප්‍රයෝජනවත්ය. |
| වෙරළ ආරක්ෂක ආයතනයේ ප්‍රධානතම කාර්යස්ථානවල අධි සංඛ්‍යාත සංනිවේදන ක්‍රමවේද | නව අධි සංඛ්‍යාත සංනිවේදන ක්‍රවේදයක් රෝහණ වෙරළ ආරක්ෂක ආයතනයෙහි ස්ථාපිත කර ඇත. |









**12.2 වගුව : සපුරා නොගත් ඉලක්ක හා 2015 වසරට කල්දැමූ වැඩ විෂයයන්**

| ව්‍යාපෘතිය | ප්‍රගතිය |
|---|---|
| උනවටුනේ සහ මොරගොල්ලේ ජීවිතාරක්ෂක මුරපොළ ස්ථාපනය | ඉදි කෙරෙමින් පවතී. |
| සිමියුලේටරයක් සහිත මහල් දෙකක ගොඩනැගිල්ල | මිරිස්සේ ඉදි කෙරෙමින් පවතී. |
| මිරිස්ස, රෝහන වෙරළ ආරක්ෂක මධ්‍යස්ථානයේ ජොෂ්ඨ නිලධාරි නිවස්නය | සියයට 95 ක් නිම කර ඇත. |
| ඔලුවිල් කාර්යාල ගොඩනැගිල්ල | සියයට 50 කට වඩා නිම කර ඇත. |

**වෙනත්**

ඉහත දක්වා ඇති සාක්ෂාත් කර ගැනීම්වලට අමතරව, පහත දැක්වෙන සංයුක්ත සාමාජීය වගකීම් ද 2014 වර්ෂයේදී ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක ආයතනය විසින් ඉටු කර ගන්නා ලදී.

- ප්‍රදේශය අලංකාර කිරීමේ වැඩ සටහන් වැල්ලවත්ත, දෙහිවල, ගල්කිස්ස හා බලපිටිය යන වෙරළාසන්න ප්‍රදේශවල ක්‍රියාත්මක කෙරින.
- වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමණාකරණ දෙපාර්තමේන්තුවේ සහ පෞද්ගලික අංශයේ සහයෝගය ඇතිව, බම්බලපිටියේ සිට අම්බලන්ගොඩ දක්වා වැව්ලි වැඩ සටහන් ක්‍රියාත්මක කෙරිණ.
- රජයේ ආයතන හා සහසම්බන්ධතාවයෙන් ඩෙංගු වැළැක්වීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කෙරිණ.
- ධීවර ජනතාව උදෙසා දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කෙරිණ.
- බෝවීම සිදු කෙරෙන කාල පරාසය තුළ පොකිරිස්සන් ඇල්ලීම සම්බන්ධයෙන් නීතිමය ගැටලු ගැන අවධානය යොමු කරවන ලදී. එසේම, සමුද්‍රය තුළ ජීවිතාරක්ෂාව ගැනද දැනුවත් කෙරිණ.
- ජීවිත ආරක්ෂා කිරීමේ වැදගත්කම, ජීවිතාරක්ෂක ක්‍රමවේද, ජීවිතාරක්ෂක ජැකට්ටු පැළඳීමේ වැදගත්කම ආදී කරුණු ගැන පාසල් දරුවන් සහ විවිධ සාමාජීය කණ්ඩායම් දැනුවත් කිරීම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කෙරිණ.
- සිවිල් සමාජවල සහයෝගය ඇතිව, වෙරළ ආරක්ෂක ආයතනයේ නිලධාරින් වෙරළ පවිත්‍ර කිරීමේ ( බම්බලපිටිය සිට ගල්කිස්ස දක්වා) වැඩ සටහන් ක්‍රියාත්මක කළහ.
- ජපන් වෙරළ ආරක්ෂක නිලධාරින් 50 දෙනෙකු, ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක ආයතනයේ නිලධාරින් හා එක්ව දෙහිවල හා ගල්කිස්ස අතර වෙරළ පවිත්‍ර කිරීමේ වැඩ සටහන්වල නිරත වූහ.
- වෙරළ ආරක්ෂක ආයතනය විසින් ඩෙල්ෆ් මහා විද්‍යාලය සඳහා නව ගොඩනැගිල්ලක් 2014 ජනවාරි මස 29 වන තනා දෙන ලදී.
- උතුරු නාවික ප්‍රදේශයෙහි ධීවර ජනතාව උදෙසා ජීවිතාරක්ෂක ක්‍රමවේදය ගැන දේශනයක් 2014 ජූනි මස 27 වන දින පවත්වන ලදී.



## 12.3 විග්‍රහය හා අගැයීම

| 12.3 වගුව : වියදම් - රුපියල් මිලියන | | | |
|---|---|---|---|
| | ප්‍රතිපාදනය | වියදම් | ශේෂය |
| ප්‍රාග්ධන | 32 | 31.11 | 0.88 |
| පුනරාවර්තන | 32.66 | 28.40 | 4.25 |

2014 වසර අවසානයේදී පුනරාවර්තන වියදම් යටතේ රුපියල් මිලියන 4.2 ක් ශේෂ වීමට හේතු වූයේ:

- පෞද්ගලික පඩිනඩි ශ්‍රී ලංකා නාවික හමුදාවෙන් සෘජුවම ලැබීම නිසා, වැටුප් හා වේතන යටතේ ප්‍රතිපාදන වෙරළ ආරක්ෂක ආයතනය විසින් භාවිතයට නොගැනීම :

## 12.3.1 ප්‍රධානතම ව්‍යාපෘති

2014 වසරේදී භාරගන්නා ලද ප්‍රධානතම ව්‍යාපෘති වන්නේ:

- ඔලුවිල් වරාය පරිශ්‍රයේ නිලධාරි රැස්වීම් ශාලාව - දළ ව්‍යාපෘති පිරිවැය - රුපි. මිලියන 3·2
- දික් ඕවිට වරාය පරිශ්‍රයේ පරිපාලන ගොඩනැගිල්ල - දළ ව්‍යාපෘති පිරිවැය - රුපි. මිලියන 1·9
- පහත දැක්වෙන ස්ථානවල ජීවිතාරක්ෂක මුරපොල - හික්කඩුව - දළ ව්‍යාපෘති පිරිවැය - රුපි. මිලියන 2
- දෙහිවල - දළ ව්‍යාපෘති පිරිවැය - රුපි. මිලියන 2
- වෙරළ ආරක්ෂක ආයතන රෝහන තෙමහල් නිලධාරි නිවස්නය
- ගොඩනැගිලි සැලැස්ම සහ වාස්තු විද්‍යාත්මක සිතියම් නිම කර, පාංශු විමර්ෂණයන් පවත්වා ඇත.

ගොඩනැගිලි සැලැස්ම සහ වාස්තු විද්‍යාත්මක සිතියම් නිම කර, පාංශු විමර්ෂණයන් පවත්වා ඇත.

## 12.3.2 අගැයීම් හා උගත් පාඩම්

වෙරළ ආරක්ෂක ආයතන රෝහන ජ්‍යෙෂ්ඨ නිලධාරි නිවස්න 06 ඉදිකිරීම

- ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව තැනීම් කටයුතු ආරම්භ කෙරිණ. ගොඩනැගිලි හා ව්‍යුහ වැය ශීර්ෂ 325-01-01-2104 යටතේ සලසා දෙන ලද ප්‍රතිපාදන ව්‍යාපෘතියේ සමස්ත වැය දැරීමට ප්‍රමාණවත් නොවූ හෙයින්, වැය ශීර්ෂ 325-01-01-2103 (යන්ත්‍රෝපකරණ හා මෙවලම්) න් අරමුදල් මාරු කර දෙන ලෙස ඉල්ලීමක් ආරක්ෂක අමාත්‍යාංශය හරහා මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කරන ලදී.
- කෙසේවුවද, වැය ශීර්ෂ 325-01-01-2103 (යන්ත්‍රෝපකරණ හා මෙවලම්) යටතේ වූ ශේෂය වෙරළ ආරක්ෂක ආයතනයට හෝ ආරක්ෂක
- ඇණවුම් කරන ලද නිල ඇඳුම් සැපයුම්කරුවන් විසින් 2014 වසර අවසානයේදී නො සැපයීම.

අමාත්‍යාංශයටවත් නොදන්වා මහ භාණ්ඩාගාරය විසින් ආපසු ගෙන තිබූ හෙයින්, ඉහත කී අරමුදල් මාරු කිරීම සඳහා අනුමැතිය නොලැබුණි.

- එසේම, ගොඩනැගිල්ලේ හදිසි අවශ්‍යතාවය නිසා, ගිවිසුම ප්‍රකාර අත්තිකාරම් ගෙවීමක් සිදුකර, සැලසුම් කරණ ලද පරිදි ඉදි කිරීම කටයුතු ආරම්භ කරණ ලද අතර, ශේෂිත ගෙවීම් 2015 වසර සඳහා දීර්ඝ කර ඇත.

## 12.4 ගැටළු සහ අභියෝග

අනුයුක්ත කරන ලද කාර්ය භාරයන් ක්‍රියාත්මක කිරීමේදී වෙරළ ආරක්ෂක ආයතනයට මුහුණ පෑමට සිදුවූ ප්‍රධානතම ගැටළු ගණනාවකි. එනම් :

අ. ප්‍රමාණවත් නොවූ මානව සම්පත්
ආ. සීමිත මෙහෙයුම් ක්‍රියාදාම හා උපකරණ
ඇ. සීමිත අයවැය ප්‍රතිපාදන

මෙකී ගැටළුවල ස්වභාවය අනුව, වෙරළ ආරක්ෂක ආයතනය තුළ සෑම මට්ටමකින්ම (ක්‍රියාකාරිත්ව හා සංවිධානාත්මක මට්ටම්) මෙකී ගැටළුවල බලපෑම ඉස්මතු වන්නට විය. විදේශීය වෙරළ ආරක්ෂක ආයතන විසින් සපයන ලද වෘත්තීමය පුහුණු පාඨමාලා හේතුවෙන් ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක ආයතනයේ නිලධාරින්ගේ වෘත්තීයවේදීත්වය ක්‍රම ක්‍රමයෙන් වඩාත් හොඳ මට්ටමකට ඔප්නැංවී තිබුණි. එහෙත් මෙහෙයුම් ක්‍රියාදාම, උපකරණ හා මූල්‍යමය ධාරිතාවය සීමිත තත්ත්වයක පැවතීම නිසා, එකී වෘත්තීයවේදීත්වය ඉතා පහළ මට්ටමකින් භෞතිකමය වශයෙන් භාවිතයට ගැනීම සිදුවිය.

2014 වසරේදී වෙරළ ආරක්ෂක ආයතනයේ මිනිස් ශ්‍රම බලකාය නොවෙනස්ව පවතිද්දී, ආයතනට පැවරෙන වගකීම්, භූමිකා සහ කාර්ය භාරයන් ඉතා උග්‍ර ලෙස ඉහළ යන්නට විය. මෙහි ප්‍රතිඵලය වූයේ ආයතනයෙහි, උප කාර්යස්ථානවල. කාර්ය ස්ථානවල සහ කලාපීය වශයෙන්ද, මෙහෙයුම් හා පරිපාලන ගැටළු හා දුෂ්කරතා පැනනැගීමය.

ඉහත කී ගැටළු මින් ඉදිරියටත් එසේම පැවතුනහොත්, ආයතනයේ අපේක්ෂිත ඉලක්ක සාක්ෂාත්කර ගැනීමෙහි ලා, එකී ගැටළු සපුරාගත

නොහැකි ඉලක්ක හා අභියෝග බවට පත්වනු ඇත. එම නිසා, අනාගත අභියෝග අවම කර ගැනීමට නම්, ඉහත සඳහන් ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා උපකාරී වන විසඳුම් සොයා ගැනීම අවශ්‍ය බව සැළකේ.

## 12.5 අනාගත අපේක්ෂා

ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක ආයතනයේ සංවිධානාත්මක ධාරිතාවයන් මධ්‍ය කාලීනව (2016-2018) වර්ධනය කර ගැනීම සඳහා පහත දැක්වෙන ක්‍රියාමාර්ගයන් ක්‍රියාත්මක කළ යුතු බව යෝජනා කෙරේ.

- උපලේඛනගත අනාගත සේවා අවශ්‍යතාවයන් සපුරා ගත හැකි වන පරිදි, ආයතනයේ සේවක සංඛ්‍යාව 1500 දක්වා ඉහළ නැංවීම.
- නව වෙරළාසන්න සෝදිසි යාත්‍රා 06 ක් ශ්‍රී ලංකා නාවික හමුදාවෙන් පවරා ගැනීම
- සෝදිසි යාත්‍රා 02 ක් ජපන් රජයෙන් ලබා ගැනීම
- සර්ව සම්පූර්ණ නාවික ජීවිතාරක්ෂක සම්බන්ධීකරණ මධ්‍යස්ථානයක් මිරිස්සෙහි ස්ථාපිත කිරීම
- දිවයිනේ වඩාත් ජනප්‍රිය වෙරළ ආශ්‍රිතව අ`ළුතින් ජීවිතාරක්ෂ මුරපොල ස්ථාපිත කිරීම සහ පවත්නා ජීවිතාරක්ෂක මුරපොලවල ජීවිතාරක්ෂක භටයින් උත්ප්‍රේරණය කිරීම
- අනෙකුත් ධීවර වරායවල ද නීති විරොධී මසුන් ඇල්ලීම වළකාලීම සඳහා මෙහෙයුම් ඒකක ස්ථාපනය කිරීම
- කිරින්දේ වෙරළාරක්ෂක භට පුහුණු පාසලක් ස්ථාපනය කිරීම
- මිරිස්ස හා බලපිටිය වෙරළාරක්ෂක ආයතනයේ පුහුණු මධ්‍යස්ථානයේ පුහුණු පහසුකම් වැඩි කිරීම
- වෙරළ ආරක්ෂක ආයතනයේ තෙල් ඉහිරීමට ප්‍රතිචාර දැක්වීමේ කණ්ඩායමේ කුසලතා සහ ධාරිතා වැඩි දියුණු කිරීම
- වෙනත් වෙරළ ආරක්ෂක ආයතන සමග සහයෝගිතාවය වැඩි දියුණු කිරීම

# 13
# ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

## 13.1 සමාලෝචනය

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රධානතම කාර්ය භාරය වන්නේ, ජාතික ආරක්ෂාව හා සාමාජීය සාමය රැකගැනීමට සහ ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමට අමතරව,පුද්ගලයින්ගේ ආගමනය හා විගමනය නියාමනය කරමින් පුරවැසිභාවයට අදාල සේවා සැපයීමයි.

**කාර්ය භාරය**

- ආගමනයට හා විගමනයට අදාල නීති හා රෙගුලාසි ක්‍රියාත්මක කිරීම
- විදේශ ගමන් සඳහා ශ්‍රී ලාංකිකයිනට ගමන් බලපත්‍ර නිකුත් කිරීම
- ශ්‍රී ලංකාවේ තොටුපළවල ආගමනය හා විගමනය පාලනය කිරීම
- විදේශීය රටවල බිහිවූ ශ්‍රී ලාංකික දරුවන් ශ්‍රී ලංකා පුරවැසියන් ලෙස ලියාපදිංචි කිරීම
- වෙනත් රටවල පුරවැසිභාවය හිමි ශ්‍රී ලාංකිකයනට ද්විත්ව පුරවැසිභාවය ලබා දීම
- ආගමන හා විගමන නීති උල්ලංඝණය කරමින් ශ්‍රී ලංකාවේ රැදී සිටින ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන පුද්ගලයින්ට විරුද්ධව නීති මගින් කටයුතු කිරීම
- ජාතික ආරක්ෂාව සුරකමින්, පවත්නා නීති හා රෙගුලාසි වලට යටත්ව, ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයින්ට වීසා නිකුත් කිරීම සහ දීර්ඝ කිරීම

## 13.2 2014 වසරේ මුදුන් පමුණුවා ගැනීම්

ගමන් බලපත්‍ර නිකුත් කිරීම සහ ආනුෂංගික කටයුතු, වීසා නිකුත් කිරීම හා ආනුෂංගික කටයුතු, වෙනත් රටවලින් ශ්‍රී ලංකාවට සංක්‍රමණය වන පුද්ගලයින් ඉවත් කිරීම, රටේ මායිම් කළමණාකරණය, වෙනත් රටවල උපත ලද ශ්‍රී ලාංකික දරුවන් ගේ උපත් ලියාපදිංචි කිරීම, ද්විත්ව පුරවැසිභාවය ලබා ගැනීමට අදාල කටයුතු සහ ඉන්දියානු ප්‍රභවයකින් යුත් පුද්ගලයින් ලියාපදිංචි කිරීම ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රධාතම කාර්ය භාරය වන්නේය.

මෙම කාර්ය භාරය මූලික වශයෙන් ගමන් බලපත්‍ර අංශය, මායිම් කළමණාකරණ හා වීසා අංශය, පරිගණක අංශය, පුරවැසිභාව අංශය සහ ඉන්දියන් ප්‍රභවයකින් යුත් පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබයි.

2014 වසරේදී, විදේශිකයින්ට ශ්‍රී ලංකාවේ සංචාරය සඳහා වීසා ලබා ගැනීම පහසු කරවනු වස් හා නියාමනය කරනු වස්, විදේශිකයින් සඳහා සංචාරක, ව්‍යාපාරික,සංක්‍රමණික, අනුග්‍රාහක වීසා වර්ග විද්‍යුත් සංචාර අධිකාරි ක්‍රමවේදය යටතේ සාර්ථකව ඉටු කරනු ලැබීය. මෙකී ක්‍රමවේදයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා සහ සුමට මෙහෙයුමක් තහවුරු කර ගැනීම සඳහා නවතම ලක්ෂණයන් මෙම ක්‍රමවේදයට එකතු කරනු ලැබීය. 2014 වසරේ දී ශ්‍රී ලංකාවට සම්ප්‍රාප්ත වූ විදේශීය සංචාරකයින් සංඛ්‍යාව 16,10,530 කි.

1948 අංක: 18 දරණ ද්විත්ව පුරවැසි පණත ප්‍රකාර, අදාල සියළුම දත්ත දෙපාර්තමෙන්තුවේ එක්රැස් කිරීම 2014 වසරේදී සාක්ෂාත් කර ගන්නා ලද සුවිශෙෂ කාර්ය භාරයකි. ඒ අනුව, ද්විත්ව පුරවැසි සහතිකවල පිටපත් නිකුත් කිරීම 2014 වසරේදී ආරම්භ කෙරිණ. එයට අමතරව, වෙනත් දත්ත මූලයන් පුරවැසි දත්ත මූලය හා සමග ඒකාබද්ධ කිරීමේ මූලික පියවර ගනු ලැබීය.

සියලුම ජාත්‍යන්තර ගුවන් තොටුපළවල හා වරායවල මායිම් කළමණාකරණයෙහි ප්‍රගතියක් 2014 දී දක්නට ලැබිණ. සරණාගත අයදුම්කරුවන් ලෙස ශ්‍රී ලංකාවේ රැඳී සිටි පකිස්තානුවන් 329 දෙනෙකු සහ ඇෆ්ගන්වරුන් 88 දෙනෙකු ස්වකීය මව් රටවලට පිටත් කර හරිනු ලැබීය.

*13.1* වගුව : ධාරිතා වර්ධන ක්‍රියාකාරකම්

| වැඩමුළු/වැඩසටහන්/සම්මන්ත්‍රණ | ඉලක්කගත කණ්ඩායම | පුහුණුලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| හුරුවීමේ පුහුණුව | වාර්ෂක ස්ථානමාරු මත එන නිලධාරීන් | 45 |
| සනීපාරක්ෂක සේවා පුහුණුව | සනීපාරක්ෂක සේවා කාර්ය මණ්ඩල | 25 |
| ආරක්ෂක ක්‍රියාකාරකම් පුහුණුව | ආරක්ෂක නිලධාරීන් | 20 |
| කාර්යාල ක්‍රම පදනම් කොටගත් ගැටලු | පළාත් කාර්යලවල සියළුම කාර්ය මණ්ඩල | |
| නීති වාර්තා සැකසීම | බලය ලත් නිලධාරීන් | 25 |
| පරිගණක පුහුණුව | කළමණාකාර සහකාර | 110 |
| හුරුවීමේ පුහුණුව- මහරගම | සංවර්ධන හා බලයලත් නිලධාරීන් | 110 |
| හුරුවීමේ පුහුණුව- පොලිස් අභ්‍යාස විද්‍යාලය, කළුතර | සංවර්ධන හා බලයලත් නිලධාරීන් | 110 |
| හුරුවීමේ පුහුණුව- වෘත්තීය තාක්ෂණික විශ්ව විද්‍යාලය, රත්මලාන | සංවර්ධන හා බලයලත් නිලධාරීන් | 110 |
| හුරුවීමේ පුහුණුව- ගුරු අභ්‍යාස විද්‍යාලය,මහරගම | සංවර්ධන හා බලයලත් නිලධාරීන් | 350<br>15 |
| හුරුවීමේ පුහුණුව අවසන් කිරීම- ප්‍රජා කලා කේන්ද්‍රය, පැලවත්ත | සංවර්ධන හා බලයලත් නිලධාරීන් | 350 |
| පරිගණක පුහුණුව | බලයලත් නිලධාරීන් | 15 |
| ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාදාමය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා නිලධාරීන් | 30 |
| පරිගණක පුහුණුව | බලය ලත් නිලධාරීන් | 12 |
| පරිගණක පුහුණුව | බලය ලත් නිලධාරීන් | 12 |
| නිරූපම පාරිභෝගික සත්කාරය ගැන වැඩ මුළුව- ධම්මික කලුපගේ | සියළුම කාර්ය මණ්ඩලය | 230 |
| *1962* හඳුන්වාදීම හා එහි කාර්ය භාරය | සංවර්ධන නිලධාරීන් | 16 |
| කාර්යාල ක්‍රමවල ප්‍රායෝගික ගැටළු | ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල නිලධාරීන් | 60 |
| විශේෂ විමර්ෂණ පුහුණුව - පොලිස් අභ්‍යාස විද්‍යාලය, කළුතර | බලය ලත් නිලධාරීන් | 20 |
| එම | එම | 20 |
| නාවික හමුදා නිලධාරීන් පුහුණු කිරීම | නාවික හමුදා නිලධාරීන් | 30 |
| ජංගම ගමන් ලේඛණ නිරීක්ෂණ මෙවලම් පුහුණුව | රාජ්‍ය බුද්ධි අංශයේ නිලධාරීන් | 30 |
| ද්විත්ව පුරවැසි හා වීසා ක්‍රියාදාම පුහුණුව | විධායක නිලධාරීන් | 52 |
| පෞරුෂත්ව වර්ධන පුහුණුව | ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරීන් | 24 |
| දමිළ ප්‍රවීණත්ව පාඨමාලා<br>පියවර *111*, පියවර *1*, උ/පෙළ | මණ්ඩලික නිලධාරීන්/කළමණාකාර සහකාර/ උපයෝගී සේවා | 115 |

## 13.3 ප්‍රසම්පාදන ක්‍රියාකාරකම්

සෑම වසරකම ආරම්භයේදී ප්‍රසම්පාදන සැලසුම අළුතින් සම්පාදනය කිරීමට ප්‍රසම්පාදන අංශය පියවර ගනී. අනතුරුව, එකී සැලසුම අනුව භාණ්ඩ හා සේවා මිළයට ගැණේ. *2014* වසරේ ප්‍රගතිය පහත දැක්වෙයි.

| 13.2. වගුව : 2014 වසරේ ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් | |
|---|---|
| විෂයය | වටිනාකම (රුපියල්) |
| කාර්යාලීය උපකරණ | 338,897.00 |
| වායු සමීකරණ | 2830,358.71 |
| printers, ෆැක්ස් යන්ත්‍ර හා ඡායාපිටපත් යන්ත්‍ර | 835,600.00 |
| වාහන | - |
| එකතුව | 4320800.71 |

13.3 වගුව : ප්‍රධාන කාර්යාලයේ සහ වෙනත් කලාපීය කාර්යාලවල ගමන් බලපත්‍ර නිකුත් කිරීම

| අංකය | සේවාව | ප්‍ර.කාර්යාලය | නුවර | මාතර | වවුනියාව |
|---|---|---|---|---|---|
| 1 | සියළුම රටවල් | 234943 | 26601 | 12733 | 14245 |
| 2 | මැද පෙරදිග | 198815 | 9748 | 2437 | 4990 |
| 3 | රාජකාරි | 1043 | 1 | 1 | - |
| 4 | හඳුණාගැනීමේ සහතිකපත් | 6 | - | - | - |
| 5 | රාජ්‍යතාන්ත්‍රික | 309 | - | - | - |
| 6 | හදිසි සහතිකපත්‍ර | 14786 | 5052 | 1235 | 485 |
| එකතුව | | 449902 | 41402 | 16406 | 19720 |

13.4 වගුව : ගමන් බලපත්‍ර අළුත් කිරීම හා සංශෝධන

| අංකය | සේවාව | එකතුව |
|---|---|---|
| 1 | අළුත් කිරීම හා සංශෝධන | 87,486 |

13.5 වගුව : ශ්‍රී ලංකාවට මගීන් පැමිණීම හා පිටවීම

| තොටුපළ | පැමිණීම | පිටවීම |
|---|---|---|
| බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ | 28,40,257 | 28,84,765 |
| හම්බන්තොට වරාය | 122 | 173 |
| මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ | 4,052 | 3,256 |
| කොළඹ වරාය | 6,710 | 7,196 |
| ගාලු වරාය | 22,658 | 20,143 |
| මන්නාරම වරාය | - | 1 |
| ත්‍රිකුණාමල වරාය | 398 | 384 |
| රත්මලාන ගුවන් තොටුපළ | 12 | 19 |
| එකතුව | 28,74,209 | 29,15,937 |

**13.6 වගුව : විමර්ශණ**

| මාසය | කඳවුරුවල රඳවා තිබූ විදේශකයින් සංඛ්‍යාව | නිදහස් කොට පිටරට යවන ලද විදේශිකයින් සංඛ්‍යාව |
|---|---|---|
| ජනවාරි | 31 | 13 |
| පෙබරවාරි | 18 | 20 |
| මාර්තු | 13 | 15 |
| අප්‍රියෙල් | 18 | 9 |
| මැයි | 5 | 5 |
| ජුනි | 6 | 17 |
| ජුලි | 4 | 13 |
| අගෝස්තු | 11 | 1 |
| සැප්තැම්බර් | 1 | 5 |
| ඔක්තෝම්බර් | 3 | 6 |
| නොවැම්බර් | 9 | 8 |
| දෙසැම්බර් | 12 | 12 |
| **එකතුව** | **131** | **124** |

**13.7 වගුව : නිකුත් කරන ලද වීසා හා දීර්ඝ කරන ලද වීසා සංඛ්‍යාව**

| වර්ගීකරණය | දීර්ඝ කිරීම් | නිකුත් කිරීම |
|---|---|---|
| ආයෝජන මණ්ඩල ව්‍යාපෘති | 4,015 | 2,464 |
| ශ්‍රී ලංකා දෙමාපියන්ගේ දරුවන් | 141 | 175 |
| CIT-5(2) | 0 | 1 |
| පූජ්‍ය පක්ෂය | 852 | 270 |
| උසාවි නඩු | 83 | 18 |
| රාජතාන්ත්‍රික | 13 | 9 |
| මුලින් ශ්‍රී ලාංකික | 2106 | 1516 |
| වෛද්‍ය හේතු | 284 | 290 |
| රාජ්‍ය නොවන සංවිධානරු/සමාජ සේවක | 460 | 260 |
| රාජකාරි | 243 | 282 |
| පෞද්ගලික අංශය | 2,337 | 2,701 |
| ලියා පදිංචි ඉන්දියානුවන් | 35 | 4 |
| ආගමික සේවකයින් | 317 | 431 |
| අමුත්තන්ට නේවාසික පහසුකම් දීමේ ක්‍රමය | 19 | 13 |
| ශ්‍රී ලංකා පුරවැසියන්ගේ කලත්‍රයින් | 3343 | 1084 |
| SSRV | 132 | 65 |
| රාජ්‍ය අංශය | 3,760 | 3,916 |
| ශිෂ්‍ය/ශිෂ්‍යත්ව හිමිකම් දරන්නන් | 3,868 | 3,686 |

13.8 වගුව : ඒ ඒ ශ්‍රේණි යටතේ පිරිනමන ලද පුරවැසිභාවය 2014.01.01 සිට 2014.12.31

| පුරවැසි භාවයේ වර්ගය | ලත් අයදුම්පත් සංඛ්‍යාව | නිකුත් කරණ ලද සහතිකපත් | මුද්‍රිත සහතිකපත් |
|---|---|---|---|
| වගන්ති 5(2) | 10128 | 11883 | 12955 |
| වගන්ති 8 | 6 | 0 | 9 |
| වගන්ති 11 | 54 | 0 | 51 |
| වගන්ති 12 | 13 | 0 | 13 |
| නේවාසික අමුත්තන්ගේ වැඩපිළිවෙළ | 1 | 0 | 0 |
| වගන්ති 19 | 366 | 11 | 552 |
| අත්හැරදැමීම් | 59 | 1 | 83 |
| **එකතුව** | **10627** | **11895** | **13663** |

13.9 වගුව: අළුත් කිරීම් සාරාංශය


| විස්තරය | සංඛ්‍යාව |
|---|---|
| තවත් ගමනක් | 473 |
| තනි ගමන අවලංගු කළ | 1151 |
| ද්විත්ව පුරවැසිභාවයේ වෙනස්කම් | 11 |
| දරුවන්ගේ නම් ඉවත් කිරීම | 2219 |
| හැඳුණුම්පත් අංකය එකතු කිරීම | 2070 |
| දරුවන්ගේ නම් එකතු කරීම | 1496 |
| විවාහයට පෙර නම | 16 |
| නම වෙනස්වීම් | 3119 |
| විවාහයට පසු නම | 2033 |
| වෙනත් සංශෝධන (නොමිළයේ) | 81 |
| වෙනත් සංශෝධන 01 | 28669 |
| වෙනත් සංශෝධන 02 | 913 |
| වෙනත් සංශෝධන 03 | 17 |
| වෙනත් නම් සංශෝධන | 3 |
| වෘත්තීය වෙනස්වීම | 66922 |
| අළුත් කිරීම් | 2368 |
| දරුවන්ගේ නම් යාවත්කාලීන කිරීම | 135 |

13.10 වගුව : තොටුපළ ශාඛා ආදායම් වාර්තාව- 2014- රුපි. මිලියන

| මාසය | Bond Stickers ආදායම | PPT Courier ආදායම |
|---|---|---|
| ජනවාරි | 4.138 | 1.734 |
| පෙබරවාරි | 3.678 | 1.774 |
| මාර්තු | 3.753 | 2.223 |
| අප්‍රියෙල් | 3.931 | 2.055 |
| මැයි | 4.016 | 2.435 |
| ජූනි | 3.319 | 2.841 |
| ජූලි | 3.624 | 2.617 |
| අගෝස්තු | 4.132 | 2.437 |
| සැප්තැම්බර් | 3.826 | 2.098 |
| ඔක්තෝම්බර් | 3.771 | 2.144 |
| නොවැම්බර් | 3.588 | 2.114 |
| දෙසැම්බර් | 4.418 | 1.769 |
| **උප එකතුව** | **46.194** | **26.241** |
| **මුළු එකතුව** | | **72.435** |

13.11 වගුව : පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් කාර්යසාධනය- 2008-2014 රුපියල් මිලියන

| වියදම | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|---|
| පුනරාවර්තන | 448.252 | 476.523 | 538.244 | 598.655 | 700.913 | 812.653 |
| ප්‍රාග්ධන | 280.373 | 166.646 | 363.843 | 85.230 | 650.721 | 640.799 |
| **එකතුව** | **728.626** | **643.169** | **902.088** | **683.885** | **1,351.635** | **1,453.453** |



# 14
# පුද්ගලයින් ලියා පදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

## 14.1. සමාලෝචනය


පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව 1972 වර්ෂයේදී පිහිටුවන ලද්දේ වයස අවුරුදු 18 හෝ ඊට වැඩි ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූල පදිංචිකරුවන් ලියාපදිංචි නිරීම සඳහා ය. දෙපාර්තමේන්තුවේ ප්‍රධානතම කාර්ය භාරය වන්නේ, සියළු ශ්‍රී ලාංකිකයන් ලියාපදිංචි කර, ලියාපදිංචි ලේඛණයක් නඩත්තු කිරීම, සුදුසුකම්ලත් පුරවැසියන්ට ජාතික හැඳුණුම්පතක් නිකුත් කිරීම, තොරතුරු සනාථ කර ගැනීම, සහතික කිරීම සහ එකී තොරතුරු ජාතික බුද්ධි අංශයන්ට හා ආරක්ෂක ආයතන වෙත ලබා දීමය.කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමට හා මහ ජනතාව වෙත වඩාත් ගුණාත්මක සේවයක් සැලසීම සඳහා 2014 වසරේදී පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් වැඩ සටහන් ගණනාවක්ම ආරම්භ කර ඇත.

පුද්ගලයින් ලියාපදිංචි කිරීම සඳහා ආරක්ෂිත, මධ්‍යගත විද්‍යුත් ගබඩාවක් සහ පුද්ගලයින්ගේ ජාතික ලේඛනයක් ස්ථාපිත කර, විද්‍යුත් ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා විද්‍යුත් හැඳුනුම්පත් (e-NIC Project) හඳුන්වාදීමේ ව්‍යාපෘතිය 2011 සිට ක්‍රියාත්මක වෙයි. මෙකී ක්‍රියාදාමය 2014 වසරේදී සැලෙන ප්‍රගතියක් අත් කර ගෙන ඇත.

## 14.2 මුදුන් පමුණුවා ගැනීම් සහ ක්‍රියාත්මක කරණ ලද ක්‍රියාකාරකම්වල විග්‍රහය


2008 වර්ෂයේදී රුපියල් මිලියන 257 ක් දෙපාර්තමේන්තුවේ සමස්ත වියදම 20-14 වසරේදී රුපියල් මිලියන 518 දක්වා ඉහළ ගොස් ඇත. ඉ.එන්අයිසී (ENIC) ව්‍යාපෘතිය සඳහා 2014 වසරේදී දරණ ලද වියදම රුපියල්

14.1 වගුව : සමස්ත වියදම 2008 - 2014




2005 වර්ෂයේදී 564,872 ක් වූ නිකුත් කරන ලද හැඳුනුම් පත් සංඛ්‍යාව 2014 දී 881,721 දක්වා ඉහල ගිය අතර, 2014 වසරේදී ලබන ලද ආදායම රුපියල් මිලියන 102 කි. මෙය 2005 වසර හා සසඳා බලන විට සියයට 65 ක වැඩිවීමකි. තොරතුරු හා සංනිවේදන තාක්ෂණ ආයතනයේ සහයෝගය ඇතිව, සිංහල හා දමිළ භාෂාවලින් හැඳුනුම්පත් මුද්‍රණය කිරීම 2014 වසරේදී, ආරම්භ කිරීමට

14.2 වගුව: ලද අයදුම්පත් සංඛ්‍යාව හා සසඳා බැලීමේදී නිකුත් කරණ ලද හැඳුණුම් පත් සංඛ්‍යවේපර්රතිශතය




දෙපාර්තමේන්තුවට හැකිවිය.

2014 වසරේදී, දෙපාර්තමේන්තු සේවකයින්ගේ ධාරිතා වර්ධනය සඳහා ධාරිතා වර්ධන වැඩ සටහන් 33 ක් පවත්වන ලදී.

ENIC ව්‍යාපෘතිය - ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමේ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ ඒකක ස්ථාපිත කිරීම, සූරියවැව, ආපදා නිවාරණ මධ්‍යස්ථානය පිහිටුවීම, ICAO මෘදුකාංග ලබා ගැනීම සහ දත්ත එක්රැස් කිරීමේ ක්‍රියාදාමය ආරම්භ කිරීම 2014 වසරේදී ENIC ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරන ලද ප්‍රධානතම කාර්යයන් ය.

**14.1 වගුව : ව්‍යාපෘතියේ භෞතිකමය හා මූල්‍යමය ප්‍රගතිය - 2014**

| ක්‍රියාකාරකම | භෞතිකමය ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|
| ශාඛා කාර්යාල පිහිටුවීම | ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමේ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ ඒකක 331 ක් ස්ථාපිත කෙරිණ.<br> <br>මැරිටයිම්පත්තු ප්‍රා.ලේ.කොට්ඨාශය වලිකාමම් දකුණ යාපනය | 30.4 |
| දෙපාර්තමේන්තු පරිශ්‍රයේ අලුත්වැඩියාවන් සහ නව දෙමහගු ගොඩනැගිල්ල ඉදි කිරීම | දෙපාර්තමේන්තු පරිශ්‍රයේ අලුත්වැඩියාවන් නිමකර නව දෙමහල් ගොඩනැගිල්ල ඉදි කිරීම ආරම්භ කෙරිණ.<br>  | 95.9 |
| ආපදා නිවාරණ මධ්‍යස්ථානය ඉදිකිරීම | සැලසුම් කිරීමේ හා ඉදිකිරීමේ පදනම මත මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශයට කොන්ත්‍රාත්තුව භාර දෙන ලදුව, සැලසුම් නිම කර ඇත.<br><br>2014 දෙසැම්බර් මස 11 වන දින මුල්ගල තබන ලදී. | 36.8 |
| පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත සංශෝධනය | පනතේ සංශෝධන කෙටුම්පත අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ සහ නීතිපතිගේ නිර්දේශය සමග දැනටමත් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. පාර්ලිමේන්තුවේ අනුමැතිය අපේක්ෂාවෙන් පසුවේ. | - |
| දත්ත අතින් රැස්කිරීමට | දත්ත රැස්කිරීමේ උපදෙස් මාලාව පිටපත් 15,000 ක් මුද්‍රණය කොට සියළුම | 84.2 |

| | | |
|---|---|---|
| අදාල IEC සකස් කිරීම | ග්‍රාම නිලධාරි කොට්ඨාශවලට නිකුත් කර ඇත.<br><br>තෙවර්ගයක දැන්වීම් පත්‍රිකා සහ දැනුවත් කිරීමේ පත්‍රිකා භාෂාත්‍රයෙන් මුද්‍රණය කර, සියළුම ග්‍රාම නිලධාරි කොට්ඨාශවලට නිකුත් කර ඇත.<br><br>ඇඟිලි සළකුණු ගැනීමට අවශ්‍ය ද්‍රව්‍ය මිළදී ගෙන, සියළුම ප්‍රා.ලේ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ ඒකක වෙත නිකුත් කර ඇත.<br><br>දත්ත එක්රැස් කිරීමේ අයදුම්පත්,ඇඟිලි සළකුණු කඩදාසි, උපදෙස් මාලා, කණ්ඩායම් පාලන වාර්තා මුද්‍රණය කර සියළුම ප්‍රා.ලේ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ ඒකක වෙත නිකුත් කර ඇත.<br><br>QR ස්ටිකර්ස් මුද්‍රණය නිම කර ඇත. | |
| දත්ත අතින් රැස්කිරීම සම්බන්ධයෙන් පාර්ශවකරුවන් පුහුණු කිරීම | දත්ත රැස්කිරීම සම්බන්ධයෙන් සියළුම ග්‍රාම නිලධාරි කොට්ඨාශ ආවරණය කරනු ලබන අභ්‍යාසලාභීන් 331 දෙනෙකු සඳහා පුහුණු වැඩ සටහන් පවත්වන ලදී.<br><br>ඇඟිලි සළකුණු ගැනීම සම්බන්ධයෙන් ග්‍රාම නිලධාරීන් පුහුණු කිරීම පිණිස පොලිස් දෙපාර්තමේන්තුවේ SOCO 70 දෙනෙකුගේ සහ පු.ලි.දෙපාර්තමේන්තුවේ 25 දෙනෙකුගේ ධාරිතා වර්ධනයට අවශ්‍ය පියවර ගන්නා ලදී.<br><br>සියලුම ග්‍රාමනිලධාරි කොට්ඨාශ ආවරණය වන පරිදි ඇඟිලි සළකුණු ගැනීම සහ දත්ත එක්රැස් කිරීම සම්බන්ධයෙන් පුහුණු වැඩ සටහන් පවත්වන ලදී.<br><br>අතින් දත්ත එකරැස් කිරීමේ වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා සංවර්ධන නිලධාරින් 771 දෙනෙකුගේ ධාරිතා වර්ධනය කරන ලදී.<br><br>දකුණු පළාතේ ඡායාරූප ශිල්පීන් 273 දෙනෙකු<br>ICAO ප්‍රමිතියට ඡායාරූපකරණයෙහි පුහුණු කරන ලදී.<br> | |

| | | |
|---|---|---|
| ජාතික පුද්ගල ලියාපදිංචි ලේඛනය සහ පුරුවැසියන්ගේ දත්ත එක්රැස් කර ඉ.ජා.හැඳුනුම්පත නිකුත් කිරීම සම්බන්ධයෙන් දේශපාලන අධිකාරිය සහ රජයේ නිලධාරීන් දැනුවත් කිරීම | දිස්ත්‍රික් 14 ක දිස්ත්‍රික් සම්බන්ධීකරන කමිටු හරහා දැනුවත් කිරීමේ වැඩ සටහන් පවත්වන ලදී. | - |
| දත්ත එක්රැස් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ වීම | 2014 අගෝස්තු මස 29 වන දින දකුණු පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 27 ක දත්ත එක්රැස් කිරීම ආරම්භ කෙරිණ. | |
| ICAO මෘදුකාංග ලබා ගැනීම | මොරටුව විශ්ව විද්‍යාලය ICAO මෘදුකාංග නොමිලයේ ලබා දෙන ලද අතර, ICAO ප්‍රමිතියේ ඡායාරූපකරණ මෘදුකාංග දකුණු පළාතේ පුහුණුව ලත් ඡායාරූප ශිල්පීන් 273 ට නිකුත් කරන ලදී. | |
| දත්ත ඩිජිටල්කරණය සඳහා සැපයුම්කරුවෙකු තෝරා ගැනීම | තෝරාගත් සැපයුම්කරුට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇත. | |
| තොරතුරු හා සංනිවේදන තාක්ෂණ යටිතල ව්‍යුහ වර්ධනය සඳහා සැපයුම්කරුවෙකු තෝරා ගැනීම | ලංසුකරුවන් 3 දෙනෙකුගෙන් මූල්‍ය යෝජනා ලැබී ඇති අතර, ඇගයීම් කෙරෙමින් පවතී. | |
| | | |

## 14.3 ගැටළු හා අභියෝග

පැවරී ඇති රාජකාරි කටයුතු වඩාත් සක්‍රියව හා කාර්යක්ෂම කර ගෙන යාමට ඇති ප්‍රධානතම බාධාව වන්නේ කාර්ය මණ්ඩල හිඟයයි. දැනට අනුමත සේවක සංඛ්‍යාව 1363 ක් වුවද, සත්‍ය සේවක සංඛ්‍යාව 114 කි.

පවත්නා නීති සංශෝධයෙහි ලා පවතින නෛතික අවහිරතා සහ කාලය ගතවන ක්‍රියා පරිපාටි

කාර්ය මණ්ඩලය සඳහා ප්‍රමාණවත් ඉඩකඩ නොමැතිවීම.

## 14.4 අනාගත අපේක්ෂා

අ. ලැබී ඇති අයදුම්පත් සියල්ලම 100% ක් වන සේ හැඳුනුම්පත් නිකුත් කිරීම

ආ. දෙපාර්තමේන්තුව සඳහා නව ගොඩනැගිල්ල තනා නිම කිරීම

# 15
# සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

## 15.1 සමාලෝචනය

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව අංශ ගණනාවක් ඔස්සේ රටෙහි සංවර්ධනයට දායක වෙයි. දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන විධානාත්මක අංශ 22 කින් සහ පුහුණු පාසල් 05 විසින් අපේක්ෂිත අරමුණු කරා දෙපාර්තමේන්තුව මෙහෙයවනු ලබයි.

කෘෂිකාර්මික ව්‍යාපෘති, සත්ව පාලන ව්‍යාපෘති, ගඩොල් ව්‍යාපෘති, අත්කම් ව්‍යාපෘති, නගර සංවර්ධනය සහ ඉදිකිරීම් හා අලුත්වැඩියා ව්‍යාපෘති දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති සමහරකි.

## 15.2 2014 වසරේ මුදුන් පමුණුවා ගැනීම්

- ප්‍රධාන ක්‍රියාකාරකම් හා ප්‍රගතිය

**15.1. වගුව: පවත්වා ගෙන යන ව්‍යාපෘති හා ආදායම**

| ව්‍යාපෘතිය | ආදායම ( රුපි. මිලියන) |
|---|---|
| කෘෂිකර්ම | 259.72 |
| සත්ව පාලන | 17.82 |
| ගඩොල් | 45.38 |
| වෙනත් ව්‍යාපෘති | 48.60 |

**15.2 වගුව : වෙනත් ක්‍රියාකාරකම්**

| ක්‍රියාකාරකම් | ප්‍රගතිය රුපි. මිලියන |
|---|---|
| සුව සවිය අරමුදල<br>සාමාජිකයින්ට ගෙවන ලද මුදල්<br>(මරණ, ආරෝග්‍යශාලාගතවීම්,අසනීප ආදිය) | 97.15 |
| වන්දි අංශය<br>මියගිය හා ආබාධිත තත්වයට පත් සිවිල් ආරක්ෂක සේවයේ සොල්දාදුවන් | 0.70 |
| යහ සාධක අංශය<br>සාමාජිකයින්ට ගෙවන ලද මුදල්<br>(මරණ, විශ්‍රාම වැටුප්, අසනීප ආදිය) | 152.56 |
| අර්ථසාධක අරමුදල් අංශය<br>සාමාජිකයින්ට ගෙවන ලද මුදල්<br>( මරණ, වන්දි ආදිය) | 59.33 |
| ජනශක්ති රක්ෂණ අංශය<br>මියගිය සාමාජිකයින්ට ගෙවීම් | 3.81 |
| සේනාවිධායක අරමුදල<br>විධානාත්මක අංශ සහ පුහුණු කඳවුරුවල ලිපිද්‍රව්‍ය හා අනෙකුත් | 4.17 |

- **සේවා වනිතා අංශය**

- සිවිල් ආරක්ෂක සොල්දාදුවන් සඳහා නිවාස 271 ක් ඉදි කරන ලදී.
- සිවිල් ආරක්ෂක සොල්දාදුවන්ගේ 30,940 ක් පාසල් යන දරුවන් සඳහා රුපියල් මිලියන 11 ක් වටනා අභ්‍යාස පොත් ප්‍රදානය කරන ලදී.
- පහේ ශිෂ්‍යත්ව විභාගයෙන් හා අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් විශිෂ්ඨ ප්‍රතිඵල ලත් ශිෂ්‍යයින්ට ශිෂ්‍යත්ව ප්‍රදාන ලබා දෙන ලදී (රුපි. 885,000.00)
- උසස් පෙළ විභාගයෙන් විශිෂ්ඨ ප්‍රතිඵල ලත් ශිෂ්‍යයින් 14 කට ලැප්ටොප් පරිගණක ප්‍රදානය කරන ලදී.

- **සපුරාගත නොහැකි වූ ඉලක්ක**

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු සේවකයින්ට විශ්‍රාම වැටුප් ක්‍රමයක් දියත් කිරීම 2013 වසරේ ඉලක්කයක් වූ නමුදු එය සාර්ථක කර ගත නොහැකි විය. දැන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර, විශ්‍රාම වැටුප් ක්‍රමය ල`ගදීම ක්‍රියාත්මක කෙරෙනු ඇත.

- **ධාරිතා සංවර්ධනය**

- සිවිල් ආරක්ෂක සේවයේ සොල්දාදුවන් 3,321 ක් දෙදෙනෙකු සඳහා පහලලන්ද, කල්පිටිය, ගල්කිරියාගම පුහුණු පාසල් වලදී පුහුණු පාඨමාලා 20 ක් පවත්වන ලදී.
- සිවිල් ආරක්ෂක සේවයේ සොල්දාදුවන් 42 දෙදෙනෙකු සඳහා ආහාර පිසීම ගැන පුහුණු වැඩ සටහන් පවත්වන ලදී.
- නිලධාරීන් 78 දෙදෙනෙකු සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩ සටහන් පවත්වන ලදී.



## 15.3 2014 වසරේ ක්‍රියාකාරකම්වල විග්‍රහය/ අගැයීම්


| වර්ෂය | පුනරාවර්තන රුපි.මිලියන | | ප්‍රාග්ධන රුපි.මිලියන | |
|---|---|---|---|---|
| | ප්‍රතිපාදන | වියදම | ප්‍රතිපාදන | වියදම |
| 2008 | 7,066 | 6,991 | 466 | 320 |
| 2009 | 8,558 | 8,341 | 336 | 335 |
| 2010 | 8,456 | 8,454 | 254 | 253 |
| 2011 | 8,871 | 8,813 | 110 | 110 |
| 2012 | 9,258 | 9,245 | 59 | 53 |
| 2013 | 10,757 | 10,683 | 67 | 67 |
| 2014 | 12,030 | 12,029 | 120 | 120 |

15·3 වගුව: මූල්‍ය ප්‍රගතිය 2008 - 2014

## 15·4 ගැටළු හා අභියෝග

- මෙම දෙපාර්තමේන්තුව යටතේ විධාන අංශ 22 ක් සහ පුහුණු පාසල් 05 ක් ඇත. ලිපිගොනු ක්‍රමය නඩත්තු කිරීම සඳහා මනා පුහුණුව ලත් කාර්ය මණ්ඩලය ලෙස අනුයුක්ත කර ඇත්තේ කළමණාකාර සහකාරවරුන් 12 කු පමණකි. පුහුණුව ලත් කාර්ය මණ්ඩල නොමැති හෙයින්, බොහෝ කාර්යාලවල ලිපිගොනු නඩත්තු කරනු ලබන්නේ නොපුහුණු සිවිල් ආරක්ෂක සාමාජිකයින් විසිනි. මේ නිසා, ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසි අනුව විධිමත්ව කාර්යාල ක්‍රමය පවත්වා ගෙන යාම අතිශයින් දුෂ්කරය. කාර්යාල කටයුතු සඳහා අනුයුක්ත කර සිටින පුද්ගලයින්ට කාර්යාල ක්‍රම හා ලිපිගොනු නඩත්තුව සම්බන්ධයෙන් පුහුණු වැඩ සටහන් සංවිධානය කිරීම මෙම ගැටළුවට විසඳුමක් වනු ඇත.

- සිවිල් ආරක්ෂක බලකාය ශ්‍රම බලකායක් ලෙස සැළකීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. අනාගතයේදී මෙම පිරිස් විවිධ ස්ථානවලට අනුයුක්ත කෙරෙන හෙයින්, ඔවුන්ට ඒ අනුව අදාල පුහුණුව ලබා දිය යුතු වෙයි.




15·1 ප්‍රස්තාරය: වියදම් 2008 - 2014

## 15.5 අනාගත අපේක්ෂා

**ව්‍යාපෘති**

*2006* වසරේදී සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීමෙන් පසු, කෘෂිකර්මය, සත්ව පාලනය ඇතුළු විවිධ ව්‍යාපෘති පවත්වා ගෙන යමින් රටෙහි ආර්ථික සංවර්ධනය සඳහා දායක වී ඇත. මධ්‍ය කාලීන සැලැස්මේ ප්‍රධානතම අංශ ලෙස මෙම ව්‍යාපෘති ව්‍යාප්ත කළ යුතුව ඇත.

මූලාරම්භය ලෙස, යෝග්‍ය ඉඩම් අත්පත් කර ගනු ඇත. ඉක්බිති, මෙම ව්‍යාපෘති භාරව කටයුතු කළ යුතු වන නිලධාරීන් ව්‍යාපෘති සැලසුම්කරණය, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා ව්‍යාපෘති වාර්තා සකස් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සහයෝගය ඇතිව පුහුණු කෙරෙනු ඇත. නිමැවුම් වර්ධනය කර ගැනීම සඳහා නවීන ක්‍රමෝපායයන් හා තාක්ෂණය හඳුන්වා දෙනු ඇත.

- ධාරිතා සංවර්ධනය

  සිවිල් ආරක්ෂක කාර්ය මණ්ඩලය දැනට අනුයුක්තව ඇති අංශයන්හි අදාල පුහුණුව ලබා දීම.

- මූල්‍යමය යෝජනා

  සිවිල් ආරක්ෂක කාර්ය මණ්ඩලය සඳහා නව වැටුප් ක්‍රමයක් හඳුන්වා දීම.

  දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම් විස්තාරණය වීමේදී වැඩි මුදල් ප්‍රමාණයක් ලබා ගැනීම.

- **පරිපාලනය**

  පවත්නා පුරප්පාඩු පුරවා, යළිත් ඇතිවන පුරප්පාඩු සඳහා අනුමැතිය ලබා ගැනීම

# 16
# පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය

## 16.1 සමාලෝචනය

පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය 2006 ජූලි මස 30 වන දින ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කරන ලද්දේ දිවයිනෙහි සන්නද්ධ හමුදාවන් වෙනුවෙන් තාක්ෂණික පර්යේෂණ හා සංවර්ධනය අරමුණු කොට ගෙනය යි. එතැන් සිට ජාතික ආරක්ෂක අවශ්‍යතාවයන්ගේ ඉදිරි පරිශ්‍රමයන්ට උපයෝගී කර ගත හැකි ව්‍යාපෘති මෙන්ම ක්ෂේත්‍රයෙන් ඉස්මතු වන විවිධාකාර වූ අවශ්‍යතාවයන් සපුරා දිය හැකි බහුවිධ විෂය ධාරා ව්‍යාපෘති ගණනාවක්ම භාරගෙන සාර්ථක ලෙස අවසන් කිරීමට පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය සමත් විය. මෙම මධ්‍යස්ථානවල විවිධ ක්ෂේත්‍රයන්හි ප්‍රාඥයින්, වෘත්තිකවේදීන්, විශ්ව විද්‍යාල හා එක්ව මෙන්ම වෙනත් තාක්ෂණික ආයතනයන්හි සහයෝගය ද ලබා ගනිමින් පර්යේෂණ දියත් කිරීමෙහි නියැලී ය. පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ මූලස්ථාන ගොඩනැගිල්ල හෝමාගම, පිටිපන, මාහේනවත්තේ, ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනයට යාබදව ස්ථාපිත කර ඇති අතර තවදුරටත් ඉදි කිරීම් කටයුතු කෙරෙමින් පවතී.

## 16.2 2014 වසරේ මුදුන් පමුණුවා ගැනීම්

පසුගිය වසරේදී සැලකිය යුතු ව්‍යාපෘති සංවර්ධන ක්‍රියාකාරකම් ගණනාවක්ම සාර්ථකව නිම කිරීමෙහි ලා දායක වූ අංශ වන්නේ:

- **තොරතුරු තාක්ෂණ අංශය**

**හයි ටෙක් සෝල්ජර්:** මෙම ව්‍යාපෘතියෙහි අරමුණ වන්නේ සන්නද්ධ හමුදා සහ පොලිසිය විසින් භාවිත කරනු ලබන නිරවද්‍ය මෙහෙයුම් සැළසුම් හා තීරණ ගැනීමේ ක්‍රියාදාමය පහසු කරවනු වස් වෙබ් අඩවි විසඳුම් මාලාවක් හඳුන්වා දීම ය. හමුදා බාණ්ඩ ස්ථානගතව ඇති ස්ථාන සෝදිසි කිරීමට මෙම විසඳුම උපයෝගී කර ගත හැකි ය.

**සිද්ධි වාර්තාකරණ ක්‍රමවේදය -** සුරක්ෂිත සිද්ධි වාර්තාකරණ ක්‍රමවේදය වැඩි දියුණු කිරීම සඳහා උපයෝගී කර ගත හැකි ජංගම භාවිත ක්‍රමයක් වර්ධනය කර ගැනීම අභිප්‍රායයි. ඕනෑම ස්ථානයක, ඕනෑම අවස්ථාවක, වර්තාකරණය සඳහා සපයා ඇති ක්‍රමවේදය භාවිතා කරමින් දත්ත එකරාශී කිරීමේ වේගය හා නිරවද්‍යතාවය මෙ මගින් වර්ධනය කර ගත හැකි අතර, අදාල දත්ත ගුගල් සිතියමක විදහා දැක්වීමට හෝ ලිවීමටද හැකියාව ඇත. යුදහමුදාවට, DMI සහ විශේෂ කාර්ය සාධන බලකායට මෙම ජංගම භාවිත ක්‍රමය උපයෝගී කර ගත හැකි අදියරක පවතී.

**දුම්රිය ස්ථානගතවී ඇති ස්ථාන සෝදිසිකිරීමේ ක්‍රමය.**

මෙම ව්‍යාපෘතිය වර්ධනය කිරීමට හේතු වුයේ දුම්රිය හා පාලන මැදිරි අතර අවස්ථාචෝචිතව දුම්රිය ස්ථානගත තොරතුරු සපයා ගැනීමෙන් දුම්රිය සේවයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කරලීමේ අවශ්‍යතාවයයි. එකී අවස්ථාවේදීම, බෙදුම් ස්ථාන පාලන මැදිරියට සම්බන්ධ වන අතර, එමගින් අවශ්‍ය තොරතුරු මහජනතාව වෙතද ලැබීම සිදුවෙයි.

- **ගගනගාමී අංශය**

**Short Range Unmanned Aerial Vehicle (SRUAV)**

නියමුවන් රහිත අතින් ගුවනට මුදාහරිනු ලබන, ස්වයංක්‍රිය ව ගුවනේ සැරිසැරිය හැකි මෙම උපකරණය ක්ෂේත්‍ර මට්ටමින් භාවිතයට යොදා ගැනීම සඳහා අරමුණු කොටගත්තකි. විනාඩි 60 ක පමණ කාලයක් පැවතීමේ සංස්ථිතියකින් යුක්ත අතර, කි.ග්‍රෑම්. 1 ක් පමණ බරක් ගෙන යා හැක. දෙදෙනෙකුගේ කණ්ඩායමක් විසින් මෙහෙයවිය හැකි පරිදි නිෂ්පාදනය කර ඇති මෙම උපකරණය පහසුවෙන් එහා මෙහා කළ හැකිවාක් මෙන්ම විනාඩි 15 ක් ඇතුළත මෙහෙයුම සඳහා සූදානම් කර ගත හැක. තවදුරටත් වර්ධනය කර ගැනීම සඳහා කටයුතු කෙරෙමින් පවතී.

- **නාවික අංශය**

***Small Arm Firing Simulator***

වෙඩි තැබීමේ පුහුණුව සඳහා භාවිතා කළ හැකි සුළු අවි ආකෘතියක් වර්ධනට කර ගැනීමේ ව්‍යායාමයකි. ජීව උණ්ඩ නොමැතිව වෙඩි තැබිය හැකි හෙයින් ආර්ථික වශයෙන් ලාභදායී පියවරකි. සන්නද්ධ සේවාවන්ට සැපයීම සඳහා නිෂ්පාදන පියවරේ ඇත.

*2014 වසරේ ක්‍රියාත්මක වන අඛණ්ඩ ව්‍යාපෘති*

- **තොරතුරු තාක්ෂණ අංශය**

***Field Artillery Simulator System (FASS)***

ඉදිරි නිරීක්ෂණ නිලධාරීන් (FOOs) විසින් දැනට භාවිතා කරනු ලබන පුහුණු මොඩලයෙහි ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම සඳහා මූලික වශයෙන් අරමුණු කොට ගත්, පුහුණු වියදම් අවම කළ හැකි උපකරණයකි. කාලතුවක්කු පතොරම්

1

වියදම පාලනය, පුහුණු ක්ෂේත්‍රවල භාවිතයේ දී සීමාවන් ඇතිකර ගත හැකිවීම, කාලතුවක්කු භාවිතය පුහුණු වීමේ දී ජීව උණ්ඩ භාවිතය වළක්වාලන වෙනත් සාමාජීය හා ආර්ථික තත්ත්වයන් පාලනය යන කරුණු කෙරෙහි අවධානය යොමුව ඇත. මෙම ව්‍යාපෘති ප්‍රතිපෝෂක අදියරේ පවතී.

-  නාවික අංශය

## Underwater Acoustic Sensor Array

දියයට හෝ පහතින් ස්ථානගතව ඇති යාත්‍රා සොයා ගැනීම සඳහා භාවිතා කළ හැකි උපකරණ වර්ධනය කර ගැනීම අරමුණු කොට ගත් ව්‍යාපෘතියකි.

### Design and Fabrication of simulated platform with 3 DOF

පාලන සංඥා ලත් විට, X, Y සහ Z යන අක්ෂයන්හි කෝණ විපර්යාශයන්හිදී භාවිතා කිරීමේ නිදහස් ධාරිතාවයක් ඇති උපකරණයකි. මෙය බෝට්ටු, යාත්‍රා, අහස් යානා හෝ භූමි වාහනවල හැසිරීමේ ක්‍රම අනුකරණය කළ හැකි උපකරණයකි.

-  ගගනගාමී අංශය

### Medium Range Unmanned Aerial Vehicle (MRUAV).

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් යානා ඉංජිනේරු අංශය කටුනායක පිහිටි ස්වකීය කඳවුරු භූමියේ ස්ථාපිත කර ඇති ඉංජිනේරු පීඨයේදී, 2009 මාර්තු මස 29 වන දින මෙම ගුවන්නියමුවන් රහිත මධ්‍යම විෂය මානයේ ගුවන්ගත කිරීමේ උපකරණය වර්ධනය කිරීම ආරම්භ කරන ලදී. 2009 මාර්තු මාසයේදී වැඩ සටහන ආරම්භ වන විට ඒ ආශ්‍රිත ඉතා වැදගත් සිද්ධීන් ගණනාවක්ම පසු කර තිබුණි. ගුවන් සේවාවේ දේශීය කුසලතාවන් භාවිතා කරමින්, මොරටුව විශ්වවිද්‍යාලයේ සහයෝගය ඇතිව ක්‍රියාත්මක කෙරෙන ඒකාබද්ධ ව්‍යායාමයකි.

### Fabrication of honeycomb panels for SLAF aircraft

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ යාත්‍රා සඳහා අවශ්‍ය සැකිලි විශේෂයකි. මේවා දැනට බෙල් හෙලිකොප්ටර්, වයි-12, සී-1130, බීච් ක්‍රාෆ්ට් ආදී යාත්‍රාවල විපුල ලෙස භාවිතා කෙරේ. මෙම ව්‍යාපෘතියට විශේෂිත අදියර 2 ක් ඇතුළත්ය.

අදියර I.


හනිකෝම්බ් සැකිලි නිර්මාණය කිරීමේ ක්‍රමවේදය වර්ධනය කිරීම

අදියර II


නිර්මාණය කරන ලද සැකිලි වලට දැරිය හැකි බර විග්‍රහ කිරීමේ ක්‍රමයක් වර්ධනය කර ගැනීම

## 16.3 2014 වසරේ ක්‍රියාකාරකම් විග්‍රහය/ අගැයීම

**16.1** වගුව : **2008-2014** පුනරාවර්තන වියදම් ප්‍රකාශය




**16.2** වගුව : **2008-2014** ප්‍රාග්ධන වියදම් ප්‍රකාශය



## *16.1.* වගුව: ප්‍රාග්ධන ව්‍යාපෘතිවල භෞතිකමය හා මූල්‍යමය ප්‍රගතිය

ව්‍යාපෘතියේ නම : පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති පැවැත්වීම

වැය ශීර්ෂය : 103 - ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය

වැය සංකේතය : 103-01—5-2502 - මිලියන 15

ණය අංකය/ ප්‍රදානකරු: ශ්‍රී ලංකාණ්ඩුව

| අංක | ව්‍යාපෘති ක්‍රියාකාරකම් | ව්‍යාපෘති කාලය | සමස්ත ඇස්තමේන්තු පිරිවැය රු.මිලි. | 31.12.13 ට සමුච්චිත වියදම රුපි. මිලි | 31.12.13 ට සමුච්චිත ප්‍රගතිය % | අයවැය ප්‍රතිපාදන 2014 රු.මිලි. | 2014 අවශ්‍ය ප්‍රතිපාදන රු.මි. | 2014 භෞතිකමය ඉලක්කය-Pt -% මූල්‍යමය ඉලක්කය - Ft - රුපි.මිලියන | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | කාර්තු 1 | කාර්තු 2 | කාර්තු 3 | කාර්තු 4 | එකතුව |
| 01 | *Underwater surveillance system* | මාස 18 | 5.50 | 0.70 | 15% | 1.70 | 1.70 | Pt | 15 | 15 | 15 | 15 | 60 |
| | | | | | | | | Ft | 0.70 | | 100 | | 1.70 |
| 02 | *Motion Platform for Simulators* | මාස 12 | 3.60 | - | 33 | 3.60 | 3.60 | Pt | 25 | 25 | 25 | 25 | 100 |
| | | | | | | | | Ft | - | - | 1 | 2 | 3 |
| 03 | | | | | | | | Ft | - | - | 1.00 | 2.60 | 3.60 |
| 03 | *Prison Jammer Project* | මාස 18 | 9.80 | 8.60 | 98 | 1.20 | 1.20 | Pt | | | 2 | | 2 |
| | | | | | | | | Ft | | | 1.20 | | 1.20 |
| 04 | *Project Lion(Radio Set)* | මාස 15 | 2.40 | 1.00 | 50 | 1.40 | 1.40 | Pt | | | 25 | 25 | 50 |
| | | | | | | | | Ft | | | 0.70 | 0.70 | 1.40 |
| 05 | *Small Arm Firing Simulator* | මාස 03 | 1.00 | 0.80 | 65 | 0.20 | 0.20 | Pt | 25 | 10 | | | 35 |
| | | | | | | | | Ft | 0.10 | 0.10 | | | 0.20 |
| 06 | *UAV Project* | | 15.57 | 15.50 | 98 | 0.04 | 0.04 | Pt | | | 2 | | 2 |
| | | | | | | | | Ft | 0.02 | | 0.02 | | 04 |
| 07 | *K8 Flight Simulator System* | මාස 06 | 3.30 | 1.40 | 80 | 1.90 | 1.90 | Pt | | | 10 | 10 | 20 |
| | | | | | | | | Ft | | | 0.95 | 0.95 | 1.90 |
| 08 | *Fabrications of* | මාස 18 | 9.00 | 1.80 | 10 | 0.74 | 0.74 | Pt | | | 25 | 25 | 50 |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | *Honey Comb Panels* | | | | | | | Ft | | | 0.37 | 0.37 | 0.74 |
| 09 | *Field Artillery Simul: system - Stage II* | මාස 15 | 26.00 | 2.40 | 47 | 4.00 | 4.00 | Pt | | | | 30 | 30 |
| | | | | | | | | Ft | 2.60 | 0.40 | | 1.00 | 4.00 |
| 10 | *Train Tracking System* | මාස 06 | 7.90 | 0.04 | 40 | | | Pt | | | | 20 | 20 |
| | | | | | | | | Ft | | | | | |
| 11 | *Incident Reporting System* | මාස 03 | 0.24 | 0.02 | 20 | 0.22 | 0.22 | Pt | | | 40 | 40 | 80 |
| | | | | | | | | Ft | | | 0.22 | | 0.22 |

## 16.4 ගැටළු හා අභියෝග

විද්‍යාවෙහි හා තාක්ෂණයෙහි සීඝ්‍ර දියුණුව පර්යේෂණය හා සංවර්ධනය කෙරෙහි තදබල බලපෑමක් ඇති කරවයි. තාක්ෂණික ලෝකය දර්ශනය කරමින්, විද්‍යාමානවන සිද්ධීන් හා ගැටෙමින්,වෙනත් අය හා අන්‍යොන්‍ය සේ ක්‍රියාත්මක වෙමින්, නව දැනුම් මංපෙත් හා සමගාමීව ක්‍රියාකිරීම අතිශයින් වැදගත්ය. පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ පර්යේෂණ ක්‍රියාවලිය, ආරක්ෂිත හා වෙනත් විද්‍යාත්මක වර්ධනයන් ගණනාවක් ඇතුළත් පුළුල් පරාසයක් ආවරණය කරයි. පර්යේෂණ හා සංවර්ධනයෙහි ලා අතීත මුළුගැන්වීම් ඔස්සේ පහත විස්තර කෙරෙන උග්‍ර ගැටලු හා අභියෝග හඳුනා ගෙන ඇත.

- සිවිල් විශෙෂඥ දැනුම හා කුසලතාවල අවම ආගමනය
- යටිතල ව්‍යුහ හා පහසුකම් සංවර්ධනය උදෙසා ප්‍රමාණවත් අරමුදල් නොමැතිකම - නවීනතම ආරක්‍ෂ තාක්ෂණික පර්යේෂණාගාර උපකරණ හා මෙවලම් සහ පහසුකම් නොමැත.

## 16.5 අනාගත අපේක්ෂා

පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය වූ කලී රටෙහි ජාතික ආරක්ෂාව පිළිබඳ අවශ්‍යතාවයන් සපුරාලන සහ රට අභ්‍යන්තරයෙහි හා ඉන් පිටත එදිරිවාදිකම් පරයමින් තාක්ෂණික මුවහතක් නිර්මාණය කර ගැනීමෙහිදී අපේක්ෂා කළ හැකි අභියෝග වලට මුහුණදීමේ උපායමාර්ගික චින්තනයේ සුසමාදර්ශී පිබිදීමක් සනිටුහන් කළ අද්විතීය ආයතනයකි.

උග්‍ර ආරක්ෂා මෙහෙයුම්වලට සහාය වීම සඳහා, අවම පිරිවැයකින් යෝග්‍ය තාක්ෂණය සපයා දීම, කැපවීමෙන් ක්‍රියාකරන මෙම සංවිධානයට මුහුණ දීමට සිදුවිය හැකි අභියෝගයයි. දීර්ඝකාලීනව සලකා බැලීමේදී, රටෙහි සංවර්ධන මූලාරම්භයන්ට සහාය වන ශක්තිමත් ආර්ථිකමය පදනමක පිළිගත් පාර්ශවයක් ලෙස සැදී පැහැදී , රටෙහි ආරක්ෂා ව්‍යායාමයන් තහවුරු කරලීම සඳහා බලවත් වෑයමක යෙදීම සහ එමගින්, ස්ථාවරභාවය හරහා යහ පාලනය පහසුකරවීම, පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය විසින් අත්‍යන්තයෙන් කළ යුතු කාර්යයකි. එසේම, දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල සාර්ථකත්වය සැලකීමේ දී, රාජ්‍ය ආරක්ෂක අංශයේ පර්යේෂණ හා සංවර්ධන ක්ෂේත්‍ර යෙහි නවතම සුසමාදර්ශයක් විවෘත කිරීමට මෙම ආයතනය සමත්වන බව සඳහන් කරනු වටී.

# 17
# රාජ්‍ය බුද්ධි සේවාව

## 17.1 සමාලෝචනය

රාජ්‍යයේ ආරක්ෂාව හා දේශපාලන, ආර්ථිකමය හා සාමාජයීය ස්ථාවරත්වය කෙරෙහි එල්ලවන අභ්‍යන්තරික හෝ බාහිර තර්ජනයන් සුපරික්ෂාකාරීව, නිෂ්ක්‍රිය කිරීම හා කල්තියා ග්‍රහණයට ගැනීමට අවශ්‍ය වන බුද්ධි සේවා එක්රැස් කිරීම, විග්‍රහය හා අදාල අංශයන් වෙත ප්‍රචාරණය කිරීමෙහිලා පෙරමුණ ගැනීම රාජ්‍ය බුද්ධි සේවාවෙහි මෙහෙවරයි.

## 17.2 2014 වසරේ මුදුන් පමුණුවා ගැනීම්

යටිතල ව්‍යුහ පහසුකම් - උසස් ප්‍රමිතියක යටිතල පහසුකම් වර්ධනය/ස්ථාපනය/නඩත්තුව සඳහා අඛණ්ඩ උත්සාහයක යෙදුණි.

සුදුසුකම් ලත් වෘත්තිකවේදීන් - ආයතනයේ ඉහළ තනතුරු දරණ, විශිෂ්ඨ සුදුසුකම් ලත් බුද්ධි සේවා වෘත්තිකවේදීන් පිරිවරා ගැනීමට ආයතනය සමත්ව ඇත. සෑම ක්ෂේත්‍රයකම - බුද්ධි සේවා, විමර්ෂණ,තොරතුරු තාක්ෂණය,ප්‍රභූ ආරක්ෂා තර්ජන විග්‍රහය ආදිය - විශෙෂඥයින් සමූහයකින් ආයතනය සමන්විතව ඇත. මෙම නිලධාරීන් බොහෝ දෙනෙකු ලෝක ප්‍රසිද්ධ බුද්ධි ආයතනවල පුහුණුව ලද්දෝය.

තොරතුරු තාක්ෂණ කුසලතා ඉතා ඉහළ සුදුසුකම්වලින් සමන්විත තොරතුරු තාක්ෂණ විශෙෂඥයින් ආයතනය සතු අතර, ඔවුන්ගේ කුසලතාවයන් පර්යේෂණ වර්ධනය හා බුද්ධි සේවා විග්‍රහයන් සඳහා භාවිතා කෙරේ. මේ සඳහා ප්‍රශස්ථ අන්තර්ජාල හා වෙබ් අඩවියක් ආයතනය සතුය.

විදේශීය බුද්ධි ආයතන හා සම්බන්ධතා - සියළුම ප්‍රධානතම විදේශීය බුද්ධි සේවා ආයතනය හා සමග අත්දුටු සම්බන්ධතාවයන් පවත්වා ගෙන යන අතර, අවශ්‍ය වූ අවස්ථාවන්හිදී මෙම සම්බන්ධතාවලින් අප රටට බොහෝ ප්‍රතිලාභ අත්වී ඇත.


දක්ෂ හා ශික්ෂණයෙන් යුත් කාර්ය මණ්ඩලය- අතිශයින් දක්ෂ හා ශික්ෂණයෙන් යුත් කාර්ය මණ්ඩලයක් ආයතනය සතුය.ඉන් බොහෝ දෙනෙකුට පොලිස් පසුබිමක්, වෘත්තීමය පුහුණුව හා බුද්ධි සේවා ක්ෂේත්‍රයහි පළපුරුද්ද ඇත. ඔවුහු ආයතනයේ අනාගත වර්ධනයට අදාලව, හොඳින් නිර්මාණය වූ අභියෝගවලට මුහුණ දීමට හැකි තත්ත්වයක පසුවෙති.

බුද්ධි පද්ධතිය - මුළු රටම ආවරණය වන පරිදි විස්තාරණය වූ, විදේශීය රටකට වුවද පිරිමසාගත හැකි, බුද්ධි සේවා පද්ධතියක් ආයතනය සතුව ඇත.

මනාකොට සැදුම්ලත් දත්ත මූලා - ආයතනයේ මූලාරම්භයේ සිටම එක්රැස් කර ගන්නා ලද වාර්තා සටහන්වලින් පරිපූර්ණ දත්ත මූලයක් ආයතනය සතුය. මෙම දත්තයන් පුද්ගලයින්, සංවිධාන, විෂයයන් හා සිද්ධීන් සම්බන්ධ පර්යේෂණ සඳහා පුළුල් ලෙස භාවිතයට ගැනෙන හෙයින්, මෙම දත්ත ගබඩා, ආයතනයට අතිශයින් වැදගත් වෙයි.

## 17.3 2014 වසරේ ක්‍රියාකාරකම් වල විග්‍රහය/ අගැයීම

**17.1.** වගුව: **2088-2014** මූල්‍ය ප්‍රගතිය




## 17.4 ගැටළු හා අභියෝග

රැකියා සුරක්ෂිතතාවය - ආරක්ෂාව සපයන අනෙකුත් ආයතන මෙන් නොව, මෙම ආයතනයේ රැකියා මනාව සුරක්ෂිතය.

වරප්‍රරූෂ සේවය - වරප්‍රරූෂ සේවයෙන් පැන නගින තර්ජන සැමකල්හිම අගැයීමකට ලක් නොවූ තර්ජනයක් වන අතර, මෙම ආයතනය ද එවන් තර්ජනයන්ට මුහුණ පෑම සඳහා සැදී පැහැදී සිටී.

මානව හිමිකම් - මානව හිමිකම් ක්‍රියාකාරීන් විසින් ආරක්ෂාවට අදාල කාරණා සම්බන්ධයෙන් මැදිහත්වීම සහ සංවේදී තොරතුරු හෙළිකිරීම සඳහා නීතිය බලාත්මක කිරීමේ බලධාරීන් හා අධිකරණ පද්ධතිය මෙහෙයවීම බරපතල තර්ජනයක් බවට පත්ව ඇත. කෙසේවුවද, අපගේ බුද්ධි සේවා නිලධාරීන් කඩකිරීම් චෝදනාවන්ට ලක්වී නැත.

අනවසර ලෙස මෙහෙයුම් පද්ධතිවලට පිවිසීම - ද්විත්ව ඒජන්තවරුන් මෙහෙයුම් පද්ධධතිවලට කාන්දුවීම සෑම විටම ආයතනයේ ඉහළ ප්‍රමුඛත්වයක් ලත් විෂයයකි.

## 17.5 අනාගත අපේක්ෂා

ආයතනික ක්‍රමවේදයන් ස්වයංප්‍රවර්තක කිරීමේ ව්‍යාපෘතිය සීමාසහිත සන්ජේ (පෞ) සමාගම හා එක්ව 2015 සිට 2016 දක්වා අධිශ්‍රේණිගත කෙරෙනු ඇත.

- ආයතනයට වෘත්තිකවේදීන් බඳවා ගැනීම

### 17.1 වගුව : පවත්වන ලද පුහුණු වැඩ සටහන්

| අංක | පාඨමාලාව | පැවැත්වූ ස්ථානය | ආයතනය | සහභාගිත්වය |
|---|---|---|---|---|
| 01 | මූලික පාඨමාලාව | රාබුසේ පුහුණු අංශය | රාබුසේ | 36 |
| 02 | මූලික පාඨමාලාව | රාබුසේ පුහුණු අංශය | රාබුසේ | 33 |
| 03 | මූලික පාඨමාලාව | රාබුසේ පුහුණු අංශය | රාබුසේ | 30 |
| 04 | මූලික පාඨමාලාව | රාබුසේ පුහුණු අංශය | රාබුසේ | 28 |
| 05 | සංස්කරණ පාඨමාලා | බෝඹුරුඇල්ල පුහුණු මධ්‍යස්ථානය | රාබුසේ | 25 |
| 06 | සංස්කරණ පාඨමාලා | බෝඹුරුඇල්ලපුහුණු මධ්‍යස්ථානය | රාබුසේ | 29 |
| 07 | සංස්කරණ පාඨමාලා | බෝඹුරුඇල්ල පුහුණු මධ්‍යස්ථානය | රාබුසේ | 26 |
| 08 | සංස්කරණ පාඨමාලා | බෝඹුරුඇල්ල පුහුණු මධ්‍යස්ථානය | රාබුසේ | 29 |
| 09 | සංස්කරණ පාඨමාලා | බෝඹුරුඇල්ල පුහුණු මධ්‍යස්ථානය | රාබුසේ | 18 |
| 10 | සංස්කරණ පාඨමාලා | බෝඹුරුඇල්ල පුහුණු මධ්‍යස්ථානය | රාබුසේ | 16 |
| 11 | ඡායාරූප ශිල්පය හා ශ්‍රව්‍ය වාර්තාකරණ පුහුණු පාඨමාලාව | රාබුසේ පුහුණු අංශය | රාබුසේ | 23 |
| 12 | ඡායාරූප ශිල්පය හා ශ්‍රව්‍ය වාර්තාකරණ පුහුණු පාඨමාලාව | රාබුසේ පුහුණු අංශය | රාබුසේ | 23 |
| 13 | ඡායාරූප ශිල්පය හා ශ්‍රව්‍ය වාර්තාකරණ පුහුණු පාඨමාලාව | රාබුසේ පුහුණු අංශය | රාබුසේ | 14 |
| 14 | ඡායාරූප ශිල්පය හා ශ්‍රව්‍ය වාර්තාකරණ පුහුණු පාඨමාලාව | රාබුසේ පුහුණු අංශය | රාබුසේ | 20 |
| 15 | පරිගණක නිපුණත්ව පාඨමාලාව | රාබුසේ පුහුණු අංශය | රාබුසේ | 17 |
| 16 | පරිගණක නිපුණත්ව පාඨමාලාව | රාබුසේ පුහුණු අංශය | රාබුසේ | 19 |
| 17 | මයික්‍රොසොෆ්ට් කාර්යාල පැකේජය | රාබුසේ පුහුණු අංශය | සන්ජේ ලංකා පරිගණක මධ්‍යස්ථානය | 40 |
| 18 | රාජතාන්ත්‍රිකභාවය හා ගෝලීය කටයුතු ඩිප්ලෝමාව | බණ්ඩාරනායක අනුස්.සම්මන්ත්‍රණ ශාලාව | | 4 |
| 19 | මූලිකපරිගණක පාඨමාලාව | විලාසිතා නිවස | පොලිසිය | 40 |
| 20 | සහතික පාඨමාලාව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, කොළඹ | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 4 |

| | | | | |
|---|---|---|---|---|
| 21 | ඉංග්‍රිසි පාඨමාලාව | කුණ්ඩසාලේ පොලිස් අභ්‍යාස විද්‍යාලය | පොලිස් | 2 |
| 22 | නායකත්ව හා කළමණාකරණ පාඨමාලාව | ජාතික පොලිස් අභ්‍යාස විද්‍යාලය, කටාන | පොලිස් | 2 |
| 23 | නායකත්ව පුහුණු පාඨමාලාව | රාබුසේ පුහුණු අංශය | කැළණිය විශ්ව වි: | 31 |
| 24 | උපදේශණ ඩිප්ලෝමාව | බෞද්ධ හා පාලි වි.වි. | | 4 |
| 25 | ඒජන්තයින් බඳවාගැනීම හා කළමණාකරණ විශෙෂඥ | කොළඹ, හිල්ටන් හෝටලය | ඕස්ට්‍රේලි: ප්‍රතිපූරකයින් | 4 |
| 26 | ත්‍රස්තවාද ප්‍රතිරෝධ බුද්ධි සේවා පුහුණු වැඩ සටහන | රාබුසේ පුහුණු අංශය | ඇ.එ.ජ. ප්‍රතිපූරකයින් | 6 |
| 27 | විග්‍රහ හා පුහුණු කරන්නන් පුහුණුව | සිනමන් ග්‍රෑන්ඩ් හෝටලය | ඕස්ට්‍රේලි: ප්‍රතිපූරකයින් | 4 |
| 28 | බුද්ධි මෙහෙයුම් කළමණාකරණ පාඨමාලාව | ටාජ් සමුද්‍ර හෝටලය | ඕස්ට්‍රේලි: ප්‍රතිපූරකයින් | 2 |
| 29 | බුද්ධි මෙහෙයුම් කළමණාකරණ පාඨමාලාව | ටාජ් සමුද්‍ර හෝටලය | ඕස්ට්‍රේලි: ප්‍රතිපූරකයින් | 2 |
| 30 | ජාත්‍යන්තර සිද්ධි අණ පාලනය සහ සම්බන්ධීකරණ පුහුණුව | ඕසෝ හෝටලය | ඕස්ට්‍රේලි:ෆෙඩරල් පොලිසිය | 6 |
| 31 | බුද්ධි ආරක්ෂd සරණාගතයින් පිළිබඳ එ.ජා.ම.කො. ප්‍රඥප්තිය සහ රාජ්‍ය නිලධාරි පරිපාටිය | ටාජ් සමුද්‍ර හෝටලය | සරණාගතයින් පිළිබඳ එ.ජා.ම.කො. | 5 |
| 32 | ඩීඑන්ඒ පුහුණු වැඩ සටහන | රාබුසේ පුහුණු අංශය | ඇ.එ.ජ. ප්‍රතිපූරකයින් | 9 |
| 33 | ඉස්ලාම් මූලධර්මවාදය පිළිබඳ පුහුණුව | ඉන්දියාව | | 12 |
| 34 | කවුන්ටර් බුද්ධි පාඨමාලාව | පකිස්ථානය | | 1 |
| 35 | ත්‍රස්තවාද ප්‍රතිරෝධය හා ඒජන්තවරුන් බඳවාගැනීමේ කුසලතා | දකුණු කොරියාව | | 6 |

# 18

# ජාතික ශිෂ්‍ය භට බලකාය

## 18.1 සමාලෝචනය

ශිෂ්‍යභ වේවා නිලධාරින් වේවා, ජාතික ශිෂ්‍යභට බලකාය නිරන්තරයෙන් පුහුණු කිරීම්වලට ඉහළම ප්‍රමුඛත්වය දී ඇත. ශිෂ්‍ය භටයන් යනු වයස 14 හා 20 අතර, පාසල් යන පරම්පරාව වන අතර නිලධාරින් යනු ස්ථිර පාසල් ගුරුවරුන්ය. පුහුණුව යනු නියමානුකූල නායකයින්ගේ ජීවිත ගොඩනැගෙන පදනමයි. එම නිසා, ජාතික ශිෂ්‍ය භට බලකාය විසින් වසර පුරා හොඳින් සංවිධානය කරන ලද කඳවුරු, පාඨමාලා සහ බහුවිධ ක්‍රියාකාරකම් පවත්වා ගෙන යනු ලැබේ. මෙකී ක්‍රියාකාරකම්වල සාර්ථකත්වය රඳා පවත්නේ භාවිතා කරනු ලබන පරිපාලන, පුහුණු හා මනා සංවිධානාත්මක අනුබලය මතවේ.ශිෂ්‍යභට බලඇණි යුද හමුදා, නාවික හමුදා, ගුවන් හමුදා , පොලිසි හා තූර්යවාදක කණ්ඩායම් ලෙස විස්තාරණය වී ඇත.

## 18.2 2014 වසරේ මුදුන් පමුණුවා ගැනීම්

### 18.2.1 ශිෂ්‍යභට පුහුණුව

**පාඨශාලාවල මූලික ශිෂ්‍යභට පුහුණුව**

පාසල් දරුවෙකු ශිෂ්‍යභටයෙකු බවට පරිවර්තන කෙරෙන මූලික පුහුණු අතිශය වගකීමකින් යුතුව ලබා දියයුතු අතර, ලබා දෙන පුහුණුවේ ගුණාත්මකභාවය ගැන ද විශේෂ අවධානය යොමු කළ යුතුවෙයි. ශිෂ්‍ය භටයින්ගේ මූලික පුහුණුව පාසලේදී ආරම්භ වන අතර, ශිෂ්‍ය භටයින්ට ජාතික ශිෂ්‍ය හලකායේ නීති හා රෙගුලාසි අනුගමනය කෙරෙමින් මූලික හමුදාමය පුහුණුවක් ලබා දෙනු ලබන්නේ, නිලධාරි හා ගුරුවරුන් වශයෙන් පාඨශාලාවල රාජකාරි කටයුතු ඉටු කරනු ලබන ජාතික හිෂ්‍යභට බලකායේ නිලධාරින්ගේ විෂය පාත්‍රතාවය යටතේය. පාසල් මට්ටමේ පුහුණු වැඩ සටහන් තවදුරටත් ක්‍රියාත්මක කරවනු ලබන්නේ, ස්ථිර කාර්ය මණ්ඩල උපදේශකයින් විසිනි.




**බලඇණි අගැයීමේ කඳවුරු**

බලකායේ ලෙප්ටිනන්ට් කර්නල්වරුන් හා ජ්‍යෙෂ්ඨ මේජර්වරුන් විසින් අණ දෙනු ලබන බලඇණි 34+ ක් ජාතික ශිෂ්‍ය භටකාය යටතේ දිවයින පුරා විසිර පවතී. ශිෂ්‍ය භටයින් දින 9-10 ක කාල පරාසයක්තුළ ස්වකීය ඒ ඒ අගැයීම් කඳවුරුවලට සහභාගී වෙති. නාවික සහ ගුවන් හමුදා අගැයීම් කඳවුරු පිළිවෙළින් ත්‍රිකුණාමලයේ නාවික හා සමුද්‍රීය ඇකඩමියේ හා දියතලාවේ ගුවන් හමුදා පුහුණු පාසැලෙහි පැවැත්වෙන අතර, අනෙකුත් සියළුම ඇගයීම් කඳවුරු, පාඨමාලා සහ ක්‍රියාකාරකම් රන්ටැඹේ පුහුණු මධ්‍යස්ථානයේදී සිදු කෙරේ.·




යුද හමුදා අගැයීම් කඳවුර - බාලක හා බාලිකා - පුහුණු මධ්‍යස්ථානය රන්ටැඹේ




පොලිස් ඇගයීම් කඳවුර - බාලක හා බාලිකා - පුහුණු මධ්‍යස්ථානය රන්ටැඹේ




තූර්යවාදක ඇගයීම් කඳවුර ( නැගෙනහිර හා බස්නාහිර) - බාලක හා බාලිකා - පුහුණු මධ්‍යස්ථානය, රන්ටැඹේ




ගුවන් බණ්ඩ ඇගයීම් කඳවුර - බාලක හා බාලිකා -ගුවන් හමුදා පුහුණු මධ්‍යස්ථානය, දියතලාව

අගැයීම් කදවුරුවල ශිෂ්‍යභට සහභාගිත්වය


**18.1 වගුව : 2014 වසරේදී බාලක ශිෂ්‍ය භට සහභාගිත්වය**

| | බලඇණි සංඛ්‍යාව | ශිෂ්‍ය භට සංඛ්‍යාව |
|---|---|---|
| යුද හමුදාව | 590 | 14750 |
| නාවික හමුදාව | 74 | 1850 |
| ගුවන් අංශය | 60 | 1500 |
| පොලීසිය | 25 | 625 |
| තූර්යවාදක | 70 | 1750 |
| **එකතුව** | **819** | **20475** |


**18.2 වගුව : බාලිකා ශිෂ්‍යභට සහභාගිත්වය - 2014**

| | බලඇණි සංඛ්‍යාව | ශිෂ්‍ය භට සංඛ්‍යාව |
|---|---|---|
| යුද හමුදාව | 88 | 2,200 |
| නාවික හමුදාව | 30 | 750 |
| ගුවන් අංශය | 55 | 1,375 |
| පොලීසිය | 30 | 750 |
| තූර්යවාදක | 25 | 625 |
| **එකතුව** | 228 | **5,700** |


**18.1 ප්‍රස්තාරය : වාර්ෂික බාලක ශිෂ්‍යභට සහභාගිත්වය**




**18.2 ප්‍රස්තාරය: සමස්ත බාලක බලඇණි සංඛ්‍යාව**




**18.3 ප්‍රස්තාරය : සමස්ත බාලිකා බලඇණි සංඛ්‍යාව**




යුදහමුදා, නාවික හමුදා, ගුවන් හමුදා සහ පොලිස් අගැයීම් කදවුරුවලදී,සුදුසුකම් ලත් කුසලතා පිළිවෙල අනුව, ''හර්මන් ලූස් සහ ද සොයිසා අභියෝග කුසලාන කදවුර සඳහා බල ඇණි තෝරා ගැනෙනු ඇත.

- **හර්මන් ලූස් සහ ද සොයිසා අභියෝග කුසලාන තරග කදවුර**

ජාතික ශිෂ්‍ය භට බලකායේ, උත්කර්ෂවත් ඉසව්ව වන, හර්මන් ලූස් සහ ද සොයිසා අභියෝග කුසලාන තරග කදවුර වාර්ෂිකව, ඔක්තෝබර් මාසයේදී රන්ටැඹේ, පුහුණු මධ්‍යස්ථානයේදී පැවැත්වෙයි.

තරඟ මාලාවෙන් ජයග්‍රහණය කරනු ලබන බාලක බලඇණියට හර්මන් ලූස් අභියෝග කුසලානයද, ජයග්‍රහණය කරනු ලබන බාලිකා බලඇණියට ද සොයිසා අභියෝග කුසලානද පිරිනැමේ. හර්මන් ලූස් සහ ද සොයිසා අභියෝග කුසලාන තරග දෙකින් ජයග්‍රහණය කරනු ලබන ජයග්‍රාහකයෝ '' වර්ෂයේ ජනාධිපති බලඇණිය" විරුදාවලියෙන් පිදුම් ලබති.

හර්මන් ලූස් අභියෝග කුසලාන





ද සොයිසා අභියෝග කුසලාන





- **වි**
**දේශීය නියෝජනය**

ජාතික ශිෂ්‍ය භටකාය මූලස්ථානයේ සහ ආරක්ෂක අමාත්‍යාංශයේ ආරාධනයෙන් , සාක් රටවල ජාතික ශිෂ්‍ය භලකායවල භට පිරිස් හා නිලධාරීන් වාර්ෂිකව පැවැත්වෙන හර්මන් ලූස් සහ ද සොයිසා අභියෝග කුසලාන තරග කඳවුර නැරඹීමට පැමිණෙති.

**18.3 වගුව : හර්මන් ලූස් සහ ද සොයිසා අභියෝග කුසලාන තරග කදවුර-2014 නැරඹීමට සපැමිණි විදේශීය නියෝජනයන්ගේ සහභාගිත්වය**

| රට | අධ්‍යක්ෂ | | | නිලධාරි | | ශිෂ්‍යභට | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | | අධ්‍යක්ෂ මා.නි. | | | | | | |
| | අධ්‍යක්ෂ | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | |
| බංග්ලාදේශ් | 1 | 1 | - | 1 | 1 | 5 | 5 | 14 |
| ඉන්දියාව | - | - | - | 1 | 1 | 6 | 6 | 14 |
| මාලදිවයින | 1 | - | - | 1 | 1 | 5 | 5 | 13 |
| නේපාලය | 1 | 1 | 1 | - | 1 | 3 | 3 | 10 |
| පකිස්ථානය | - | - | - | 3 | - | 1<br>5 | - | 18 |
| සිංගප්පූරුව | 1 | 1 | - | 1 | 2 | 5 | 1 | 11 |
| **එකතුව** | 4 | 3 | 1 | 7 | 6 | 3 | 20 | 80 |

**ශිෂ්‍යභටයින් සඳහා පවත්වන ලද පාඨමාලා**

**ඉංග්‍රිසි භාෂා පාඨමාලාව**

2004 වසරේදී, රන්ටැඹේ පුහුණු මධ්‍යස්ථානයේදී ඉංග්‍රිසි භාෂා පාඨමාලා දෙකක් පවත්වනු ලැබීය. මේ දින තිහේ සහ දින පසළොසේ පාඨමාලා දෙකකි.



**පරිගණක පාඨමාලා**

පරිගණක සාක්ෂරතාවයෙහි දැනුම වර්ධනය සඳහා පරිගණක පාඨමාලා දෙකක් රන්ටැඹේ පුහුණු මධ්‍යස්ථානයෙහිදී පවත්වනු ලැබීය.



**තූර්යවාදන ඩ්‍රම් මේජර් සහ බියුග්ලර් පාඨමාලාව**

බලකායේ ශිෂ්‍යභට වාදක මණ්ඩල ප්‍රමිතිය අධිශ්‍රේණිගත කිරීම සඳහා විශේෂයෙන් සැලසුම්ගත තූර්යවාදන ඩ්‍රම් මේජර් සහ බියුග්ලර් පාඨමාලාව හඳුන්වා දී ඇත.

**ශිෂ්‍ය භටයින් සඳහා කණිෂ්ඨ නායකත්ව පාඨමාලාව**

සෑම තරුණයෙකුගේම ජීවනාලිය වන්නේ වික්‍රමාන්විත ක්‍රියාදාමයයි. බලඇණියේ කෝප්‍රල්වරුන්ගේ හා ලාන්ස් කෝප්‍රල්වරුන්ගේ ඉල්ලීමට ඉඩදීම සඳහා යථෝක්ත පාඨමාලාව හඳුන්වා දී ඇත. එක් එක් බළ ඇණියෙන් තෝරාගන්නා ලද , 2 X ශිෂ්‍ය භටයින්, විශේෂයෙන් කණිෂ්ඨ භටයින්, මෙම පාඨමාලාවට සහභාගී වූහ. මෙය දින අටක නායකත්ව හා ධනාත්මක ආකල්ප වර්ධන පාඨමාලාවකි

**ශිෂ්‍ය භටයින් සඳහා උසස් පාඨමාලා**

විචක්ෂණ, වගකිවහැකි, ප්‍රත්‍යක්ෂ හා පක්ෂපාත නායකයින් හා කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කරන්නන් බිහිකිරීමේ ජාතික ශිෂ්‍ය භට බලකායේ මෙහෙවරෙහි කොටසක් ලෙස, ශිෂ්‍ය භටයින් සඳහා වික්‍රමාන්විත හා පරීක්ෂණාත්මක වැඩ සටහන් හා ක්‍රියාකාරකම්වල පුළුල් පාඨමාලාවන් ඉදිරිපත් කෙරේ.




**විජයග්‍රහණ පෙළපාලිය - බංග්ලාදේශය**






**යුද හමුදා දිනය විසිර යාමේ පෙළපාලියේ - නේපාලය**

**පාකිස්තානයට නිල සංචාරයක්**

ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය භටයින් තුළ ආත්ම විශ්වාසය ගොඩනැගීමේ පළපුරුද්ද ඇතිකරවනු වස්, නායකත්ව ගුණාංගයන් වර්ධනය කරවනු පිණිස මෙම උසස් පාඨමාලා විශේෂයෙන්ම සැලසුම් කර ඇති අතර, ඒවා වෙනත් ශිෂ්‍යභට පාඨමාලාවලින් සම්පූර්ණයෙන්ම වෙනස්ය. ශිෂ්‍ය භටයින් 1540 ක් පමණ සක්‍රියව හා උද්‍යෝගයෙන් මෙම පාඨමාලාවට සහභාගී වූහ.

**18.4 වගුව: ශිෂ්‍ය භටයින්ගේ පාඨමාලා සහභාගිත්වය - 2014**

| පාඨමාලාව | ශිෂ්‍යභට සහභාගිත්වය |
|---|---|
| ඉංගීසි භාෂා පාඨමාලාව | 380 |
| පරිගණක පාඨමාලාව | 180 |
| තූර්යවාදක ඩ්‍රම් මේජර් හා බියුග්ලර් පාඨමාලාව | 280 |
| කණිෂ්ඨ නායකත්ව පාඨමාලාව | 700 |
| ශිෂ්‍යභට සඳහා උසස් පාඨමාලාව | 850 |
| එකතුව | 2,390 |

## 18.2.2 විදේශීය චාරිකා

ජාත්‍යන්තර අවබෝධය හා දැනුම වර්ධනය කරලීමේ අරමුණින්, 2005 වසර වන විට, තරුණ භුවමාරුකර ගැනීමේ වැඩ සටහන් සාක් කලාපීය රටවල් 2 ක ජාතික ශිෂ්‍ය භට බලකායයන් හා සමග පැවැත්වීමට ශ්‍රී ලංකා ජාතික ශිෂ්‍යභට බලකාය කටයුතු කර තිබුණි. මෙම අරමුණ අනුව, එකී වැඩ සටහන සියළුම සාක් රටවල්ට හා ASEAN රටවල් තෙක් ප්‍රචාරණය කිරීමට ද කටයුතු සැලසිණ. මෙහි ප්‍රතිඵලයක්ලෙස වාර්ෂිකව චාරිකා හතක යෙදීමට හැකියාව ලැබුණි.

**18.5 වගුව : 2014 වසරේදී ශ්‍රී ලාංකික ශිෂ්‍ය බටයින් හා නිලධාරින්ගේ විදේශීය චාරිකාවල සහභාගිත්වය**

| රට | ඉසව්ව | අධ්‍යක්ෂ | නිලධාරීන් | ශිෂ්‍ය භටයින් | එකතුව |
|---|---|---|---|---|---|
| ඉන්දියාව | ෂිවාජි ට්‍රේල් ට්‍රෙක් කඳවුර | - | 1 | 6 | 7 |
| ඉන්දියාව | ජනරජ දින සැමරුම | 1 | 2 | 12 | 15 |
| බංගලාදේශය | විජයග්‍රහණ දින සැමරුම | 1 | 2 | 10 | 13 |
| නේපාලය | යුදහමුදා දින පෙළපාලි | 1 | 1 | 4 | 6 |
| පකිස්ථානය | නිල සංචාරය | 1 | 2 | 12 | 15 |
| එකතුව | | | 8 | 44 | 52 |



ශිෂ්‍යභට නිවස්න අළුත්වැඩියාව
සමස්ත වියදම :
රුපි. 53,87,481·50

## 18.2.3 නිලධාරී පුහුණු

**පොදු**

ළමා පරපුර ස්වකීය ප්‍රමුඛතම වත්කම ලෙස සැළකෙන හෙයින්, අදාල වගකීම් කැපවීමෙන් ඉටු කරලීම සඳහා නිලධාරි සංඛ්‍යාව වැඩි කිරීමට ජාතික ශිෂ්‍ය භට බලකාය කටයුතු කර ඇත. අපගේ මාතෘභූමිය එක ධජයක් යටතේ එක්සත්ව ඇති මෙම උත්කෘෂ්ඨමය අවස්ථාවේ දී, ජාතික මෙහෙවරක යෙදීම සඳහා, ජාති ආගම්,කුලභේද පසෙක ලා,සේවස්ථ ගුරුවරුන් බඳවා ගැනීමට ජාතික ශිෂ්‍යභට බලකාය නිරන්තරයෙන්ම පියවර ගෙන ඇත. ජාතික ශිෂ්‍ය භට බලකාය නිලධාරීන්ගේ ප්‍රමිතිය ඉහළ නැංවීම සඳහා පාඨමාලා ගණනාවක්ම ( හමුදාමය හා සිවිල් පාඨමාලා) සැපසුම් කෙරිණ·

**ආධුනික නිලධාරි පාඨමාලාව**

ගුරුවරුන් බලකායේ නිලධාරීන් ලෙස බඳවා ගැනීංම මූලික පාඨමාලාව ආධුනික නිලධාරි පාඨමාලාව ලෙස හැඳින්වෙයි. මෙම පාඨමාලාවේ කාල පරාසය



ශිෂ්‍යභට නවාතැන් අළුත්වැඩියාව
සමස්තවියදම :
රුපි. 1,35,19,896·55



නිලධාරි නිවස්නය අවත්වැඩියාව
සමස්ත වියදම :
රුපි. 39,48,216.80



ජල ටැංකිය අළුත්වැඩියාව
සමස්ත වියදම
රුපි. 4,85,111.00



ජීව ගැස් පද්ධතිය අළුත්වැඩියාව
සමස්ත වියදම
රුපි. 49,145.00



අභ්‍යන්තර මාර්ග කාපට යෙදීම
සමස්ත වියද:
රුපි. 18,54,542.00



ක්‍රීඩා මණ්ඩපය අළුත්වැඩියාව
: නව බේකරි උදුන
සමස්ත වියදම: රුපි.
1,31,774.00





බාධක ව්‍යුහ ප්‍රතිසංස්කරණය
සමස්ත වියදම: රුපි. 300,090·00

## 18.3 ගැටළු හා අභියෝග

මූලස්ථානයේ, බලඇණිවල හා පුහුණු මධ්‍යස්ථානයේ කටයුතු සාර්ථකව ඉටුකරලීම සඳහා ප්‍රමාණවත් වාහන හා රියැදුරන් නොමැත.

වසර මුළුල්ලේම, ඒ ඒ බලඇණි විසින් ශිෂ්‍යභට පුහුණුව ක්‍රියාත්මක කරනු ලබන්නේ පාසල් මට්ටමනි. සියළු පුහුණු කටයුතු මෙහෙයවීමෙහි ලා බලවත් ගැටළුවක්ව ඇත්තේ බලඇණිවල නිත්‍ය කායීය මණ්ඩල උපදේශකවරුන් හිඟයයි.

පෞද්ගලික අංශයෙන් ලබා ගන්නා ලද සේවාවන් සඳහා ගෙවීම් ප්‍රමාදය නිසා තවදුරටත් ඔවුන්ගේ සේවය ලබා ගැනීම ගැටළුවක්ව පවතී. පුහුණු කටයුතු සුමටව කර ගෙන යාම සඳහා මෙකී ගෙවීම් අමාත්‍යාංශය විසින් සමථයකට පත් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 18.4 අනාගත අපේක්ෂා

දැනට, නාවික හා ගුවන් අංශ ඇඟයීම් කඳවුරු පවත්වා ගෙන යනු ලබන්නේ නාවික හා ගුවන් සේවා පරිශ්‍රයන්හි දීය. අනාගතයේ දී මෙම ඇඟයීම් කඳවුරු රන්ටැඹේ පුහුණු මධ්‍යස්ථානයෙහි පැවැත්විය යුතුයැයි අදහස් කෙරේ. එම නිසා, ශිෂ්‍යභටයින් වැඩි සංඛ්‍යාවකට නවාතැන් සපයමින්, පුහුණු කටයුතු කර ගෙන යාම සඳහා, මහවැලි අධිකාරිය විසින් ලබා දෙන ලද අබලන් ගොඩනැගිල්ල අළුත්වැඩියා කළ යුතුව ඇත.

රන්ටැඹේ, පුහුණු මධ්‍යස්ථානයෙහි, දින 9ක කාල පරාසයක් තුළ පැවැත්වෙන ඇගයීම් කඳවුරකට ශිෂ්‍යභටයින් 1,000 ක් පමණ සහභාගී වෙන අතර, වසරකට ඇගයීම් කඳවුරු 18 X ක් පමණ පැවැත්වෙයි. එම නිසා, රන්ටැඹේ පුහුණු මධ්‍යස්ථානයෙහි, ශිෂ්‍යභටයින්ගේ වැසිකිළි හා නිවස්න වහාම අළුත්වැඩියා කළ යුතුව ඇත.

# 19
# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය

## 19.1 සමාලෝචනය


ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය, *1981* අංක: *68* දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨ පණත යටතේ ස්ථාපිත කරන ලද අතර, ආයතනයේ මෙහෙයුම් විෂයය පථය තදනන්තර සංශෝධන ගණනාවකින් වර්ධනය වී ඇත. ආයතනය *1988* අංක: *27* දරන සංශෝධිත පණතින් විශ්ව විද්‍යාල ගණයට උසස් කරන ලද අතර, *2007* අංක:*50* දරණ පනත (සංශෝධිත) අනුව, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය ලෙස යළි නම් කෙරිණ. මෙම විශ්ව විද්‍යාලයෙන් ප්‍රදානය කරනු ලබන උපාධි ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් පිළිගනු ලබන අතර, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය පොදු රාජ්‍ය මණ්ඩලීය විශ්ව විද්‍යාල සංගමයේ ( *UK*) සහ ජාත්‍යන්තර විශ්ව විද්‍යාල සංගමයේ (*IAU*) සාමාජිකයෙක් ද වෙයි.

විශ්ව විද්‍යාලය, නිදහස් ආයතනයක් ලෙස ක්‍රියාත්මක වන රාජ්‍ය විශ්ව විද්‍යාලයක් වන අතර, ආරක්ෂක අමාත්‍යාංශය යටතේ කළමණාකාරිත්ව මණ්ඩලයක් මඟින් පාලනය කෙරේ. ත්‍රිවිධ හමුදා නියුක්තිකයන්, දිවයිනේ සුදුසුකම් ලත් තරුණ පිරිස්, විදේශීය ශිෂ්‍යයින් සහ රාජ්‍ය හා පෞද්ගලික අංශ පිරිස්වලට, උපාධි හා පශ්චාත් උපාධි මට්ටමේ උසස් අධ්‍යාපන අවස්ථා පිරිනමයි.

පසුගිය වර්ෂ පහ ඇතුළත, ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය ක්‍රම ක්‍රමයෙන් පෘථුල ස්ථාවරත්වයට පත්ව ඇති අතර, ස්වකීය ක්‍රියාකාරකම්වල කැපී පෙනෙන ප්‍රගතියක් පෙන්වා දී ඇත. ආයතනයේ ඉලක්ක වැඩි ප්‍රමාණයක් *2013* හා *2014* වසර තුළ සාක්ෂාත් කර ගැනීමට සැලසුම් කර තිබුණි.

## 19.2 2014 වසරේ මුදුන් පමුණුවා ගැනීම

*19·1* ප්‍රස්තාරය : ශිෂ්‍ය භට නිලධාරීන් / සිවිල් ශිෂ්‍යයින් බඳවා ගැනීම




*19·1* වගුව : කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

| ශ්‍රේණිය | බඳවා ගැනීම | විශ්‍රාමයෑම | ඉල්ලා අස්වීම | සේවය හැරයාම | සේවය අත්හිටුවීම | උසස්වීම | සේවා ගිවිසුම අවසන්වීම |
|---|---|---|---|---|---|---|---|
| අධ්‍යයන | 61 | 00 | 10 | 00 | 00 | 00 | 06 |
| පරිපාලන කාර්ය මණ්ඩල | 09 | 00 | 03 | 00 | 01 | 00 | 00 |
| අධ්‍යයන සහායක කාර්ය මණ්ඩල | 25 | 00 | 19 | 00 | 00 | 00 | 00 |
| ලිපිකරු හා ආශ්‍රිත සේවා | 26 | 00 | 10 | 00 | 00 | 03 | 00 |
| කණිෂ්ඨ සේවා | 27 | 01 | 05 | 09 | 00 | 00 | 00 |
| එකතුව | 148 | 01 | 47 | 09 | 01 | 03 | 06 |

### 19.2.1 විශ්ව විද්‍යාලයීය ආරෝග්‍යශාලාව ස්ථාපිත කිරීම

විශ්ව විද්‍යාලයීය ආරෝග්‍යශාලාව ඉදි කිරීම කටයුතු සීඝ්‍රයෙන් ක්‍රියාත්මක වෙයි. විදේශීය කොන්ත්‍රාත්කරුවෙකු විසින් ඇ.ඩො.මිලියන *162* ක පිරිවැයක් සහිතව ක්‍රියාත්මක වන අතර,

*2014* වසර අවසානය වන විට සියයට *50* ක ප්‍රගතියක් පෙන්වා ඇත.

### 19.2.2 ආශ්‍රිත සෞඛ්‍ය විද්‍යා පීඨය වේරහැරට ගෙනයාම

කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ ආශ්‍රිත සෞඛ්‍ය විද්‍යා පීඨය වේරහැර, විශ්ව විද්‍යාල ආරෝග්‍යශාලා සංකීර්ණයට යාබද ව අලුතින් ඉදි කරන ලද පීඨ ගොඩනැගිල්ලේ ස්ථාපිත කර ඇත. *2014* නොවැම්බර් මස *19* වන දින නිල වශයෙන් විවෘත කෙරිණ.



### 19.2.3 ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ දක්ෂිණ මණ්ඩපය ස්ථාපිත කිරීම



2014 පෙබවාරි මස 06 වන දින, සූරියවැවදී, ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ දක්ෂිණ මණ්ඩපය ස්ථාපිත කිරීම සඳහා මුල්ගල තැබිණ. 2015 මැයි මස 05 දින උත්සවාකාරයෙන් විවෘත කිරීමට නියමිතය.

### 19.2.4 උපාධි අධ්‍යයන පීඨ ගොඩනැගිල්ල ඉදි කිරීම

ඉදිකිරීම් කටයුතුවල භෞතිකමය ප්‍රගතිය සියයට 80 ක් පමණ වෙයි.

### 19.2.5 විශ්වවිද්‍යාල මුද්‍රණාලය ස්ථාපිත කිරීම

2014 සැප්තැම්බර් මස 04 වන දින මුල්ගල තබන ලද මෙම මුද්‍රණාලයෙන් විශ්වවිද්‍යාලයේ මුද්‍රණ අවශ්‍යතා ඉටු කර ගැනීමට නියමිතය. ව්‍යාපෘතියේ සම්පූර්ණ පිරිවැය විද්‍යාලයේ, ස්වයං මූල්‍ය අරමුදලෙන් ලබා ගන්නා ණයකින් දැරීමට නියමිතය.

### 19.2.6 කැඩෙට් නිලධාරි නිවස්න පහසුකම් වැඩිදියුණු කිරීම -කාර්ය මණ්ඩල සඳහා නිවාස ඒකක 20 ක්.

අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා නිවාස ඒකක 20 කින් සමන්විත සය මහල් ගොඩනැගිල්ලක් ද, නිවාස පහසුකම් අවශ්‍ය ශිෂ්‍යයින් සඳහාද සය මහළ් ගොඩනැගිල්ලක්ද තැනීමට අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතිය 2014-2015 කාල පරාසයේදී නිම කෙරෙනු ඇත.

### 19.2.7 විද්‍යාත්මක ප්‍රජාව සඳහා විවෘත ප්‍රවේශ ප්‍රතිපත්ති 24X7 පර්යේෂණාගාරය ඉදිකිරිම

ස්වකීය පර්යේෂණයන් පවත්වා ගෙන යාම සඳහා අති නවීන හා පරිපූර්ණ පහසුකම්වලින් සමන්විත 24X7 පර්යේෂණ රසායනාගාරයක් 2014 අගෝස්තු මස 20 වන දින ස්ථාපිත කරන ලදී.

### 19.2.8 ඉංජිනේරු පීඨ ගොනැගිල්ල ඉදි කිරීම

රුපියල් මිලියන 500 ක ඉදිකිරීම් පිරිවැයකින් යුත් මෙම ගොඩනැගිල්ල ශ්‍රී ලංකාවේ ඉදි කරනු ලබන ප්‍රථම පරිසර හිතකාමී පීඨ ගොඩනැගිල්ලයි. ඉදිකිරීම් කටයුතු සඳහා 2014.12.31 වන දිනට රුපියල් මිලියන 136 ක වියදම් දරා ඇත. එදිනට භෞතිකමය ප්‍රගතිය සියයට 35 කි. ව්‍යාපෘතියේ 1 වන අදියර 2015 මාර්තු මස නිම කරන ලදී.

### 19.2.9 කඳවල වැව ප්‍රතිසංස්කරණය

විශ්ව විද්‍යාල පරිශ්‍රයේ කඳවල වැව ප්‍රතිසංස්කරණය,CSR ව්‍යාපෘතියක් ලෙස, 2014 මැයි මස 22 වන දින නිම කෙරිණ.

විශ්ව විද්‍යාලයීය කාර්ය මණ්ඩලයේ දරුවන් සඳහා ශිෂ්‍යත්ව ලබාදීම ද, සහන පොලී අනුපාතයන් මත සිවිල් කාර්ය මණ්ඩලය සඳහා සුභසාධන ණය පහසුකම් ද, උප කුලපති සුභසාධන අරමුදලින් සිවිල් කාර්යාල මණ්ඩලය සඳහා හදිසි ණය පහසුකම් ද, විශ්ව විද්‍යාලයීය කාර්ය මණ්ඩලය සඳහා ප්‍රවාහන පහසුකම් ද, සැපයෙන අතර, වාර්ෂික ක්‍රීඩා උත්සවය ද, 2014 අගෝස්තු මස 21,22 දෙදින වාර්ෂික ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව ද, 2014 උපාධි ප්‍රදානෝත්සවය ද සංවිධානය කෙරින.

## 19.3 2014 වසරේ ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම්වල විග්‍රහය / ඇඟයීම


මුල්‍යමය ප්‍රගතිය

කොතලාවල විශ්ව විද්‍යාලයේ ප්‍රාග්ධන සහ පුනරාවර්තන අවශ්‍යතා, මහා භාණ්ඩාගාරය විසින් , ජාතික අයවැයෙන් වෙන් කරනු ලැබේ.

19·2· වගුව : 2008 සිට 2014 දක්වා සහ 2015 සඳහා ලත් අයවැය ප්‍රතිපාදනවල සාරාංශය

| වසර | රජයේ දායකත්වය රුපි. මිලියන | | |
|---|---|---|---|
| | පුනරාවර්තන | ප්‍රාග්ධන | එකතුව |
| 2008 | 186·49 | 10·60 | 197·09 |
| 2009 | 208·11 | 33·40 | 241·51 |
| 2010 | 222·42 | 136·17 | 358·59 |
| 2011 | 309·93 | 387·11 | 697·05 |
| 2012 | 341·99 | 421·33 | 763·33 |
| 2013 | 377·47 | 450·51 | 827·99 |
| 2014 | 649·44 | 519·45 | 1,168·89 |
| 2015 | 676·00 | 550·00 | 1,226·00 |

යථොක්ත කාලපරාසයන් සඳහා අයවැය ප්‍රතිපාදන පහත ප්‍රස්තාරයේ දැක්වෙයි.



එසේම, විශ්ව විද්‍යාලයීය ආරෝග්‍යශාලාවේ ඉදිකිරීම් කටයුතු 2013 වසරේ දී ආරම්භ කෙරින. ආරෝග්‍යශාලා ව්‍යාපෘතිය සඳහා ණය පහසුකම් ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් ප්‍රදානය කෙරින.

කෙසේවුවද, 2014 සහ 2015 ණය පොලී වාරික ගෙවීම සඳහා අයවැයෙන් ප්‍රතිපාදන සැලසින.

## අයවැය වෙන් කිරීම

| වසර | රජයේ දායකත්වය රුපියල් මිලියන |
|---|---|
| 2014 | 940 |
| 2015 | 2,300 |

පාරිසරික හා අවකාශීය විද්‍යාපීඨ ස්ථාපිත කිරීම සඳහා 2014 මුල් භාගයේ දී දකුණු මණ්ඩපය තැනීමේ වැඩ කටයුතු ආරම්භ කෙරිණ. ව්‍යාපෘතියේ මුල් අදියර රුපියල් මිලියන 1,000 කට ඇස්තමේන්තුගත කර ඇති අතර, ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සඳහා විශේෂ සංවර්ධන මූලාරම්භ අරමුදලින් රුපියල් මිලියන 600 ක් ලබා දී ඇත.

ගොඩනැගිලි හා යටිතල පහසුකම් තැනීම නාවික හමුදාව විසින් සීඝ්‍රයෙන් කර ගෙන යන අතර, අභ්‍යන්තර මාර්ග පද්ධතිය ශ්‍රී ලංකා යුදහමුදාව විසින් තැනෙමින් පවතී.

ඒ අනුව, අධ්‍යයන කටයුතු 2015 පෙබරවාරි මාසයේ දී ආරම්භ කෙරිණ.

ප්‍රධාන ප්‍රාග්ධන ව්‍යාපෘතිවල භෞතිකමය ප්‍රගතිය

කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය විසින් ඉදිකිරීම සඳහා භාරගෙන ඇති ව්‍යාපෘති 4 ක්, ප්‍රධාන ප්‍රාග්ධන ව්‍යාපෘති ලෙස හඳුනාගත හැක.

i. වෛද්‍ය පීඨ ගොඩනැගිල්ල තැනීම

ii. ඉංජිනේරු පීඨ ගොඩනැගිල්ල තැනීම

iii. විශ්ව විද්‍යාලයීය ආරෝග්‍යශාලාව ඉදිකිරීම

iv. සූරියවැව, දක්ෂිණ මණ්ඩපය ඉදිකිරීම

විසර්ජන ගිණුම්, ආදායම් ගිණුම් හා අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන්,

(i) පෞද්ගලික පඩිනඩි, පුනරාවර්තන හා මූලධන වියදම්

(ii) පූරෝකථනය හමුවේ සත්‍ය වූ වියදම් - 2014

(iii) පනවන ලද සීමා හමුවේ සත්‍ය වූ වියදම්

## 19.4 ගැටළු හා අභියෝග

විශ්ව විද්‍යාලය විසින්, ගැඹුරින් සිතා බලා, කරන ලද

විග්‍රහයෙන්, ස්වකීය අභිමතාර්ථයන් සපුරා ගැනීමෙහිලා මුහුණ පෑමට සිදුවන ගැටළු හඳුනාගෙන ඇත.

- අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය සඳහා කඳවල වත්තේ ඇති ඉඩකඩ ප්‍රමාණවත් නොවේ.
- විශ්ව විද්‍යාලය රත්මලාන ගුවන් තොටුපළට යාබදව පිහිටා ඇති හෙයින්, ගොඩනැගිලිවල ලම්බාකාර දීර්ඝකිරීම් මහල් හයකට සීමා කර ඇත.
- මුළු ශිෂ්‍ය සංඛ්‍යාවටම නවාතැන් පහසුකම් සලසා දිය නොහැක.
- විශ්ව විද්‍යාලය හා සමග ගිවිසුමකට එළඹිය යුතු හෙයින්, නිලධාරි ගණය සඳහා අයදුම් කරනු ලබන සමහර අයදුම්කරුවන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට බැඳීමට අකමැත්තක් දක්වති.

අභියෝග

- ගිවිසුම්වලට ඇතුළත්වීමක් නොමැති වෙනත් විශ්ව විද්‍යාලවලට ශිෂ්‍යයින් අන්තර්ග්‍රහණය වීම
- ඉහළ මට්ටමේ ස්කෝර් සහිත ශිෂ්‍යයින් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ ඇති යුදහමුදාමය පෙනුම නිසා වෙනත් විශ්ව විද්‍යාල වෙත ආකර්ෂණය වීම

## 19.5 අනාගත අපේක්ෂා

මධ්‍ය කාලීනව ( 2016-2018) සංවිධානය වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාත්මක කළයුතු ක්‍රියාකාරකම්

- අධ්‍යයන විෂය ධාරා විස්තාරණය
- විශ්ව විද්‍යාලයේ මණ්ඩපයක් උතුරු පළාතේ ස්ථාපනය
- නීති ආධාර නීති උපදේශණය සඳහා මධ්‍යස්ථානයක් විශ්ව විද්‍යාලයෙහි ස්ථාපිත කිරීම
- භූ තොරතුරු විද්‍යා දෙපාර්තමේන්තුවක් පිහිටුවීම
- ඉංජිනේරු උපදේශණ මධ්‍යස්ථානයක් පිහිටුවීම
- කාර්මික පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවීම
- සෞඛ්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයක් පිහිටුවීම
- උසස් පෙළ ඉහළ සාමාර්ථය ලත් සිසුන්ට කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ උපාධි සඳහා ලිවීමේ ශිෂ්‍යත්ව ලබාදීම

- විශ්ව විද්‍යාලයේ සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීම
- අර්ධ කාල නීති උපාධි වැඩසටහනක් ආරම්භ කිරීම
- වෛද්‍ය පීඨයෙහි පශ්චාත් උපාධි පාඨමාලා ආරම්භ කිරීම
- ආගන්තුක සත්කාර කළමණාකරණයෙහි ඩිප්ලෝමා හෝ උසස් ඩිප්ලෝමා පාඨමාලා ආරම්භ කිරීම
- ආරක්ෂක හා උපායමාර්ගික අධ්‍යයන විද්‍යාපති උපාධිය ආරම්භ කිරීම
- භාෂා සහ ඉංග්‍රීසි භාෂාව උගැන්වීමේ ශාස්ත්‍රවේදී උපාධි ආරම්භ කිරීම
- කෙටි දෙමළ පාඨමාලාවක් ආරම්භ කිරීම
- තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලා ආරම්භ කිරීම
- ලෝක ප්‍රසිද්ධ විශ්ව විද්‍යාල හා සමඟ අධ්‍යයන සහයෝගිතාව පවත්වා ගෙන යාම
- විශ්ව විද්‍යාලයීය වෙබ් අඩවිය ශ්‍රෙණිගත කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
- කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාල උපාධි පාඨමාලා සඳහා ජාත්‍යන්තර කඩඉම් ලකුණු අදාල කර ගැනීම
- MBA/BSc ලොජිස්ටික්ස් කළමණාකරණ උපාධිය සඳහා එක්සත් රාජධානියේ චාටර්ඩ් ඉන්ස්ටිටියුට් ඔෆ් ලොජිස්ටික්ස් ඇන්ඩ් ට්‍රාන්ස්පෝට් ආයතනයෙන් ප්‍රතීතනය ලබා ගැනීම
- විදේශීය විශ්ව විද්‍යාල හා සහයෝගිතාවයෙන් ආශ්‍රිත සෞඛ්‍ය විද්‍යා පශ්චාත් උපාධි පාඨමාලා ආරම්භ කිරීම
- සුප්‍රසිද්ධ විදේශීය විශ්ව විද්‍යාල හා සමඟ කාර්යමණ්ඩල/ශිෂ්‍යයින් හුවමාරු කර ගැනීමේ වැඩ සටහන් ආරම්භ කිරීම
- විදේශීය විශ්ව විද්‍යාල හා සමඟ සහයෝගිතාවයෙන්, ආරෝග්‍යශාලාවලට අනුයුක්ත 'ක්ලිනිකල් මෙන්ටර්ස්' පුහුණුව ආරම්භ කිරීම
- සමුද්‍රීය ඉංජිනේරු උපාධි විෂය පරිපාටිය සංශෝධනය කිරීම
- ඉංජිනේරු අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වොෂින්ටන් ඇකෝඩ් ඇක්‍රෙඩිටේෂන් තත්ත්වයට අධිශ්‍රේණිගතකිරීම
- කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ උපාධි වැඩ සටහන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව ආරක්ෂණ සහ ප්‍රතීතන සභාව Quality Assurance and Accreditation Council) විසින් ප්‍රතීතනය කිරීම අඛණ්ඩව කර ගෙන යාම
- භාෂා පර්යේෂණාගාර යාවත්කාලීන කිරීම
- අධ්‍යයන ගොඩනැගිලි අලුත්වැඩියාව හා පංතිකාමර පහසුකම් ප්‍රතිෂ්ඨාපනය
- වෘත්තීමය වැඩ සටහන් පැවැත්වීම සඳහා CCNA රසායනාගාර විවෘත කිරීම
- විශ්ව විද්‍යාලයේ පවතින තොරතුරු තාක්ෂණ පහසුකම් අධිශ්‍රේණිගතකිරීම
- ගෝලීය ප්‍රමිතියේ පර්යේෂණ සඳහා ශ්‍රී ලාංකීය හා විදේශීය දක්ෂ තරුණ විද්‍යාඥයින් ගේ සේවය ලබා ගැනීම
- රෝග විනිශ්චය පර්යේෂණ හා ප්‍රභේද පරීක්ෂණ ඒකක/ව්‍යාපෘති ස්ථාපිත කිරීම
- පශ්චාත් උපාධිමය උපාධි වැඩ සටහන් සමග පරිපූර්ණ KDU/CARE පහසුකම් ක්‍රියාත්මක කිරීම
- පුහුණු හා පර්යේෂණ සඳහා ව්‍යායාම් ශාලා ස්ථාපනය කිරීම
- ගමන්ලීලා හා හැසිරීම් විග්‍රහ පර්යේෂණාගාර පිහිටුවීම
- ෆුල්මිෂන් එන්ජින්රූම් සිමියුලේටරයක් ප්‍රසම්පාදනය
- වාස්තු වැඩපළක් ඉදිකිරීම
- වෙනත් උසස් අධ්‍යාපන ආයතනවල වැඩසටහන් ප්‍රතීතනය
- උසස් අධ්‍යාපන ගුරු සහතිකයට ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රතීතනය ලබා ගැනීම
- ක්‍රීඩා මණ්ඩපයක් හා මීටර් 400 කෘතිම ධාවන පථයක් තැනීම
- කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාල පරිශ්‍රයේ ස්මාරකස්තම්භයක් පිහිටුවීම

# 20
# ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය

## 20.1 සමාලෝචනය

ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය වූ කලී, ත්‍රිවිධ හමුදාවල මධ්‍යම ගණයේ හමුදා නිලධාරීන් සඳහා ශාස්ත්‍රීය පුහුණුව ලබා දෙන ආයතනයකි. පාඨමාලා විෂය ධාරාවට හමුදාමය, උපාය මාර්ගික හා ජාත්‍යන්තර අධ්‍යයනයන් අඩංගුය. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයෙහි විද්‍යාපති උපාධියට සුදුසුකම් ලබා දෙන පර්යේෂණ පාඨමාලා මෙහි පැවැත්වෙයි. ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය අංශ සතරකින් සමන්විතය. යුද හමුදා, නාවික සහ ගුවන් හමුදා අංශ, පාඨමාලා ඉගැන්වීමෙහි නියැලෙන අතර, සම්බන්ධීකරණ අංශය පුහුණු කිරීම් ඇතුළු සියලුම කාර්යයන් සම්බන්ධීකරණයෙහි නියැලී සිටී.

## 20.2 2014 වසරේ මුදුන් පමුණුවා ගැනීම්

### 20.2.1 ප්‍රධාන ක්‍රියාකාරකම්

#### 20.2.1.1 ව්‍යායාම

ඉගැන්වීම් මාධ්‍යයෙහි ප්‍රායෝගික අංගයන් ධාරණය කරවීම සඳහා බලඇණි රහිත ව්‍යායාමයන් භාවිතා කෙරේ. 2014 වසර තුළ ක්‍රියාත්මක කරන ලද ප්‍රධානතම ව්‍යායාමයන්ගෙන් සමහරක් නම්:

යුද හමුදා අංශය

- බ්‍රාස්ටැක්ස් ව්‍යායාමය
- අපර් කට් ව්‍යායාමය
- කොන්ක්‍රීට් ජන්ගල් ව්‍යායාමය
- ගෝල්ඩන් ෂීල්ඩ් ව්‍යායාමය



Exercise - BRASS



Exercise - UPPER



Exercise - CONCRETE



Exercise - GOLDEN

නාවික අංශය

- ඔක්ටෝපස් ව්‍යායාමය
- කොන්ටිකි ව්‍යායාමය
- ට්‍රයිඩන්ට් ව්‍යායාමය
- ඔප් යුලිසස් ව්‍යායාමය



Exercise - OCTOPUS



Exercise - KONTIKI



Exercise - TRIDENT



Exercise - OP – ULYSSESS

ගුවන් හමුදා අංශය

- සුතසි ව්‍යායාමය
- තන්ඩර් ස්ට්‍රයික් ව්‍යායාමය
- ගුවන් ප්‍රහාර ව්‍යායාමය
- ඔක්ටෝපස් ව්‍යායාමය



Exercise - SUTHASIA



Exercise - THUNDER



Exercise - GUWAN



Exercise - OCTOPUS

### 20.2.1.2 සංචාර

වැදගත් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන වෙත චාරිකා සහ සංචාර සංවිධානය කර, සහභාගී කරවීමෙන් ශිෂ්‍ය නිලධාරීන් ගේ දැනුම වර්ධනය කර ගැනීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී. එසේම, චීනය, ඉන්දුනීසියාව, මැලේසියාව, පිලිපීනය, තුර්කිය, තායිලන්තය හා එක්සත් එමීර් රාජ්‍යයේ හමුදාමය ආයතන වෙත දින 10 ක පමණ විදේශීය අධ්‍යාපන චාරිකා සංවිධානය කරන ලදී.


චීනය


මැලේසියාව


තර්කිය


පිලිපීනය


ඉන්දුනීසියාව


එක්සත් අරාබි එමීර්

## 20.2.2 විශේෂ අවස්ථා

### 20.2.2.1 විදේශ දූත කණ්ඩායම් වල සංචාර

2014 වසරේදී පහත විස්තර දැක්වෙන විදේශීය දූත පිරිස් ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ සංචාරය සඳහා පැමිණියහ.

- උගන්ඩා ජනරජයේ ආරක්ෂාව පිළිබඳ රාජ්‍ය අමාත්‍ය ගරු ජෙනරාල් ඕඩී ඔඩොන්ගෝ ජේජේ (විශ්‍රාමික) මහතා 2014 ජනවාරි මස 29 දින.



- නේපාලයේ හමුදා කාර්ය මණ්ඩල ප්‍රධානි, ජෙනරාල් ගව්රව් ෂුම්ෂේ ජුං බහදූර් රානා මහතා 2014.02.03 වන දින



- ඕමාන් සුල්තානයේ හමුදාමය දූත පිරිසක් 2014.04.01 දින.



- පකිස්තානයේ, කාර්ය මණ්ඩල කමිටු සම ප්‍රධානින්ගේ සභාපති ජෙනරාල් රෂාඩ් මොහමඩ් මහතා 2014.04.09 දින



- ඊශ්‍රාලයේ නිවාස අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජෙනරාල් සහ කාලතුවක්කු බල ඇණියේ ආඥාපති බ්‍රිගේඩියර් ජෙනරාල් ඇරි මිෂ්රාචි මහතා (විශ්‍රාමික) 2014.7.24 වන දින.



- බංග්ලාදේශයේ ජාතික ආරක්ෂක විද්‍යාලයේ දූත පිරිස 2014 අගෝස්තු 22 සිට 31 දක්වා.



- පකිස්තානු ඉස්ලාමීය ජනරජයේ ගුවන් හමුදා කාර්ය මණ්ඩල ප්‍රධානි එයාර් චීෆ් මාෂල් තාහීර් රෆික් බට් මහතා 2014.08.29 වන දින.



**ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරින්ගේ පැමිණීම**

2014 වසරේදී පහතදැක්වෙන ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරීන් ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය වෙත පැමිණියහ.

- හමුදාපති, ලෙප්ටිනන්ට් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක මහතා WWV RWP RSP USP ndu psc - 2014.12.05 වන දින.



- නාවික හමුදාපති, වයිස් අද්මිරාල් එස්ඒඑම්ජේ පෙරේරා මහතා RWP VSV USP ndu psc- 2014.12.10 දින.



- ගුවන් හමුදාපති, එයාර් මාෂල් කෝප් ගුණතිලක මහතා, RWP RSP VSV USP MSc (ආරක්ෂක අධ්‍යයන) 2014.12.10 දින.



- ආරක්ෂක මණ්ඩල ප්‍රධානි ජෙනරාල් ජේ. ජයසූරිය මහතා, RWP VSV USP ndu psc - 2014.112.112 දින.



### 20.2.3 අධ්‍යාපනික වැඩසටහන්

2014 වසරේදී පහත දැක්වෙන අධ්‍යාපනික වැඩ සටහන් ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේදී ක්‍රියාත්මක කෙරිණ.

- ඒකාබද්ධ සංග්‍රාම වැඩමුළුව, ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය සහ බංග්ලාදේශයේ මිර්පූර් දූත පිරිස, 2014.08.22 සිට 28 දක්වා.



- ජාත්‍යන්තර මානවවාදී නීති ICRC වැඩමුළුව - 2014 සැප්තැම්බර් 1 සිට 3 දක්වා.



### 20.2.4 උපාධි ප්‍රධානෝත්සවය



ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ අංක:8 දරණ පාඨමාලාවේ උපාධි ප්‍රදානෝත්සවය විද්‍යාලීය ශ්‍රවණාගාරයේදී 2014 දෙසැම්බර් මස 17 වන දින පැවැත්විණ.

**20.2.** වගුව : ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ අංක : 8 දරණ පාඨමාලාවේ ප්‍රතිඵල

| | අවසන් වාරයේදී ශිෂ්‍ය නිලධාරි සංඛ්‍යාව | විද්‍යාවේදී | | ශාස්ත්‍රපති උපාධියට සුදුසුකම් ලත් |
|---|---|---|---|---|
| | | ප්‍රදානය වූ | පාඨමාලාව හැදෑරූ | |
| හමුදා අංශය | 71(10*) | 68(09*) | 3(01*) | 20(07*) |
| නාවික අංශය | 25(04*) | 24(04*) | 1 | 18(03*) |
| ගුවන් අංශය | 22(02*) | 22(02*) | - | 18(01*) |
| එකතුව | 118(16*) | 114(15*) | 4(01*) | 56(11*) |

* විදේශීය ශිෂ්‍යයින්

### 20.2.5 සපුරාගත නොහැකි වූ ඉලක්ක

අරමුදල් හිඟය නිසා, රුපි. මිලියන 20.4 ක පිරිවැයකින් යුත් ගොඩනැගිලි ඉදිකිරීම 2015 වසරට කල් දැමිණ.


### 20.2.6 ධාරිතා සංවර්ධනය

යටිතල පහසුකම්

- විද්‍යාලයේ අධ්‍යයන අංශ ගොඩනැගිලිවලට සිව් මහල් ඒකාබද්ධ සංග්‍රාමික ගේම් මධ්‍යස්ථානයක් එක් කෙරින. භූමි ප්‍රමාණය වර්ග අඩි 24214 කි. 202 දෙනෙකුට ආසන පහසුකම් සහිත ශ්‍රවණාගාර දෙකකින්ද සමන්විතය. ව්‍යාපෘති පිරිවැය රුපිත 47.08 කි.
- නිලධාරි නිවස්නයේ මුළුතැන්ගෙය මෙවලම් යොදා අධිශ්‍රේණිගත කෙරින.
- රුපියල් මිලියන 37.9 ක පිරිවැයකින් ශිෂ්‍ය නිවස්න ගොඩනැගිලි දෙකක් ඉදි කෙරින. ඒකල නිලධාරින් 24 දෙනෙකුට පහසුකම් සැලසිය හැක.

## 20.3 2014 වසරේ ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම්වල විග්‍රහය / ඇගයීම

**20.1 ප්‍රස්තාරය : මූල්‍යමය ප්‍රගතිය**




ප්‍රාග්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය

- ශිෂ්‍ය නිලධාරි නිවස්න ගොඩනැගිලි පේළි ඉදිකිරීම 2014 වසරේදී නිම කෙරිණ. මෙම ව්‍යාපෘති සඳහා වසර තුළදී රුපි. මිලියන 39.7 ක් ගෙවා ඇත.
- සිව් මහල් ඒකාබද්ධ ගොඩනැගිල්ලක් තනා නිම කෙරිණ. මෙම ව්‍යාපෘතිය සඳහා රුපි. මිලියන 47.08 ක් ගෙවන ලදී.

- පාඨමාලා සහ ආශ්‍රිත පුහුණු ක්‍රියාකාරකම් උපලේඛණගත කරනලද පරිදි පවත්වන ලදී.

## 20.4 ගැටළු හා අභියෝග

සමස්ත අරමුණු සපුරා ගැනීමෙහි ලා මුහුණ පෑ ගැටළු දෙවර්ගයකි.

**ගැටළු**

අ. මූල්‍යමය දුෂ්කරතා
ආ. මිනිස්බල දුෂ්කරතා

අභියෝග

අ. විදේශීය ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කිරීම

ආ. දේශණ සඳහා විශිෂ්ඨ සම්පත් දායකයින් ලබා ගැනීම

## 20.5 අනාගත අපේක්ෂා

මාණ්ඩලික පාඨමාලාව මුළුමණින්ම ගෘහස්ථ පාඨමාලාවක් වන හෙයින්, විශෙෂිත අවස්ථාවකදී හැර සම්පූර්ණ ශිෂ්‍ය සංඛ්‍යාවටම විද්‍යාල භූමිය තුළ විවාහක නවාතැන් පහසුකම් සැපයිය යුතු වෙයි.මෙය වෙනත් මාණ්ඩලික විද්‍යාලවලද අනුගමනය කරන සම්ප්‍රදායයකි. විද්‍යාල පරිශ්‍රයේ දැනට ඇති විවාහක නවාතැන් සංඛ්‍යාව *13* ක් වන අතර, මධ්‍ය කාලීනව අවශ්‍ය සංඛ්‍යාව *35* කි. විවාහක නිවාස සංඛ්‍යාව වැඩි කරන්නේ නම්, ආශ්‍රිත උපයෝගිතා පහසුකම් ද ඒ හා සමානව වැඩි කළ යුතු වෙයි.

# 21
# ආරක්ෂක සේවා විද්‍යාලය

## 21.1 සමාලෝචනය

2007 ජනවාරි මස 01 වන දින, කොළඹ 2, මැලේ වීදියේ, හෙක්ටෙයාර 4.5 ක භූමි භාගයක, ජාතික පාඨශාලාවක් ලෙස, කොළඹ ආරක්ෂක සේවා විද්‍යාලය ආරම්භ කරන ලදී. සන්නද්ධ සේවාවල හා පොලිසියේ සාමාජිකයින්ට ස්වකීය දරුවන් ජනප්‍රිය පාඨශාලාවලට ඇතුළත් කර ගැනීමට දැනට ඇති දුෂ්කරතා මඟහරවාලීම සඳහා මෙය ස්ථාපිත කෙරිණ. විනයානුකූල පරිසරයක උසස් ගුණාත්මකභාවයකින් යුත් හා අපක්ෂපාතී අධ්‍යාපනයක් සැලසීම සඳහා වන රජයේ උත්සාහයට සහාය වන්නා වූ නව පාලක ක්‍රමයක් සැලසුම්කර, වර්ධනය කර, අත්හදාබැලීමකට භාජනය කිරීම ද මෙමඟින් සිදු කෙරෙනු ඇත. විද්‍යාලය අධ්‍යාපන අමාත්‍යාංශයේ සෘජු පාලනය යටතේ ක්‍රියාත්මක වන අතර, පරිපාලන කටයුතු ඉටු කරනු ලබන්නේ ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය විසිනි.

මිශ්‍ර පාසලක් වන මෙහි ශිෂ්‍ය සංඛ්‍යාව 2240 කට අධික අතර, ගුරු මණ්ඩලය 99 කි. වසර 13 දක්වා පංති ආරම්භ වූ කල්හි, ශිෂ්‍ය ගහණය 3600 දක්වා ඉහළ යනු ඇත. ශ්‍රේණි1 සිට 9 දක්වා, සියලුම අධ්‍යාපන හා විෂයානුබද්ධ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනයෙහිලා දැඩි හා විස්තරාත්මක ප්‍රවේශයක් සපුරාලීමට විද්‍යාලය බැඳී සිටී. එසේම, මනුෂ්‍ය වර්ගයාගේ යහපත උදෙසා, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ අධ්‍යාපන අමාත්‍යාංශයෙහි මඟ පෙන්වීමට අනුගතව, භාවිතයට ගත යුතු



**ආරක්ෂක සේවා විද්‍යාලය - කොළඹ**

විශ්ෂයතම සම්පත ලෙස විද්‍යාලය විසින් සළකණු ලබන්නේ අධ්‍යාපනයයි. බුද්ධිමත් විමර්ෂණය වර්ධනය කිරීමෙහි යෙදී සිටින විද්‍යාලය දැනුම සඳහා ඇති පිපාසය වන්දනීය ක්‍රියාදාමයක් බව පිළිගනී.

කුරුණෑගල, ආරක්ෂක සේවා විද්‍යාලය, 2009 ජනවාරි මස 29 වන දින ජාතික පාසලක් ලෙස ස්ථාපිත කෙරිණ. මිශ්‍ර පාසලක් වන මෙහි ශිෂ්‍ය සංඛ්‍යාව 665 කට අධික අතර, ගුරු මණ්ඩලය 28 කි.




**ආරක්ෂක සේවා විද්‍යාලය - කුරුණෑගල**

## 21.2 2014 වසරේ මුදුන් පමුණුවා ගැනීම්


2014 වසරේ ප්‍රධානතම ක්‍රියාකාරකම් හා ප්‍රගතිය


- ප්‍රාථමික ගොඩනැගිල්ල තැනීම




- ආරම්භය - 2011 අගෝස්තු 01
- නිම කිරීම - 2014 පෙබරවාරි 02
- වියදම - රුපි. මිලියන 224
- ගොඩනැගිලි වර්ගය - පස් මහල් පංති කාමර හා නිවසන
- උපයෝගි පහසුකම් - මාණ්ඩලික කාමර, වැසිකිළි පද්ධති හා නේවාසික ඒකක
- සමස්ත භූමි ප්‍රමාණය - වර්ග මීටර් 6814

- පසුගිය වසරේ ( 2013) සපුරාගත නොහැකි වූ ඉලක්ක හා ඉදිරි වසරට ( 2015) කල්දැමූ ඉලක්ක
- නේවාසිකාගාර ගොඩනැගිල්ල හා ක්‍රීඩාභූමිය ඇස්තමේන්තගත පිරිවැය - රුපි. මිලියන 603




## 21.3 2014 වසරේ ක්‍රියාකාරකම්වල විග්‍රහය/ අගැයීම

ඇඟයීම හා උගත් පාඩම් - ආරක්ෂක අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ යුද හමුදා අංශ විසින් ඉටු කරන ලද ඉදිකිරීම්, බාහිර කොන්ත්‍රාත්කරුවන් විසින් කෙරෙන කටයුතු වලට වඩා කාර්යක්ෂමව නිම කළ බව කිවයුතුය.

## 21.4 ගැටළු හා අභියෝග

- විදුලිබල හා ජලබිල්පත් ගෙවීම සඳහා අරමුදල් වෙන් කිරීම
- ජල පවිත්‍රා පද්ධතිය සේවා කිරීම
- ආරක්ෂක විද්‍යාල කෙටුම්පත් පනත අනුමත කිරීම
- සේවා ගිවිසුම් අලුත්කිරීම

## 21.5 අනාගත අපේක්ෂා

- නේවාසිකාගාර හා ක්‍රීඩා භූමිය තැනීම - ඇස්තමේන්තුගත පිරිවැය - රුපි. මිලියන 603
- පරිගණක රසායනාගාර පද්ධතිගත කිරීම
- දත්ත මූලයන් සකස් කිරීම
- උසස් පෙළ වැඩ සටහනක් ආරම්භ කිරීම

# 22
# ඒකාබද්ධ සේවා භාෂා පුහුණු ආයතනය

## 22.1 සමාලෝචනය

1986 වසරේදී, ආරක්ෂක අමාත්‍යාංශය යටතේ, ඒකාබද්ධ සේවා භාෂා පුහුණු ආයතනය ආරම්භ කරන ලද්දේ, ආරක්ෂක හමුදා නිලයන්ට දමිළ භාෂාව ඉගැන්වීම, දමිළ භාෂාව ලිවීම, කියැවීම හා කථනයෙහි කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම යන අරමුණු පෙරදැරි කර ගෙනය. ත්‍රිවිධ හමුදා සහ පොලිසිය සඳහා පාඨමාලා 89 ක් අවසන් කර ඇත.

## 22.2 2014 වසරේ මුදුන් පමුණුවා ගැනීම්

### 22.2.1 ප්‍රධාන ක්‍රියාකාරකම්

- 2014 වසරේදී ආයතනය විසින් ත්‍රිවිධ හමුදා හා පොලීසියේ ශිෂ්‍යයින් 345ස් දෙනෙකු සඳහා පාඨමාලා 03ක් සාර්ථකව නිම කරන ලදී.
- රුපියල් 12,34438.00 ක වියදමින් නළ ළිං පද්ධතියක් තනවා ඇත.



- ශිෂ්‍ය වැසිකිළි පද්ධතිය අළුත්වැඩියාව - වියදම රුපි. 2,44561.00.



- Constructed one Pre-fabricated building.



### 22.2.2 2015 වසර දක්වා කල්දැමූ වැඩ

- යෝජිත කාර්යාල සංකීර්ණ ගොඩනැගිලි
- ශිෂ්‍ය නිලධාරි නිවස්න අළුත්වැඩියාව
- නිලධාරි / සාජන්ට් නිවස්න අවශ්‍යතා

### 22.2.3 උගත් පාඩම්

ආයතනයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා ප්‍රධානතම සාධකයක් වන්නේ යටිතල පහසුකම් බව ආයතනය විසින් හඳුනා ගෙන ඇත. සේවා සාමාජිකයින් අතර උනන්දුව සීඝ්‍ර ලෙස ඉහල ගොස් ඇත.

## 22.3 ගැටළු හා අභියෝග

- අවශ්‍යතා සම්පූර්ණ කිරීමට ප්‍රමාණවත් නවාතැන් පහසුකම් ආයතනය සතුව නැත.
- භෞතික සම්පත් නොමැති වීම මෙම ආයතනයට පරිපාලනමය ගැටළු ඇති වේ.

## 22.4 අනාගත අපේක්ෂා

- නිවස්නයන්හි යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම.
- ඉංග්‍රීසි හා ප්‍රංශ පාඨමාලා ආරම්භ කිරීම.

# 23
# සීමාසහිත ලංකා ලොජිස්ටික්ස් ඇන්ඩ් ටෙක්නොලොජීස්

## 23.1 සමාලෝචනය

සීමාසහිත ලංකා ලොජිස්ටික්ස් ඇන්ඩ් ටෙක්නොලොජීස් සමාගම ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මුළුමනින්ම රජය සතු ආයතනයක් වන අතර, අමාත්‍යාංශයට හා එහි රේඛීය ආයතනයන්ට අවශ්‍ය සීමාකරන ලද විෂයයන් ප්‍රසම්පාදනයෙහි ලා ප්‍රමුඛතම කාර්ය භාරයක් ඉටු කරයි. අර්බුධකාරී තත්ත්වයෙන් පසු, ජාතික මට්ටමේ ව්‍යාපෘති ගණනාවක නියැලුණු මෙම ආයතනය ශ්‍රී ලංකාවේ ස්වදේශීයමය ආරක්ෂක සංවිධානයක් ප්‍රවර්ධනය කිරිම අරමුණු කොටගත් ව්‍යාපෘතිවලට සක්‍රිය ලෙස සම්බන්ධ විය.

## 23.2 2014 වසරේදී මුදුන් පමුණුවා ගැනීම්

### 23.2.1 ප්‍රධානතම ක්‍රියාකාරකම්

මෙම කාල වකවානුවේදී ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු ගුවන්යානයකට අවශ්‍ය සර්වසම්පූර්ණ පිරිවැඩියාවක් පහසුකරවීමට හා ගුවන් හමුදාවට අවශ්‍ය වූ උපස්තම්භක අයිතමයන් ප්‍රසම්පාදනයට ද, ශ්‍රී ලංකා යුද හමුදාවට අවශ්‍ය වූ වාහන ණය පදනමකින් පකිස්ථානයෙන් ප්‍රසම්පාදනය කර ගැනීමට ද මෙම ආයතනයට හැකිවිය.

ජාතික පුද්ගලයින් ලියාපදිංචි කිරීමට අදාල කොන්ත්‍රාත්තුව, ව්‍යාපාර සම්පත් සැලසුම් විසඳුමක් ක්‍රියාත්මක කිරිමෙහි ලා නාගරික සංවර්ධන අධිකාරියට උපදේශක සේවාවන් සැපයීම වැනි තොරතුරු හා සංනිවේදන තාක්ෂණික හා ආරක්ෂිත ව්‍යාපෘති ගණනාවකට අදාල කටයුතු වලද මෙම ආයතනය නියැලුණි.

මෙම සමාගම, ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ලාගැණෙන ආයතන හා වෙනත් රාජ්‍ය ආයතන ගණනාවකට උපදේශක සේවාවන් ලබා දීමටද කටයුතු කළේය. ඒ අනුව, සංයුක්ත සැලසුම් සම්පාදනයෙහි සහධ්‍යතා අධ්‍යයනයෙහි නියලුන මෙම සමාගම විශේෂිත වූ අධ්‍යයනයක, එනම්, ශ්‍රී ලංකා මහ බැංකුව වෙනුවෙන් කොළඹ ව්‍යාපාරික දිස්ත්‍රික්කයේ යටිතල ධාරිතා සුදානම තක්සේරු කිරීමේ කාර්යයේ ද නියැලුණි.

ආරක්ෂක අමාත්‍යාංශය සඳහා, ආරක්ෂණ ප්‍රයත්නය වාණිජකරණය කිරීමේ මහ සැලැස්ම සම්පාදනය කිරීම ද මෙම සමාගම විසින් ආරම්භ කර ඇත.


### 23.2.2 ධාරිතා සංවර්ධනය


සංවිධානයක සාර්ථකත්වය සඳහා ප්‍රධානතම ආයෝජන ක්‍රමවේදය වන්නේ කාර්ය මණ්ඩල පුහුණුව හා සංවර්ධනය බව සමාගමේ විශ්වාසයයි. එම නිසා, තොරතුරු තාක්ෂණ කුසලතා සංවර්ධනය හා ප්‍රසම්පාදනය, කළමණාකරණයට අදාල සහතික මට්ටමේ පාඨමාලා, තොරතුරු තාක්ෂණය හා මුදල් යන විෂයයන්ට අදාල වැඩමුළු මෙන්ම ව්‍යාපාරික සම්මන්ත්‍රණ හා සංසදවලට සහභාගීවීමේ අවස්ථාව ස්වකීය කාර්ය මණ්ඩලවලට සලසා දේ.


## 23.3 2014 වසරේ ක්‍රියාකාරකම් වල විග්‍රහය/ අගැයීම

**23.1** වගුව: **2008-2014** මූල්‍යමය ප්‍රගතිය

| විස්තරය | 2007/08 | 2008/09 | 2009/10 | 2010/11 | 2011/12 | 2012/13 | 2013/14 |
|---|---|---|---|---|---|---|---|
| | රුපි.මිලි | රුපි.මිලි | රුපි.මිලි | රුපි.මිලි | රුපි.මිලි | රුපි.මිලි | රුපි.මිලි |
| **ආදායම සහ අදාල කාර්ය සාධනය** | | | | | | | |
| ආදායම | 71·40 | 105·45 | 40·71 | 46·09 | 69·97 | 130·62 | 95·17 |
| දළ ලාභය | 15·40 | 23·69 | 6·73 | 33·67 | 69·46 | 99·68 | 81·50 |
| මෙහෙයුම් ලාභය (පොලී/බදුවලට පෙර ලාභය | 2·27 | 4·67 | 4·92 | 11·00 | 4·28 | 13·81 | 9·60 |
| බදු පූර්ව ලාභය | 1·75 | 4·13 | 4·81 | 10·82 | 7·62 | 17·38 | 15·57 |
| බදු | 1·05 | 3·57 | 2·77 | 3·18 | 2·91 | 3·23 | 4·70 |
| බද්දෙන් පසු ලාභය | 0·69 | 0·57 | 2·04 | 7·65 | 4·71 | 14·15 | 10·88 |
| **වත්කම් හා බැරකම් තත්ත්වය** | | | | | | | |
| අනාවර්තන වත්කම් | 11·43 | 10·63 | 8·43 | 4·03 | 15·48 | 12·53 | 8·56 |
| ආවර්තන වත්කම් | 124·63 | 174·88 | 138·00 | 132·62 | 194·46 | 159·09 | 157·02 |
| මුළු වත්කම් | 136·06 | 185·51 | 146·43 | 136·65 | 209·94 | 171·62 | 165·58 |
| සමස්ත සම කොටස් | 96·44 | 97·00 | 93·30 | 100·95 | 106·97 | 119·39 | 109·04 |
| අනාවර්තන බැරකම් | - | 0·76 | 1·33 | 1·87 | 19·30 | 4·08 | 4·04 |
| ආවර්තන බැරකම් | 39·62 | 87·74 | 51·80 | 33·83 | 83·67 | 48·14 | 52·50 |
| ශුද්ධ වත්කම් | 96·44 | 97·00 | 93·30 | 100·95 | 106·97 | 119·39 | 109·22 |
| ප්‍රකාශිත භාජ්‍යය | - | - | - | - | - | 1·05 | 1·20 |
| **අනුපාත විග්‍රහය** | | | | | | | |
| කොටසක ඉපැයීම | 3,375 | 2,756 | 9,930 | 37,312 | 22,974 | 69,003 | 1·36 |
| කොටසක ශුද්ධ වත්කම | 470,439 | 473,171 | 455,122 | 492,425 | 521,818 | 582,400 | 14·00 |
| සම කොටස් මත අදායම | 0·72 | 0·59 | 2·19 | 7·58 | 4·40 | 11·85 | 9·97 |
| සමස්ත වත්කම් මත ආදායම | 1·67 | 2·52 | 3·36 | 5·60 | 2·24 | 8·24 | 6·57 |
| දළ ලාභ ආන්තරික | 21·57 | 22·47 | 16·53 | 73·06 | 99·28 | 76·31 | 85·63 |
| මෙහෙයුම් ලාභ ආන්තරික | 3·18 | 4·43 | 12·09 | 23·87 | 6·12 | 13·31 | 16·36 |
| ශුද්ධ ලාභ ආන්තරික | 0·97 | 0·54 | 5·01 | 16·60 | 6·73 | 10·83 | 11·43 |
| ආවර්තන වත්කම් අනුපාතය | 3·15 | 1·99 | 2·66 | 3·92 | 2·32 | 3·30 | 2·99 |









## 23.4 ගැටළු හා අභියෝග

සන්නද්ධ හමුදාවලට ලබා දෙන ලද සේවාවන් සඳහා අයවිය යුතු මුදල් අයකර ගැනීමේ දී මුහුණ පෑමට සිදුවන අභියෝගය සමාගමට මුහුණ පෑමට සිදුවී ඇති උග්‍රම අභියෝගය ලෙස සැළකිය හැක. ගෙවිය හැකි අවමය ගෙවීමේ ණයගැතියන්ගේ පුරුද්ද, සංවිධානයක් ලෙස වර්ධනය වීමට ආයතනයට ඇති ඉඩකඩ අසුරාලයි. මෙම අභියෝගයන් හමුවේ වුවද, ලංකා ලොජිස්ටික්ස් ඇන්ඩ් ටෙක්නොලොජීස් සමාගම සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් වලට වේලාවට කර ඇතිවාක් මෙන්ම, ණයහිමියන්ට කළ යුතු ගෙවීම් නොනිසි ලෙස ප්‍රමාද කර නොමැති අතර, පසුගිය දෙවර්ෂය තුළ භාණ්ඩාගාරයට ගෙවිය යුතු ලාභාංශ ද ගෙවා ඇත. අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත සමවර්ත සියයට 2·5 හෝ පරිපාලන ගාස්තුව, එවන් ගාස්තු ඉපැයීම මත සීමාවක් (රුපි.මිලියන 50) පැනවීමෙන්,සමාගම විසින් සංශෝධනයට භාජනය කර ඇත.

සමාගම මුහුණ දෙනු ලබන තවත් අභියෝගයක් නම්, ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ගැණෙන ප්‍රධාන ව්‍යාපෘති ගණනාවක් ආරම්භ කිරීමෙහි දී ලබා දෙන ලද සේවාවන් සඳහා දරන ලද වියදම් ප්‍රතිපූරණය නොවීමයි.

## 23.5 අනාගත අපේක්ෂා

### 23·5·1 මධ්‍ය කාලීනව (2016-2018) සංවිධානය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාත්මක කළයුතු ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකාවේ ආරක්ෂක ක්‍රියාකාරිත්ව කර්මාන්තයක් නිර්මාණය කිරීමේ ස්වකීය කැපවීම් භාරයේ කොටසක් ලෙස, ඩීඑස්අයි සමාගම හා එක්ව, හමුදා පාවහන් නිෂ්පාදන ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ ව්‍යාපෘතියේ වැඩ කටයුතු අඛණ්ඩව කර ගෙන යාමට ලංකා ලොජිස්ටික්ස් ඇන්ඩ් ටෙක්නොලොජීස් සමාගම අපේක්ෂා කරයි.

ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය ආයෝජනය අවසන් කිරීමට සමාගමට නොහැකි වී ඇත්තේ සන්නද්ධ හමුදා විසින් හා අනෙකුත් රාජ්‍ය ආයතනවලින් අයවිය යුතුව ඇති ගෙවීම් නොලැබීම ය. 2007 සිට 2008 ජූලිදක්වා කාල පරාසය තුළ සමාගම විසින් උපයා ගන්නා ලද ආදායම් එවැනි ව්‍යාපෘතිවල ආරම්භක ප්‍රාග්ධනය ලෙස සමාගමට ලබා දෙන බවට මහා භාණ්ඩාගාරය කර ඇති දැනුම්දීම අනුව, එවන් ආරම්භක ප්‍රාග්ධනයක් 2015 වසරේදී හිමිවේයැයි සමාගම අපේක්ෂා කරයි·

### 23·5·2 දීර්ඝ කාලීන පදනමින් සමාගම වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාත්මක කළ යුතු ක්‍රියාකාරකම්

ලංකා ලොජිස්ටික්ස් ඇන්ඩ් ටෙක්නොලොජීස් පනත් කෙටුම්පත සූදානමිය. නීතිපතිතුමන්ගෙන් හා නීති කෙටුම්පත් සම්පාදකවරයාගෙන් ලැබිය යුතු අනුමැතිය ලැබී ඇත. කෙසේවුවද, මෙම පනත සම්බන්ධයෙන් ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 2011 දෙසැම්බර් මස 20 වන දින අංක: 12/0125/503/007 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය අමාත්‍ය මණ්ඩලය විසින් දැනට විලම්බනය කර ඇත. සමාගමේ තිරසාරත්වය වැඩි දියුණු කිරීම සඳහා මෙම කාරණය ඉදිරියේදී සමථයට පත් කිරීම අතිශයින් වැදගත්ය.

# 24
# සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා සමාගම

## 24.1 සමාලෝචනය

සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා ආයතනය මුළුමණින්ම ලංකාණ්ඩුව සතු ආයතනයක් වන අතර, ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වෙයි. එය 1982 අංක:17 දරණ වෙළඳ සමාගම් පණත යටතේ 2006 ඔක්. මස 23 වන දින සීමාසහිත ප්‍රමුඛ ආරක්ෂක ලංකා ලෙස ලියාපදිංචි කරන ලද අතර, පසුව 2008 ජූලි මස 28 වන දින, 2007 අංක: 07 දරණ සමාගම් පණත යටතේ සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා ලෙස යළි ලියාපදිංචි කෙරිණ. සමාගමේ මූලස්ථානය බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ ස්ථාපිත කර ඇති අතර, මහනුවර,මාතර, ගාල්ල, රත්නපුර, අනුරාධපුර, බටහිර, කටුනායක, හම්බන්තොට හා වයඹ ස්ථාපිත කර ඇති කලාපීය කාර්යාල 09 කින් සමන්විතය.

සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා ආයතනය ස්ථාපිත කරණ ලද්දේ ප්‍රධාන අරමුණු 2 ක් පෙරදැරි කර ගෙනය. එනම්:

- රජයේ ආයතන හා වෙනත් ජාතික වැදගත් කමකින් යුත් ආයතන සුරැකීමට සහ;
- ශ්‍රී ලංකාවේ සුරක්ෂිතාවය හා භෞමික අඛණ්ඩත්වය රැකගැනීම සඳහා කරන ලද දායකත්වය අගය කිරීම පිණිස ඔවුන් සන්නද්ධ බලකාය වලින් විශ්‍රාම ගැනීමෙන් පසු යළි රැකියා අවස්ථා ලබාදීම.

සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා ආයතනයේ ආරක්ෂක බලකාය සම්පූර්ණයෙන්ම සමන්විත වන්නේ සේවාමුක්ත පිරිමි හා කාන්තා දෙපාර්ශවයෙන්, එනම් අන්තවාදී ත්‍රස්තවාදී තර්ජනයන්ගෙන් ජාතිය ආරක්ෂා කර ගැනීම සඳහා දිවි නොතකා කටයුතු කළ පුද්ගලයින්ගෙනි. මෙම නිර්භීත මිනිසුන් හා ගැහැණුන් බඳවාගැනීමේ ප්‍රතිපත්තිය බිහිවූයේ අති දක්ෂ ආරක්ෂකයින් සේවයේ යොදවා ගැනීමේ අභිලාෂයම හේතු පාදක කොට ගෙන මෙන්ම, ඔවුන්ගේ ස්වදේශානුරාගය, ධෛර්යය හා ජීවිත පරිත්‍යාගය වෙනුවෙන් ශ්‍රී ලාංකීය මහ ජනතාවගේ ණයගැති බවින් යටත් පිරිසෙයින් සුළුප්‍රමාණයක්වත් ආපසු ගෙවීමේ අරමුණ පෙරදැරි කර ගෙනය.

ආරම්භයේදී සේවාමුක්තයින් 77 දෙනෙකුගෙන් සමන්විත වූ ආයතනය දැන් සේවාමුක්ත පිරිමි හා ගැහැණු 3500 කට ගෞරවසම්පන්න රැකියා අවස්ථාවන් ලබා දෙන ආයතනයක් බවට පරිවර්තනය වී ඇත. රැකියා සම්පාදනයට අමතරව, සොල්දාදුවා සිවිල් සාමාජිකයෙකු බවට පත් කොට සමාජ ගත කිරීමටද සමාගමේ මෙම කාර්යභාරය ඉවහල් වී තිබේ·

සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා ආයතනය ප්‍රධානතම මෙහෙයුම් ක්ෂේත්‍රයන් හතරක නියැලී සිටී:


- ජාතික වැදගත් කමකින් යුත් ආයතනවලට හා ස්ථාපිතයන් ට ආරක්ෂාව සැපයීම;
- ශ්‍රී ලංකාව ආශ්‍රිතව ක්‍රියාත්මක වන නාවික සේවාවන්ට සමුද්‍රීය ආරක්ෂාව සැපයීම;
- සේවාමුක්ත පිරිමි හා ගැහැණු දෙපාර්ශවයට සහාය පිණිස විශේෂ ව්‍යාපෘති භාර ගෙන, ජාතියේ සංවර්ධනයට දායක වීම:
    - විශ්‍රාමික සන්නද්ධ සේවයේ හා පොලීසියේ නිලදැරුවන්ට විදේශීය රැකියා අවස්ථා සංවිධානය කිරීම
    - සංචාරක තොරතුරු මධ්‍යස්ථාන පිහිටුවීම - මෙම මෙහෙයුමෙන් ලැබෙන ආදායම " අපි වෙනුවෙන්
    - අපි" අරමුදලට බැර කෙරේ·
- පෞද්ගලික ආරක්ෂක සමාගම් සහ රජයේ ආරක්ෂක සේවයේ නියුක්තිකයින්හට ගිනිනිවීම, හදිසි අවස්ථා හා සමුද්‍රීය ආරක්ෂක කටයුතුවල පුහුණුව දොම්පේ පිහිටි ආයතනයේ අභ්‍යාස විද්‍යාලයේ දී ලබා දීමෙන් ශ්‍රී ලංකාවේ ආරක්ෂක සේවා ප්‍රමිතිය ඉහළ මට්ටමකට ගෙන ඒම·

## 24.2 2014 වසරේ ප්‍රගතිය

24.1 වගුව: මූල්‍යමය කාර්ය සාධනය 2008-

| වියදම | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|---|---|
| පුනරාවර්තන(රුපි.මිලි) | 111.60 | 251.90 | 447.60 | 537.20 | 830.60 | 1,651.80 | 1,677.60 |
| ප්‍රාග්ධන ( රුපි.මිලියන) | 1.40 | 3.00 | 2.30 | 8.50 | 23.10 | 75.00 | 8.80 |

**23.1 ප්‍රස්තාරය : 2008 - 2014 සමස්ත වියදම**



# 25
# අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

## 25.1 සමාලෝචනය

1984 අංක: 11 දරන ජාතික අන්තරායකාරී ඖෂධ පාලන මණ්ඩල පනත යටතේ ස්ථාපිත කරන ලද ජාතික අන්තරායකාරී ඖෂධ පාලන මණ්ඩලය , ඖෂධ අවභාවිතය වැළැක්වීම, පාලනය, ප්‍රතිකාර සහ පුනරුත්ථාපනයට අදාල ජාතික ප්‍රතිපත්ති සම්පාදන හා සමලෝචන වගකීම පැවරී ඇති ප්‍රධාතම ජාතික ආයතනයයි. ජාතික අන්තරායකාරී ඖෂධ පාලන මණ්ඩලය ජාතික හා අන්තර්ජාතික මට්ටමින් ඖෂධ භාවිතය වැළැක්වීමේ හා පාලනය කිරිමේ මෙහෙවරෙහි ලා පෘථුල ක්‍රියාදාමයක යෙදී සිටී.

ප්‍රතිකාරය හා පුනරුත්ථාපනය ජාතික අන්තරායකාරී ඖෂධ පාලන මණ්ඩලයෙන් සලසනු ලබන වැදගත් මෙහෙවරින් එකකි. අන්තරායකාරී ඖෂධ මත යැපෙන්නන් විශාල සංඛ්‍යාවක් හා ඔවුන්ගේ පවුල්, ආශ්‍රිත ගැටළුවලින් මුදා ගැනීම සඳහා ඔවුන්ගේ කුසලතා, ආකල්ප සහ හැකියාවන් දියුණු කිරීම, අධ්‍යාත්මික ගුණවගාවන් වැඩිදියුණු කිරීම වැනි පහසුකම් සැලසීමෙන් මණ්ඩලීය සේවාවන්ගේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට හා අගය එකතු කිරීමට කටයුතු සලසා ඇත.

වැළැක්වීමේ, ප්‍රතිකාර කිරීමේ හා පුනරුත්ථාපනය කිරීමේ මධ්‍යස්ථාන මහනුවර, ගාල්ල. නිට්ටඹුව හා තලංගම යන ස්ථානවල ස්ථාපිත කර ඇත.

මෙම මධ්‍යස්ථානවලින් සැලසෙන සේවාවන් වන්නේ :

- වයස අවුරුදු 21 ට අඩු පුද්ගලයින් - මහනුවර " යොවුන් "
- ඖෂධ මත යැපීම ( අවුරුදු 0 – 6) - ගාල්ල
- ඖෂධ මත යැපීම ( අවුරුදු 6-12) - තලංගම
- ඖෂධ මත යැපීම ( අවුරුදු 12 ට වැඩි) - නවදිගන්ත

## 25.2 2014 වසරේ මුදුන් පමුණුවා ගැනීම්

පොල් වගාව සහ ගෙවන වාට්ටු ඔස්සේ 2014 වසරේ දී උපයාගත් ආදායම රුපියල් මිලියන 3.5 කි .




2014 වසරේ පවත්වා ගෙන යන ලද ප්‍රධානතම වැඩ සටහන් වන්නේ:

- මානසික වෛද්‍යවරුන් විසින් ශාරීරික සෞඛ්‍යය ගැන දේශනා
- සෑම පෝයකම සිල් ව්‍යාපාර හා ධර්ම දේශණා
- කාර්ය මණ්ඩල පුහුණුව
- දෙමාපිය රැස්වීම් හා පසු විපරම්
- සංගීත වැඩ සටහන් හා පැදුරු පාටි
- එස්ටීඩී ,එච්අයිවී, සෞංගමාල වැඩ සටහන් හා ක්ෂය රෝග මර්දන වැඩ සටහන්
- ධාතු මන්දිර තැනීම හා විවෘත කිරීම, වෙසක් උත්සව හා භක්ති ගීත
- අළුත් අවුරුදු උත්සවය
- උපදේශක සුනිල් දිසානායක මහතා පවත්වන අබින වැඩ සටහන
- ඩෙංගු වැළැක්වීමේ වැඩ සටහන හා ශ්‍රමදාන
- ක්‍රීඩා ක්‍රියාකාරකම්
- වෘත්තීය පුහුණු
- අවිධිමත් අධ්‍යාපන වැඩ සටහන්
- එස් 5 වැඩ සටහන්
- වාර්ෂික කලා උත්සව
- නත්තල් දින වැඩ සටහන්
- ජාතික අන්තරායකාරී ඖෂධ පාලන මණ්ඩලයේ 30 වන සාංවත්සරිකය


**25.1 වගුව: 2014 වසරේ පැවැත්වූ වැඩසටහන්**

| ක්‍රියාකාරකම | වැඩ සටහන් සංඛ්‍යාව | සහභාගිත්වය |
|---|---|---|
| අධ්‍යාපන වැඩ සටහන් | 796 | 5206 |
| ඒකල උපදේශණය | 1815 | 2238 |
| කණ්ඩායම් උපදේශණ | 615 | 3432 |
| පවුල් උපදේශණ | 87 | 276 |
| විශෙෂ වැඩසටහන් | 285 | 1736 |
| කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් (බන්ධනාගාර) | 01 | 60 |
| පවුල් සමුවීම් | 07 | 350 |

2014 වසර තුළ පහත දැක්වෙන ප්‍රකාශණ එළිදක්වන ලදී.;









- "ශ්‍රී ලංකාවේ ඖෂධ අවභාවිතය මත පර්යේෂණ පත්‍රිකා සහ පර්යේෂණ උද්ධෘත එකතුව - 111 කොටස" ප්‍රකාශයට පත් කිරීම හා බෙදා හැරීම
- කුලියාපිටිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයෙහි ඖෂධ අවභාවිතය ගැන කඩිනම් සමීක්ෂණයක් පැවැත්වීම
- ජාතික අන්තරායකාරී ඖෂධ පාලන මණ්ඩලීය ප්‍රතිකාර මධ්‍යස්ථානවල ප්‍රතිකාරවල සක්‍රීයත්වය සම්බන්ධයෙන් අධ්‍යයනයක යෙදීම
- යාපනය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයෙහි අන්තරායකාරී ඖෂධ ව්‍යාප්තිය ගැන සමීක්ෂණයක්
- කුරුණෑගල දිස්ත්‍රික්කයෙහි පාසල් සිසුන් අතර අන්තරායකාරී ඖෂධ ව්‍යාප්තිය ගැන සමීක්ෂණයක්
- ලෝක සෞඛ්‍ය සංවිධාන ව්‍යාපෘතියේ මැදිහත්වීමෙන් පැවැත්වූ වැඩ සටහන - කොම්පඤ්ඤවීදියේ අන්තරායකාරී ඖෂධ භාවිත කරන්නන් එන්නත් කිරීම - ව්‍යාපෘති අංක. SESRL 1206186·
- අන්තරායකාරී ඖෂධ භාවිත කරන්නියන් සඳහා ප්‍රජා මූල ප්‍රතිකාර මධ්‍යස්ථානය. ලෝක සෞඛ්‍ය සංවිධාන ව්‍යාපෘති අංක: SESRL 1206186·
- ජාතික අන්තරායකාරී ඖෂධ පාලන මණ්ඩලය විසින්, ප්‍රවාහන අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව, ලංගම බස් රථ12 ක සහ දුම්රිය මැදිරි 6 ක අන්තරායකාරී ඖෂධ භාවිතය වැළැක්වීමේ පණිවුඩ ප්‍රදර්ශණය කිරීම·









## 25.3 ගැටළු හා අභියෝග

- ජාතික අන්තරායකාරී ඖෂධ පාලන මණ්ඩලයේ පර්යේෂණ අංශයෙහි පර්යේෂණ කාර්ය මණ්ඩල හිගය නිසා ජාතික සමීක්ෂණයක් කිරීම අපහසු ය. පර්යේෂණ අංශයෙහි සේවක සංඛ්‍යාව කඩිනමින් පුළුල් කළ යුතුව ඇත.
- පර්යේෂණ ක්‍රමවේද/ ප්‍රභේද පරීක්ෂා කිරීමේ කුසලතාවලට අදාල නවතම තාක්ෂණ හිගය.ජාතික හා ජාත්‍යන්තර පර්යේෂණ ක්‍රමවේද ගැන පුහුණු කිරීමේ අවශ්‍යතාවය පවතී. ඖෂධ අවභාවිතය මත ජාතික මට්ටමේ සමීක්ෂණයක් පැවැත්වීමට ඇති මුල්‍යමය ගැටළු. සමීක්ෂණ පැවැත්වීම සඳහා මුල්‍යමය හා තාක්ෂණිකමය සහාය අවශ්‍යය.
- ඖෂධ අවභාවිතය ( නීති විරෝධී) ගැන ජාතික මට්ටමින් සමීක්ෂණයක් අදාල ආයතනවල සහයෝගයෙන් 2016 දී පැවැත්වීම
- පර්යේෂණ අංශයෙහි සේවක සංඛ්‍යාව පුළුල් කිරීම
- ඖෂධ අවභාවිත පාලන ක්‍රමවේද දත්තයන් නව මෘදුකාංග මත වර්ධනය කිරීම සහ වෙබ් අඩවි සැලසුම්කරණය

## 25.4 අනාගත අපේක්ෂාවන්

- 2016 මත අදාළ ආයතන වල ද සහාය ඇතිව මත්ද්‍රව්‍ය (නීති විරෝධී) මත ජාතික සමීක්ෂණයක් පැවැත්වීමට අදහස් කරමි.
- සේවක සංඛ්‍යා පර්යේෂණ අංශය පුළුල් නව මෘදුකාංග සඳහා මත්ද්‍රව්‍ය
- අධීක්ෂණ පද්ධතිය දත්ත පදනම සංවර්ධනය සහ පේලි ක්‍රමය වෙබ් නිර්මාණය පිළිබඳ සංවර්ධනය කිරීම.

# 26
# නාගරික සංවර්ධන අධිකාරිය

## 26.1 සමාලෝචනය

අධිකාරියේ ප්‍රධානතම කාර්ය භාරයන් වන්නේ:
ශ්‍රී ලංකාවේ භෞතිකමය සංවර්ධන ක්‍රමවේදයන්ට අනුකූලව ඒකාබද්ධ සැලසුම් සම්පාදනය කිරීම.

ඉඩම් පරිශීලනය ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒමෙන්, නාගරික සංවර්ධනය සඳහා වැඩි වැඩියෙන් ඉඩම් වෙන්කර ගැනීමෙන් හා නාගරික ප්‍රදේශවල ඌණභාවිතයෙන් යුත් ඉඩම්වල, ආරාවුල් සමථයට පත්කිරීමෙන් නාගරික සංවර්ධන අධිකාරි නීතිය යටතේ ප්‍රකාශිත ඉඩම් යළි පුනරුත්ථාපනය කිරීම.

නාගරික ප්‍රදේශවල ආයෝජනය කිරීමේ අවස්ථා සලසමින් දේශීය හා විදේශීය ආයෝජකයින්ට පහසුකම් සැලසීම.

නාගරික සංවර්ධන අධිකාරියේ මූල්‍යමය ශක්තිය වැඩි දියුණු කිරීම සඳහා යෝග්‍ය පියවර ගැනීම.

නාගරික සංවර්ධන අධිකාරි පණතේ නීති හා රෙගුලාසි නියමානුකූලව බලාත්මක කිරීමෙන් අධිකාරියේ කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම.

## 26.2 2014 වසරේ මුදුන් පමුණුවා ගැනීම්

- ආර්ථික මධ්‍යස්ථානයක් හා ආකර්ෂණීය සංචාරක මධ්‍යස්ථානයක් ලෙස කොළඹ පුරවරය සංවර්ධනය කිරීම
- ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටෙ පරිපාලන අගනුවර ලෙස සංවර්ධනය කිරීම
- නාගරික පුනරුත්ථාපන ව්‍යාපෘතියේ 2 වන අදියර ක්‍රියාත්මක කරමින් අඩු ආදායම්ලාභී ජනතාවට නිවාස තනාදීමේ වැඩ පිළිවෙළ ව්‍යාප්ත කිරීම
- හරිත උද්‍යාන, මහමළු ඇති කිරීමෙන් හා පොදු පහසුකම් ව්‍යාප්ත කිරීමෙන් නගරලාංකාරය වර්ධනය කිරීම
- කුඩා හා මධ්‍යම පරිමාණයේ නගර නිර්මාණය
- “ පුරනැගුම ව්‍යාපෘතිය යටතේ හඳුනාගන්නා ලද නගර සංවර්ධනය සඳහා වාස්තු විද්‍යාත්මක උපදේශණ සේවා සහ සැලසුම් සම්පාදනය
- පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ගොඩනැගිලි ප්‍රකෘතිමත් කර ආකර්ෂණීය අන්දමින් පවත්වා ගෙන යමින් සංරක්ෂණය කිරීම
- පොදු ජනතාවට ජීවත්විය හැකි හා ආර්ථිකමය උද්දීපනයකින් යුත් නාගරික ප්‍රදේශ නිර්මාණය කිරීම
- පොදු ජනතාවට ප්‍රතිලාභ අත්වීමට යෝග්‍ය කලාප වෙන් කිරීමේ සැලසුම් සම්පාදනය
- කුඩා හා මධ්‍ය පරිමාණ නගර සංවර්ධන
- ඇති "Puranaguma ව්‍යාපෘතිය" යටතේ හඳුනා ගත් වාස්තු විද්‍යාත්මක සේවා, නගරය, පළාත, සංවර්ධනය සඳහා සැලසුම් සැපයීම
- පොදු ස්ථානයක ආකර්ෂණය ලෙස එම ස්ථාන ප්‍රතිසංස්කරණය විසින් බැමකට වැදගත් ගොඩනැගිලි සංරක්ෂණය කිරීම හා පවත්වාගෙන යාම
- සාමාන්‍ය ජනතාව සඳහා ගිය හැකි හා ආර්ථිකමය වශයෙන් උද්දීපනය නිර්මාණය නාගරික ප්‍රදේශ
- පොදු ජනතාවට ප්‍රතිලාභ ඉටු කිරීමට සුදුසු සියයකින් සකස් කිරීම

**26.2 වගුව : ව්‍යාපෘතිවල මූල්‍යමය තොරතුරු**

| ක්‍රියාකාරකම | තක්සේරුගත වියදම (රු. මිලි.) | මූල්‍ය ප්‍රගතිය (රු. මිලි.) |
|---|---|---|
| නගර පුනරුත්ථාපන ව්‍යාපෘතිය- පියවර I යටතේ නිවාස ඒකක 9064 ක් ඉදිකිරීම | 31270.8 | 14,323 |
| නගර පුනරුත්ථාපන ව්‍යාපෘතිය- පියවර II යටතේ නිවාස ඒකක 8807 ක් ඉදිකිරීම | 30384.15 | 1,787 |
| නගර අලංකරණ වැඩ සටහන | 1006.7 | 334.6 |
| ලැයිස්තුගත පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ගොඩනැගිලි/දේපළ ප්‍රතිසංස්කරණය, සංරක්ෂණය හා සංවර්ධනය | 3643 | 1,042.7 |
| කුඩා හා මධ්‍යම පරිමාණයේ නගර සංවර්ධන ව්‍යාපෘති | - | - |
| පුරනැගුම ව්‍යාපෘතිය යටතේ උපදේශන සේවා | 6700 (සියයට 6 ක් නාගරික සං.අධිකාරියට ගෙවීමට එකඟ වී ඇත) | 20.38 |
| නාගරික යටිතල පහසුකම් හා නාගරික ආයෝජන ව්‍යාපෘති සංවර්ධනය | 5101.23 | 1,256. |

### නාගරික ප්‍රතිසංස්කරණය ව්‍යාපෘති I











දෙමටගොඩ නිවාස ව්‍යාපෘතියේ නිවාස ඒකක ප්‍රතිලාභීන්ට පවරාදීමට කටයුතු කරන ලද අතර, මයුරා පෙදෙස සහ 31 වත්ත නිවාස ව්‍යාපෘති නිම කරන ලදී. යෝජිත නිවාස ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතු කෙරී ගෙන යයි. ඒ අනුව, සාලමුල්ල අදියර 1 හා 2 ව්‍යාපෘතිවල සියයට 33 ක්ද, 54/56 වත්ත නිවාස ව්‍යාපෘතියේ සියයට 98.9ක්ද, හේනමුල්ල නිවාස ව්‍යාපෘතියේ සියයට 87 ක්ද, මාලිගාවත්ත නිවාස ව්‍යාපෘතියේ සියයට 19 ක්ද, අලුත්මාවත නිවාස ව්‍යාපෘතියේ සියයට 8.6 ක්ද, කොළොන්නාව නිවාස ව්‍යාපෘතියේ සියයට 16 ක්ද, සිරිල් සී පෙරේරා මාවත නිවාස ව්‍යාපෘතියේ සියයට 97 ක්ද, පර්ගියුසන් පාර නිවාස ව්‍යාපෘතියේ සියයට 60 ක්ද, එදිරිසිංහවත්ත නිවාස ව්‍යාපෘතියේ සියයට 71 ක්ද, තාච්චිවත්ත නිවාස ව්‍යාපෘතියේ සියයට 66 ක්ද, අංගොඩ නිවාස ව්‍යාපෘතියේ සියයට 60 ක්ද, ප්‍රදීප මාවත නිවාස ව්‍යාපෘතියේ සියයට 29 ක්ද නිම කර ඇත.





### නාගරික ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති II

හේනමුල්ල ගොවිජනසේවා පෙදෙස, අලුත්මාවත, මට්ටක්කුලිය, ටොරිංටන් මාවත,කාලිංග මාවත - අදියර 2, ආරාමය පෙදෙස, සිරිල් සී පෙරේරා මාවත -අදියර 2, මාදම්පිටිය පාර, කිඹුලා ඇල, ඇපල් වත්ත සහ ඌරුගොඩවත්ත නිවාස ව්‍යාපෘතිවල මූලික වැඩ කටයුතු ආරම්භ කර ඇත.

### නගර අලංකරණය



යාපනයේ වෙරළ උද්‍යාන ව්‍යාපෘතියේ 1 වන අදියර සියයට 98 ක් සහ 2 වන අදියර සියයට 33 ක් නිම කර ඇත. අම්පාර වැව වටා යෝජිත ඇවිදින මංතීරු තැනීම

කටයුතු සියයට 60ක් නිම කර ඇත. මඩකලපුවේ සත්රුකොන්ඩාන් තෙත්භූමි උද්‍යානයේ සංවර්ධන වැඩ අරඹා ඇත. ක්‍රියාත්මක කරන ලද නගර අලංකාරකරණ ව්‍යාපෘති යටතේ, හෙට්ටිපොල නගරයේ සියයට 62 ක්ද, කුරුණෑගල වැව ආශ්‍රිත භූ දර්ශණ ව්‍යාපෘතියේ සියයට 20 ක්ද, පිටකොටුවේ, බැස්තියන් මාවතේ පාවෙන වෙළඳපොල ව්‍යාපෘතියේ සියයට 80 ක්ද, බත්තරමුල්ල, සෙත්සිරිපාය ප්‍රභූ පිවිසුමෙහි භූ දර්ශණ වැඩවලින් සියයට 90 ක්ද, නිම කර ඇත. එසේම, මොරටුව වෙරළ උද්‍යාන ව්‍යාපෘතියේ සියයට 35 ක්ද, ගන්නොරුව භූ දර්ශණ ව්‍යාපෘතියේ අදියර 1 කේ සියයට 98 ක්ද, අදියර 2 කේ සියයට 50 ක්ද, සෙල්ලකතරගම විවෘත උද්‍යාන ව්‍යාපෘතියේ සියයට 10 ක්ද, මිණුවන්ගොඩ නගර අලංකාරකරණ ව්‍යාපෘතියේ සියයට 75 ක් ද නිම කර ඇත.

- **ඓතිහාසික ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය**



නාගරික සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලබන ඓතිහාසික ගොඩනැගිලි ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය යටතේ, ප්‍රධාන නගරවල පිහිටා ඇති ඓතිහාසික ගොඩනැගිලි කිහිපයක් හඳුනා ගෙන ඇත. ඒ අනුව, පැරණි විගණකාධිපති ගොඩනැගිල්ල ප්‍රකෘතිමත් කර, 2014 ජූලි මාසයේ දී මහජනයා වෙත විවෘත කරන ලද අතර, පිටකොටුවේ රත්රන් මධ්‍යස්ථානය, කොළඹ 7, තුරග තරග පිටියේ, ග්‍රෑන්ඩ් ස්ටෑන්ඩ් ගොඩනැගිල්ල, මරදානේ ට්‍රිපොලි වෙළඳපොළ සහ කොටුවේ ගපූර් ගොඩනැගිල්ල යන ස්ථාන ප්‍රකෘතිමත් කිරීමේ කටයුතු කඩිනම් කෙරිනි. එසේම, මහනුවර ඇහැලේපොල වලව්වේ ප්‍රතිසංස්කරණ කටයුතු සියයට 1 කින්ද, හඟුරන්කෙත විෂ්ණු කෝවිලේ ප්‍රතිසංස්කරණ කටයුතු සියයට 20 කින්ද නිම කර ඇත·

- **කුඩා හා මධ්‍යම පරිමාණයේ නගර සංවර්ධන ව්‍යාපෘති**



කුඩා හා මධ්‍යම පරිමාණයේ නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති අනෙකුත් නාගරික සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාදාමය හා සමග ඒකාබද්ධ කර ඇත. මේවා අදාල නාගරික පළාත් ආයතන මගින් ක්‍රියාත්මක කෙරේ.·

- **පුර නැගුම ව්‍යාපෘතිය**



නාගරික සංවර්ධන අධිකාරිය විසින් පුර නැගුම සංවර්ධන ව්‍යාපෘතිය යටතේ වාස්තු විද්‍යා උපදේශන සේවා සපයන අතර, සියයට 3 උපදේශණ සේවා ගාස්තුවලින් කොටසක් ලෙස රුපියල් මිලියන 20·38 ක් ලැබී ඇත.

- **නාගරික ආයෝජන ව්‍යාපෘති**

නාගරික යටිතල අධිශ්‍රේණිගත කිරීමේ හා ආයෝජන වැඩ සටහන් යටතේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය පහත දැක්වෙයි.

යාපනය තානායමේ ඉදිකිරීම් කටයුතු - සියයට 03 ක්, පල්ලිමුණේ ක්‍රීඩාභූමිය - සියයට10 ක් හා වවුනියාව රථගාල - සියයට 5 ක්.

මහනුවර - මාතලේ දුම්රිය මාර්ගයට සමගාමීව ජනතා සක්මන් මාර්ගය සියයට 50 ක්ද, පුස්සැල්ලාව සාප්පු සංකීර්ණය සියයට 30 ක්ද, පුස්සැල්ලාව බස් නැවතුම්පළ



සියයට 2 ක්ද, දඹුල්ල ශුද්ධ භූමි ප්‍රදේශ සංවර්ධන ව්‍යාපෘතියේ සියයට 40 ක්ද, එළිසබෙත් රාජිණී සාප්පු සංකීර්ණය සියයට 15 ක්ද වැඩ නිම කර ඇත.





අනුරාධපුර නගර සංවර්ධන වැඩ සටහන යටතේ රුවන්වැලි සෑය වටාපිටාව සංවර්ධනය, කටුකැලියාව නිවාස ව්‍යාපෘතිය, අධිකාරියේ උතුරු මැද පළාත් කාර්යාලය ඉදි කිරීම සහ මිහින්තලේ ශුද්ධ නගර ප්‍රදේශ සංවර්ධනය සහ අනුරාධපුර නගර සංවර්ධන වැඩ සටහන -1 වන අදියරේ වැඩ සියයට 10 ක් සම්පූර්ණ කර ඇත.



ඇඹිලිපිටිය පොළ ඉදි කිරීම් කටයුතු සියයට 90 ක්, ඇහැලියගොඩ මහජන චතුරශ්‍ර



ඉදිකිරීම් කටයුතු සියයට 75 ක් සහ ඇහැලියගොඩ පොළ සියයට 3 ක්ද සම්පූර්ණ කර

ඇති අතර, කුඩා හා මධ්‍යම පරිමාණයේ නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ හඳුනාගන්නා ලද රඹුක්කන දුම්රිය ස්ථානය හා අතුරු මාර්ග සංවර්ධනයේ සියයට 90 ක් නිම කර ඇත. කෑගල්ලේ ඩෝසන් බංගලාවේ අළුත්වැඩියාවන් නිම කර ඇත.





බදුල්ල සාප්පු සංකීර්ණයේ 1 වන අදියරේ තැනීම් කටයුතු, අපද්‍රව්‍ය බැහැර කිරීමේ කටයුතු, කිරිවෙහෙර සංවර්ධන ව්‍යාපෘතිය සහ සෙල්ල කතරගම වන්දනාකරුවන්ගේ පහසුකම් මධ්‍යස්ථානය නිම කර ඇත. එසේම, බණ්ඩාරවෙල බස්නැවතුම්පළෙහි වැඩ සියයට 95 ක්, සෙල්ල කතරගම රථගාලේ සියයට 80 ක් සහ මීගහකිවුල නගර සංවර්ධනයේ සියයට 40 ක් නිම කර ඇති අතර, බදුල්ල සේනානායක මාවතේ රථගාලේ සංවර්ධන වැඩ කටයුතු ආරම්භ කර ඇත.











ගාල්ලේ, ඉමදූව නගර සංවර්ධනය ඉටු කෙරෙමින් පවතින අතර, හබරාදූව නගර සංවර්ධන ව්‍යාපෘතියේ වැඩ කටයුතු ආරම්භ කෙරිණ. අකුරැස්ස නගරය පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ 1 වන අදියරේ වැඩ සියයට 30 කින්ද, ඌරුබොක්ක ක්‍රීඩාභූමියේ සහ ළමා උයනේ වැඩ සියයට 30 කින්ද, කොටුවේගොඩ පොදු වෙළඳපොළ ව්‍යාපෘතියෙහි වැඩ සියයට 100 කින්ද, මාතර රාහුල විද්‍යාලයේ ප්‍රධාන ශාලාවේ ඉදිකිරීම් වැඩ සියයට 7 කින් ද නිම කර ඇති අතර, සංවර්ධන කටයුතු අඛණ්ඩව කෙරී ගෙන යයි. හම්බන්තොට දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති යටතේ, වීරකැටිය ජෝර්ජ් රාජපක්ෂ ක්‍රීඩා භූමියේ වැඩ සියයට 70 ක් නිම කර ඇත.

අගුණකොළපැලැස්ස සාප්පු සංකීර්ණයෙහි සහ තංගල්ල ජයසිංහවත්ත සාප්පු සංකීර්ණයෙහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත. බස්නාහිර පළාත් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ දෙල්කඳ හා පාදුක්ක පොළ තැනීම් කටයුතු නිම කර ඇත. හෝමාගම පළතුරුවත්ත ව්‍යාපෘතිය, නෙළුම් කුළුණ ව්‍යාපෘතිය, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත සංවර්ධනය, කොළඹ,





පිළියන්දල හා පානදුර නගර මධ්‍යස්ථාන සංවර්ධනය සහ කෝට්ටෙ ගිනි නිවන හමුදා නිලධාරි නිවස්නයේ වැඩ කටයුතු කෙරෙමින් පවතී. එසේම, ගම්පහ අතිරේක බස් ගාලේ සහ පොදු රථ ගාලේ වැඩද ක්‍රියාත්මක වෙමින් පවතී.

## 26.3 අනාගත අපේක්ෂා

- නාගරික සංවර්ධන අධිකාරි ප්‍රකාශිත බල ප්‍රදේශ ක්‍රමානුකූල නගර සැලැසුම් අනුව සංවර්ධනය
- 2013 සිට 2014 කාල වකවානුව තුළ ව්‍යාපෘති ඉලක්ක සපුරා ගැනීම
- දේශිය/විදේශිය සංචාරකයින් ආකර්ෂණය කර ගන්නා ආර්ථික මධ්‍යස්ථානයක් ලෙස කොළඹ පුරවරය අධිශ්‍රෙණිගත තත්ත්වයට පත් කිරීම
- නාගරික ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය යටතේ, අඩු ආදායම් පවුල් 65,000 ක් සඳහා නිවාස තැනීමේ ඉලක්කය සපුරා ගැනීම සඳහා කටයුතු කිරීම සහ නියමානුකූල ආයෝජනයන් සඳහා නාගරික ඉඩම් වැඩිදියුණු කිරීම
- සියලු රජයේ ආයතන පුළුල් කිරීමෙන් හා ස්ථාපිත කිරීමෙන් ශ්‍රී ජයවර්ධන පුර කොට්ටෙ නගරය පරිපාලන අගනුවර ලෙස සංවර්ධනය කිරීම
- සමස්ත දිවයිනම ආවරණය වන පරිදි සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- පහත දක්වා ඇති නැගෙනහිර පළාතේ සංවර්ධන ව්‍යාපෘති 2015 වසරේදී ක්‍රියාත්මක කිරීමට යෝජිතය. නගර සංවර්ධන අධිකාරියේ නැගෙණහිර පළාත් කාර්යාල ගොඩනැගිල්ල සහ ත්‍රිකුණාමලයේ සංචාරක බංගලාව, හෝටල සංවර්ධන ව්‍යාපෘතිය, මරතඩි මංසන්ධියේ වාණිජ සංවර්ධන ව්‍යාපෘතිය, ත්‍රිකුණාමලයේ මට්ටිකලි වෙරළ උද්‍යාන සංවර්ධනය, කතන්කුඩි වෙරළ උද්‍යානය,කල්ලාඩි

පාලම් උද්‍යානයේ භූ දර්ශණ කටයුතු, නොච්චිමුණේ සංචාරක ප්‍රවර්ධන වැඩ සටහන, මඩකලපුවේ පරිපාලන සංකීර්ණය, අම්පාරේ පොදු වෙළඳපොල සහ නාගරික සංවර්ධන අධිකාරි දිස්ත්‍රික් කාර්යාලය, මන්මුණේ සංවර්ධන ව්‍යාපෘතිය සහ ආරුගම්බේ පරිසර ප්‍රවර්ධනය.

- මධ්‍යම පළාත - ග්‍රෙගරි වැව සංවර්ධනය, කොටගල තෙත්බිම් උද්‍යානය, නල්ලතන්නියේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ තලවකැලේ භූ දර්ශණ ව්‍යාපෘතියේ අදියර II යන ව්‍යාපෘති නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ 2015 දී ක්‍රියාත්මක කිරීමට නියමිත ය. ඇහැලේපොළ වලව්ව සංරක්ෂණය, බෝගම්බර බන්ධනාගාර පරිශ්‍රය සංස්කෘතික හා සංචාරක මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය, අතිරේක බස්රථගාල නගරයෙන් පිටත ස්ථාපනය කිරීම, මහවැලි ගංගා ඉවුරු භූ දර්ශණ කටයුතු, ආරෝග්‍ය ශාලාව සඳහා පොදු රථගාලක් තැනීම, පොලිස් නිවාස ප්‍රති-ස්ථාපනය, පොදු උද්‍යාන හා මගී සක්මන් මළු, පේරාදෙණිය පොළ හා බස් නැවතුම්පොළ තැනීම, යන ව්‍යාපෘති 2015 වසරේ මහනුවර දිස්ත්‍රික්කයේ සංවර්ධන වැඩ සටහන යටතේ ලා ගැණේ.
- උතුරු පළාත - බහු මහල් රථ ගාල, යාපනය නගරයේ බස් නැතුම්පළ, කාර්යාල සංකීර්ණය සහ නිවාඩු නිකේතනය සංවර්ධනය, වවුනියා බස් නැවතුම්පළ සහ චාවාකච්චේරි, වැල්වැටිතුරේ සහ පුදුකුඩිරිප්පු යන නගරවල සති පොළ ඉදි කිරීම යෝජිතය.
- උතුරු මැද පළාත - අනුරාධපුර නගර මධ්‍යස්ථාන ව්‍යාපෘති, නොච්චියාගම, මිහින්තලේ, තඹුත්තේගම, තිරිප්පනේ, කැකිරාව, තලාව සහ එප්පාවල නගර සංවර්ධන ව්‍යාපෘතිද 2015 වසරේදී ක්‍රියාත්මක කිරීමට නියමිතය.
- සබරගමුව පළාත - කෑගල්ල දිස්ත්‍රික්කය යටතේ ගැණෙන කෑගල්ල, රඹුක්කන, මාවනැල්ල,යටියන්තොට නගරවල සංවර්ධන ව්‍යාපෘති සඳහා රැපියල් මිලියන 1892 ක් ආයෝජනය කිරීමට යෝජිතය. රත්නපුර දිස්ත්‍රික්කය යටතේ යෝජිත ව්‍යාපෘති වලට පැල්මඩුල්ල බස් නැවතුම ඉදි කිරීම, ඇහැලියගොඩ රථගාල, නිවිතිගල මැණික් වෙළඳපොල ගොඩනැගිල්ල සහ බස්නැවතුම්පළ, ගොඩකවෙල බස්නැවතුම්පළ, කහවත්ත ජාතික ක්‍රීඩා සංකීර්ණ සංවර්ධනය, බලංගොඩ වාණිජ සංකීර්ණය සහ නාගහමුද්දුව කුඹුරු යාය මහජන උද්‍යානයක් හා රථ ගාලක් ලෙස සංවර්ධනය අයත්ය.
- ඌව පළාත - කතරගම නගර සංවර්ධනය, සෙල්ල කතරගම විවෘත උද්‍යානය, බදුල්ල සාප්පු සංකීර්ණය සහ බිබිල, වැල්ලවාය, බුත්තල, මොණරාගල, දියතලාව, හපුතලේ, බණ්ඩාරවෙල, වැලිමඩ, කැප්පෙටිපොළ, ඇල්ල සහ මහියංගනය යන නගර වල විශේෂ ව්‍යාපෘති හඳුනාගැනීම.
- වයඹ පළාත - කුරුණෑගල නගර මධ්‍යස්ථාන සංවර්ධන වැඩ සටහනේ I හා II අදියර යටතේ හඳුණාගත් සංවර්ධන ව්යාපෘති සඳහා රුපියල් මිලියන 9700 ක් ආයෝජනය කිරීමට. සත්‍යවාදී ඉඩමේ වාණිජ හා නේවාසික ව්‍යාපෘතිය ඉදිකිරීම, කුරුණෑගල පිටත වටරවුම් මාර්ගය ඉදිකිරීම, අධිකාරිය සතු ආනමඩුව, තෙන්නන්කුරියාව ඉඩම යටිතල පහසුකම්වලින් සංවර්ධනය, බැංකු හා මූල්‍ය ආයතන ස්ථාපිත කිරීම සඳහා ඉඩම් සංවර්ධනය, යෝජිත සංවර්ධන ව්‍යාපෘති සඳහා කුරුණෑගල නගරයේ පටදියවල ඉඩම් අත්පත් කර ගැනීම, පුත්තලමේ වෙරළ උද්‍යාන සංවර්ධන ව්‍යාපෘතිය සහ ආනමඩුව, මහව, හලාවත, මැල්සිරිපුර, හෙට්ටිපොල, කුලියාපිටිය, ගිරිඋල්ල යන නගරවල නගර සංවර්ධන ව්‍යාපෘති 2015 වසරේදී නිම කිරීමට යෝජිතය.
- දකුණු පළාත - කොටුවේගොඩ වෙළඳපොළ ගොඩනැගිලි හා සතිපොළ, වැලිගම වෙරළ උද්‍යානය, අකුරැස්ස නගර සංවර්ධනය, මාතර නිල්වලා නදිය ආශ්‍රිත හරිත උද්‍යාන සහ මාතර රාහුල විද්‍යාලයේ ප්‍රධාන ශාලාව ඉදිකිරීම 2015 වසරේදී නිම කිරීමට නියමිතය. මීද්දෙණිය ක්‍රීඩා භූමිය, මහවැව හා කටුවන පොළ සංවර්ධනය, රජයේ නිවාස ප්‍රති-ස්ථාපනය, පොලිස් ස්ථනය හා බස් නැවතුම්පළ සංවර්ධනය, අගුණකොළපැලැස්සේ

මහජන වැසිකිලි පද්ධතිය ඉදි කිරීම, තංගල්ල බස්නැවතුම්පළ සංවර්ධනය, පරෙයිවෙල වෙරළ උද්‍යාන ව්‍යාපෘතිය, වලස්මුල්ල වෙළඳ සංකීර්ණය හා බස් නැවතුම්පළ, අම්බලන්තොට නගර සංවර්ධනය, වෙරළ උද්‍යානය හා පරිසර හිතකාමී කෘෂි සංවර්ධන ව්‍යාපෘතිය, බෙලිඅත්ත පොළ සංවර්ධනය, කිරින්ද වෙරළ උද්‍යාන සංවර්ධනය, දෙබරවැව සාප්පු සංකීර්ණ සංවර්ධනය, සූරියවැව පොලිස් නිවාස, පොලිස් ස්ථානය හා පරිපාලන සංකීර්ණ ව්‍යාපෘතිය, කරාපිටිය මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය, පොදු රථගාල සහ මාර්ග අලංකාරකරණ ව්‍යාපෘතිය, දඩල්ල ක්‍රීඩාභූමි සංවර්ධනය යන ව්‍යාපෘති ගාලු නගර සභා සීමාවන් ඇතුළත නිම කිරීමට යෝජිතය. එසේම, අම්බලන්ගොඩ නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කාර්යාල සංකීර්ණ 2 වන අදියර, ඉමදූව පොළ හා විකල්ප මාර්ගය, හික්කඩුව, හබරාදූව, බෝපේ, පෝද්දල, බණ්ඩාරගම හා අක්මීමන නගර සංවර්ධනය 2015 වසරේදී ක්‍රියාත්මක කිරීමට යෝජිතය.